# <u>2026 ජූලි මස 07 වන දින පෙරවරු 9.30 ට</u>
# <u>මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද</u>
# <u>මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව</u>

**<u>සහභාගීත්වය:-</u>**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 51. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.07.07 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.

2026.06.02 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2026.06.02 දිනැති මාසික සභා රැස්වීමේ වාර්තාව පිලිගත යුතුයැයි යෝජනා කර සිටිමි.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.06.02 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන:-

**02(1) ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, අවුරුද්දක පමණ කාලයක් අපේ සභාවට තිබුණ එක හිඩසක් අද දින සම්පූර්ණ වෙනවා. ඒ පිළිබඳව විශේෂ දැනුම්දීමක් කරන්න කැමතියි. 2026.07.03 දිනැති අංක 2495/56 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මහවත්තගේ ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා මොරටුව මහා නගර සභාවේ සභිකයෙකු ලෙස පත්කර ඇති බව දන්වා සිටිනවා.

**02(2) ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්වයක් හේතුවෙන් 2026.06.09 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා 2026.06.09 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014.11.20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගී නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(3)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මොරටුව දිසා අධිකරණයේ නඩුවක් සඳහා සහභාගී වන බැවින් 2026.06.10 දින පැවති වලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා 2026.06.19 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014.11.20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගී නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(4)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026.07.07 මහා සභා රැස්වීමට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එච්. එල්. ටී. නෙත්සරණී මෙනවිය 2026.07.06 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති බව දන්වා සිටිනවා.

**02(5)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඩෙංගු මර්දන සම්බන්ධීකරණ කාර්යාලයක් හෙට දින ආරම්භ කරනවා ද්‍රව්‍ය ප්‍රතිශෝධන මධ්‍යස්ථානයේ. ඒ පිළිබඳව දැනුවත් කරනවා.

**02(6)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අපට විශාල සේවයක් ලබා දීපු අපේ ගණකාධිකාරී තුමිය අද දින අවසන් වතාවට මේ සභාවට සම්බන්ධ වෙනවා. එතුමිය මේ සභාවෙන් නික්ම යාමට නියමිතයි. එතුමිය වෙනුවෙන් අපි අද දහවල් 2.00ට උත්සවයක් සූදානම් කරලා තියෙනවා. ඒ සඳහා ඔබ සියළුදෙනාගේ සහයෝගය බලපොරොත්තු වෙන ගමන් ඒ පිළිබඳව දැනුවත් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අපේ මොරටුව මහා නගර සභාවේ සභිකයෙකු ලෙස පත්කර අද දින සභාවට පැමිණි මහා නගර සභා මන්ත්‍රී එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතාට එතුමාගේ මංගල කතාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, නියෝජ්‍ය නගරාධිපතිතුමියනී, විපක්ෂ නායකතුමා ඇතුළු සියළු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන්ද, කොමසාරිස්තුමිය, නියෝජ්‍ය කොමසාරිස්තුමා සහ සියළු නිලධාරි මහත්ම මහත්මීන්ගෙන්ද සියළු සේවක මහත්වරුන්ගෙන්ද අවසරයි. ඇත්තෙන්ම දැනට වසරකට පෙර ලැබෙන්න තිබුණ අවස්ථාවක් තමයි පොඩ්ඩක් ගිලිහි ගිහිල්ලා අද මෙම ස්ථානයට මා හට එන්නට ලැබුනේ. එනමුත් මම හිතනවා අද රටේ පවතින වාතාවරණයත් සමඟ හොඳම අවස්ථාවක් තමයි මා හට මේ අවස්ථාව ලැබුනේ කියලා. එම නිසා මා මොන දේ උනත් මා නියෝජනය කරන පක්ෂයේ ජාතික සංවිධායක එදා ඉදලම මට පිටින් කාටවත්ම දෙන්නේ නැහැ කියලා ඒ වචනය ඒ ආකාරයෙන්ම ඉෂ්ඨ කරපු ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාට මාගේ හෘදයාංගම ස්තූතිය මා පිරිනැමීමට කැමති. ඒ වගේම ඒ මතයෙම හිටපු කෙනෙක් තමයි අපේ පක්ෂයේ ගරු ලේකම් සාගර කාරියවසම් මහතා. එතුමා හැමකෙනාටම කියන්නේ ප්‍රියනාත් තමයි මෙතනට සුදුසු ඔහුට තමයි වැඩිම ප්‍රතිශතය තියෙන්නේ කියලා එදා ඉඳලා මේ දක්වා කියලා. හැම අවස්ථාවෙම ධෛර්යමත් කරපු කෙනෙක් තමයි එතුමා. එතුමාටත් ස්තූතිය පුදකරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම මෙම ප්‍රශ්නය නිවැරදිව තේරුම් අරගෙන අන්තිම වකවානුවේ හෝ නිවැරදි තීන්දුව ගත්තු අපගේ මොරටුව සංවිධායක නිතිඥා මනෝජ් ගමගේ මැතිතුමාටත් මම මේ අවස්ථාවේදී ස්තූතිය පුද කරනවා. ඉන් පසුව මා සමඟ හිටපු මේ නම් ටික මම

මතක් කරන්නම ඕන මොකද හෙවනැල්ලක් වගේ මාත් එක්ක හිටපු කිහිප දෙනෙක් ඉන්නවා. ඒ තමයි අජිත් චන්ද්‍රසෝම මහතා, සුදත් ජීවන් අපේ අපේක්ෂකතුමා ඒ වගේම ප්‍රිමාල් සහ නිලන්ත යන දෙදනාව මතක් කරනවා. ඒ වගේම තමයි මම පැරදුනාට පසුව මගේ කිසිම අදහසක් තිබුණේ නැහැ නැවත දේශපාලනය කරන්න. මම හිටියේ දේශපාලනයෙන් සමු අරගෙන ගෙදරට වෙලා. ඇත්තටම මාගේ ප්‍රදේශයේ මා සමඟ මගේ මැතිවරණයෙදීත් වැඩ කරන්න හිටියේ දෙන්නයි. අන්තිමේදී ඒ දෙන්නත් විරුද්ධ වෙලා යනකොට මගේ නෝනා මට කතා කරලා කිවුවා ජීවිතේ පළවෙනි වතාවට මේ දෙන්නත් නැතිව ගියොත් ඔයාට දේශපාලනය කරන්න කිසිම කෙනෙක් නැති වෙලා යනවා ඒ නිසා හදිස්සි තීරණ ගන්න එපා කියලා. පස්සේ මගේ බිරිඳත් දරුවොත් කියපු නිසා ඒ දෙන්නට මම අපහු එන්න කියලා ලියුමක් හදලා තමයි නාමල් මැතිතුමාට දැම්මේ. ඒ විදිහට මේ සියළුම අභියෝග මැද්දේ එවට මුහුණ දෙමින් එවා ජයග්‍රහනය කරමින් අද මෙතනට ඇවිල්ලා මේ ආසනයේ ඉඳගන්න අවස්ථාව ලබා ගත්තේ. ගරු නගරාධිපතිතුමනී ඔබතුමාටත් මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම කියන්න ඕන අපි මෙතනට ඇවිල්ලා තියෙන්නේ මොරටුවේ වරිපනම් බදු ගෙවන ජනතාවට යම් සේවාවක් කරන්න. එදා මෙදා තුර මගේ දේශපාලනයේ මම කවදාවත් කොයිම නිලධාරියෙක් ළඟටවත් වැඩක් කරගැනීමට යාමේදී මා කිසිම මන්ත්‍රීවරයෙකුට පක්ෂ විපක්ෂ කියලා බෙදලා කතා කරලා නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා සිස්ටම් චේන්ජ් එක ගැන කතා කරනකොට මම මගේ පින්තූරෙත් එක්ක සිස්ටම් චේන්ජ් කියලා දාලා ෆේස්බුක් එකේ මම ඒ අවස්ථාවේ දුන්නා පුළුල් ප්‍රචාරයක් මොකද මේ සභාවේ සිස්ටම් චේන්ජ් එක මම කරලා තියෙන නිසා. ඉතින් මම විශ්වාස කරනවා මගේ පක්ෂ නායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අඩිපාරේ එදා ඉඳන්ම ගිය නිසා තමයි මම මගේ දේශපාලනය නිවැරදි දිශාවක් ඔස්සේ මේ වෙනකොට ඇත්ත වශයෙන්ම මට කිට්ටු කරන්නවත් බැරි ගමක තමයි මම දේශපාලනය ආරම්භ කරන්නේ. ඒ කියන්නේ 95% ක්ම කතෝලිකයෝ ඉන්න 95% ක්ම එක්සත් ජාතික පාක්ෂිකයෝ ඉන්න තැනකින් තමයි මම දේශපාලනය ආරම්භ කරේ. ඔබතුමාලා හිතන්න පුළුවන් 2018 ප්‍රියනාත් පැරදිලා ගෙදර හිටියා කියලා. මම ප්‍රකාශ කරනවා 2018 මම පැරදුනේ නැහැ මාව පැරැද්දුවා. මගේ සහ මාගේ ගෙදර ඡන්ද 12 ක් තියෙනවා. මම පැරදුනේ ඡන්ද 15 කින් එකට හොඳම සාක්ෂිය තමයි මෙතන ඉන්න තිලකසිරි මන්ත්‍රීතුමා, එතුමා මගේ රැස්වීම් වේදිකාවේ ඉන්නකොට අපේ හිටපු නායකයා වේදිකාවේ ඉඳන් කියනවා ප්‍රියනාත් දිනුවත් දිනුම් පැරදුනත් දිනුම් කියලා. එතකොට ඊට මාස 4කට 5කට පමණ පෙර මොරටුවේ කිසිම මන්ත්‍රීවරයෙකුට ව්‍යාපෘති කරන්න දෙන්නේ නැහැ. නමුත් කඩලානේ සහ පුවක්අරඹේ පාරවල් 8ක් විතර හදන්නේ. එකෙන් හතරක් කඩලාන මගේ ප්‍රදේශයේ. එතකොට මට ඡන්දය දෙන්න ශ්‍රිලංකා නිදහස් පක්ෂිකයෝ නැහැනේ මගේ ගමේ මට ඡන්දය දෙන්න එක්සත් ජාතික පාක්ෂිකයෝ මට ඡන්ද දෙන්නේ මන් ගැන යම් විශ්වාසයක් තියලනේ. ඡන්ද 15කින් මම පරදින්නේ. ඒ කියන්නේ ඡන්ද 29කින් දීපු එකෙන් 15කින්, එහෙම දුන්නනම් මම කුමන ස්ථානයකද ඉන්නේ කියන එක ඒ කෙනාට තේරුන නිසා තමයි ඒ කෙනා ඒ තීන්දු තීරණ ගනන් ඇත්තේ. නමුත් ඒ කියලා මම කිසිම කෙනෙක් එක්ක තරහා වුනේ නැහැ දේශපාලනයේදී, මම දේශපාලනය තේරුම් ගත්තා. මොකද මගේ පරම්පරාව දේශපාලන පරම්පරාවක් මගේ සීයා තාත්තා, තාත්තා සහ අනෙකුත් අය මේ මොරටුවේ දැවැන්ත දේශපාලනයක් කරපු පිරිසක් හින්දා ඒ ආභාෂය මට තිබුණ නිසා මම මේ සියළුම අරමුණු තේරුම් අරගෙන ඊයේ දවල් 12 වෙනකන් සෑම අභියෝගයකටම මම මුහුණ දීලා මම ජයග්‍රහනය කරලා තමයි මේ තැනට ආවේ. මම බෝහොම පැහැදිලිව කියනවා. මගේම එදා හිටපු සභාව තමුන්නාන්සේ එදා හිටියේ විපක්ෂයේ, මන්ත්‍රීවරයෙක් කඩලානේ නමක් දාන්න ගිහිල්ලා ඒ නමට අපේ අය පවා විපක්ෂයේ අයත් එක්ක සම්බන්ධ වෙලා මාව තනිකරලා මම ඡන්දයක් පවා කඩලානේ තිබ්බා. ඉතිහාසයේ නොතිබ්ච්ච ඡන්දයක් ගෙයින් ගෙට ගිහිල්ලා එකත්

මම ජයග්‍රහනය කෙරුවා. මට සහයෝගය දුන්නේ නැහැ කිසිම කෙනෙක්. සෑම අවස්ථාවකම දේශපාලනිකව මම නිවැරදි තීන්දුව ගත්තා කියන එක මට තියෙනවා. එක නිසා මෙම අවස්ථාවේදී මා හට මෙතෙක් සහයෝගය දීපු සියළුමදෙනාට ස්තුතිවන්ත වෙනවා. කතෝලික ආගමික නායකයින් ඒ අවස්ථාවේ කිවුවා මේ ආණ්ඩුව අපිට විශ්වාසයි ඒ නිසා ඒ මේ ආණ්ඩුවට ඡන්දය දෙන්න කියලා. ඒත් ඒ අවස්ථාවේදී 25% ජනතාව මට ඡන්දය ලබා දුන්නා. ඉතින් මම මේ අවස්ථාවේදී මේ තැනට එන්න ලැබීම ගැන සතුටු වෙනවා. ඔබ සැමට ස්තුතිය පුදකරනවා.

## 03. <u>සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**03(1)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මුලින්ම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ අවුරුද්දක් තිස්සේ අපිට පත් කර ගැනීමට නොහැකි වුණ මන්ත්‍රීවරයා හැටියට අද දින මෙම සභාවට මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වී පැමිණි ප්‍රියනාත් මන්ත්‍රීතුමාව මේ සභාවට ගෞරවයෙක් පිළිගන්නවා. ඔබතුමාට හරිම හිසරදයක් වෙයි ඉස්සරහට මෙතුමාගේ පැමිණීම. මේ පත් කිරීම සම්බන්ධයෙන් ජාතික සංවිධායක නාමල් රාජපක්ෂ මැතිතුමාට, මොරටුව සංවිධායක නිතිඥා මනෝජ් ගමගේ මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

**03(2)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම තමයි මෙච්චර කාලයක් අපේ ලංකාදීප වාර්තාකාරීනිය රේඛා තරංගනී සොහොයුරිය දැඩි අසනීප තත්ත්වයකින් පසු වුනා, ඔබතුමා සහ අපේ සභාවේ සියළු මන්ත්‍රීවරුන් ඇයට උදව්කරා, ඇය අද සුවවෙලා නැවත වතාවක් රාජකාරියට වාර්තා කරලා තියෙනවා. රේඛා තරංගනී සොහොයුරියට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා. ඇයට මොරටුවේ මහා සභාවේ තියෙන සියළු දේවල් ලියන්න ධෛර්ය ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**03(3)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අවුරුදු අටක් මොරටුව මහා නගර සභාවේ ගණකාධිකාරි තනතුර දැරූ එම්.ටී. ප්‍රබෝධනී මහත්මිය අදින් පසුව පළාත් සභාවට යනවා. එතුමියටත් එතුමියගේ ඊළඟ ආයතනයට සුභාසිංෂන පළ කරනවා.

**03(4)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම ඔබතුමාට මාස 2ක් තිස්සේ කියනවා, ලිඛිතවත් ඔබතුමාට ලබා දුන්නා. පළවෙනි රේල් ගෙට්ටුවේ තියෙන ඒ පැච් 2කට ප්‍රිමික්ස් සවල් 3ක් යයි කියලා. ඔබතුමා ඒ අවස්ථාවෙම කරන්න කියලා කිවුවා නමුත් තවමත් ඒ වැඩේ කෙරුනේ නැහැ. ඊට පස්සේ පීආර්ඩී එකට කතා කරලා කොහොම හරි ගිය සුමානේ එක වහලා දැම්මා. මේ වගේ චුට්ි දෙයක් කරන්නවත් බරිනම් වැඩක් නැහැනේ. පාසල් 2කක ළමයි ගණනාවක් ගමන්කරන මාර්ගයක් මේ එහෙම වෙළත් ඒ වැඩේ කෙරුනේ නැහැ.ඒ ගැන බොහහොම කණගාටු වෙනවා.

**03(5)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ සමන්ත සිල්වා මන්ත්‍රීතුමා සර්ව ජන බලයේ පක්ෂයේ මුළු දිවයිනේම සභාපති ධුරයට පත්වුනා එතුමාටත් සුභාසිංෂන පළ කරනවා. එහෙම සභාපති වෙන එක ලෙහෙසි දෙයක් නෙමෙයි.

**03(6)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වාචික පැමිණිල්ලක් තිබෙනවා ඉදිරිපත් කිරීමට ඔබතුමාත් මමත් දැන් මාස 4ක් 5ක් තිස්සේ කතා කරා ප්ලෑනින් සෙක්ෂන් එකේ යම්කිසි ගොනුවක් සම්බන්ධව ඒ ගොනු සම්බන්ධව ඔබතුමා ධානාත්මකව හිතුවා. මම ෆයිල් දෙකක් ගෙනාවා ඒ කියන ෆයිල් එකයි බී කියන ෆයිල් එකයි නිර්දේශ දෙකම එකක් නමුත් ඒ නියන ෆයිල් එක ඒ නිර්දේශ වලට සලකා බැලීම් නැතුව අයිතිකාරයා අරන් යනවා. බී කියන ෆයිල් එක ප්‍රදේශිය ලේකම් කාර්යාලයේ ක්ලියරන්ස් නැතුව තවම තියෙනවා කියලා. ඊට පස්සේ දිගින් දිගටම ඔබතුමා හොඳට අවධානය යොමු කරලා, නාගරික කොමසාරිස්තුමිය සමඟ සාකච්චා කරලා මේක කරන්න උත්සහයක් කරා. නමුත් අන්තිමට ගිය සතියේ ඔබතුමා සමඟ සාකච්ඡා කරද්දි ඒ ගොනුවේ මුල් පිටපත නැහැ. ඔබතුමා ළඟ ඉඳලම මම ඒ සහෝදරයට කතා කරාම කිවුවා මම ගාව ඒ ලිපි ගොනුව නැහැ කියලා. තුන්පාරක්ම ඇහුවා එත් නැහැ කිවුවා. ඊට පස්සේ ඔහුගේ තාත්තට කතා කරාම කිවුවා මා ගාව පිටපතක් තියෙනවා එක එවන්නම් කියලා. එක පන්ච් කරලා තිබුණා මට පන්ච් කරලා තියෙනවා දකිනකොටම හිතුනා මොකක් හරි කාරණයක් වෙලා තියෙනවා කියලා. එතකොට ඔබතුමාට කේන්ති ගියා මම හිතන්නේ. තුසිත් මන්ත්‍රීතුමාත් කිව්වා මේක අනිවාර්යෙන්ම එක තමයි කියලා. එක පිලිගත්තා පැයක් පමණ අපි ඒක කතා කරා. මෙතුමට ඕන වුනා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්ලියරින්ස් එක. මේක ගන්න මුල් පිටපත් ඕන. මුල්පිටපත ගන්න එතුමා ආවාම ෆයිල් එකෙන් කඩලා දෙන්නේ නැහැ, අනිවාර්යෙන්ම ලියුමක් අරගෙන තමයි ලබා දෙන්නේ එක වෙන කෙනෙක්ට ගන්නත් බැහැ ඒකට අයිතිකාරයාම වෙන්න ඕන. මේක මගේ ගෙදර තියෙන එකකුත් නෙමෙයි. එතන ඉන්න නිලධාරින් තමයි ලියුම අරගෙන ෆයිල් එක ඉෂූ කරන්නේ. මේක ඉෂූ කරලා ඔවුන්ට අමතක වුනා මාස 04ක් ගිහිල්ලා අපි හැමදාම කියනවා ඔබතුමත් කියනවා මේක අනුමත වෙලා තියෙන්නේ, නගරාධිපතිවරයා හැටියට මම වගකීම භාර ගන්නවා එක නිසා මේක දෙන්න කියලා ඉංජිනියර්ට කිවුවා. අන්තිමට 6/15 ලියුමක් දුන්නා නගරාධිපතිතුමා අත්සන් කරලා මේක අදම දෙන්න කියලා. එතකොටත් ෆයිල් එකේ අර මුල් පිටපත තිබිලා නැහැ. මුල්පිටපත අරගෙන ගිහිල්ලා මාස 4කට වැඩි, අපි කවුරුත් එක දන්නේ නැහැ. එතකොට ඔබතුමාගේ ආයතනයේ නිලධාරින් තමයි මේකේ වැඩ කරන්නේ. ඇත්තටම මට කළකිරීමක් ඇති වුනා ඒ වෙලාවේ මොකද ඔබතුමාලා අපි සම්බන්ධ වෙලා වැඩ කරද්දි අපිට බැහැ ඒ ෆයිල් එකකින් මුල් පිටපත හොරකන් කරන්න. මුකුත් ලියලත් නැහැනේ නිකන් ප්ලෑන් එකක් විතරයිනේ. නමුත් මේ තීන්දුවේදී ඉංජිනියර් එකක් කියනවා යුඩී එකේ රුවන් නිලධාරි එකක් කියනවා. ටී එස් එල් නිලධාරි එකක් කියනවා, ඔබතුමා එකක් කියනවා මම කියන්නේ ප්ලෑනින් සම්බන්ධ ප්‍රශ්නයේදී එක තීන්දුවටකට හැම කෙනාම එන්න ඕන. ඔබතුමා හොඳ මතයක දැන් ඉන්නවා. මම එදා පැයක් පමණ ඔබතුමා ළඟ හිටගෙන හිටියා ඔබතුමා කියන්නේ අපි ජනතාවගේ පැත්තෙන් බලමු, බලලා මේක දෙමු කියලා. අර එදා කියපු එස් 37 ෆයිල් එක දැන් මාස 5යි ප්‍රදේශිය ලේකම් කාර්යාලයට 38 වතාවක් ගිහිල්ලා තියෙනවා. මධ්‍යම පරිසර අධිකාරියට ගියා නමුත් තවම ලියුම දුන්නේ නැහැ. එතකොට ආයේ ඒ මිනිස්සු කාටද කියන්නේ. මේ ඉඩම විකුනලත් ඉවරයි. ඔබතුමා ගාවටම මම ඒ සහෝදරයව දෙතුන් සැරයක් අරගෙන ආවා ඒත් එක වුනේ නැහැ. ඒ වගේම තමයි ප්ලෑනින් සම්බන්ධ ගොඩක් කාරණා තියෙනවා. අනිත් කාරණාව තමයි ඉඩමක් විකිණීමේදී කැබලි කර විකිණීමේදී කැබලි 5කට වැඩිනම් තමයි 1%ක් අය කරන්නේ, නමුත් පරම්පරාවෙන් එන ඉඩම් වලටත් 1%ක් අය කරලා තියෙනවා. ඔබතුමාට මේක ගැන කිවුවම ඔබතුමා තේරුම් ගත්තා ඔබතුමා ඇහුවා කවුද මෙහෙම අය කරේ කියලා. ඒ වේලාවේ ඒ ඕ නෝනා තමයි හිටියේ එතුමිය දන්න ලේජර් එකක් නැහැ. මම ටී එස් එකත් එක්කත් කතා කරා. කතා කරලා ඉවර වෙලා එක හරියට ලියන්න. කමිටුවෙදී කතා කරන එක නෙමෙයි ලියන්නේ. මේක ඉස්සරහට වෙන්නේ නැති

වෙන්න මේ ගැන මැදිහත් වෙලා කටයුතු කරන්න. මම ඊයේ සුදේශ් මන්ත්‍රීතුමාටත් කිව්වා සිස්ටම් එකට දා ගන්න ගොඩක් කට්ටිය ඉන්නවා. එතන දෙන්නෙක් ඉන්නවා. ඒත් ඒ වැඩේ ඉක්මනින් වෙන්නේ නැහැ. ඒ නිසා මීට වඩා ක්‍රියාශීලි වෙලා මේ වැඩේ කරගෙන යන්න කියලා ඉල්ලනවා. මේක ඔබතුමාගේ නගරය ඔබතුමා නගරාධිපති, ඔබතුමා තමයි ප්ලෑනින් කමිටුවේ සභාපති ඒ නිසා යූ ඩී එකේ නිලධාරින්ට අවශ්‍ය දේවල් නෙමෙයි ඔබතුමාට අවශ්‍ය දේවල් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(7)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, අපි කවුරුත් දන්නවා පහුගිය දවස් වල අපේ විපක්ෂයේ ගරු සුජීත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා යෝජනා කරලා අප සියළු දෙනාගේ එකඟතාවය හා සහය මත මොරටුවේ ඩෙංගු වසංගතය දුරලීම සඳහා යම් කිසි එකාබද්ධ වැඩ පිලිවෙලක් සකස් කීරීම සඳහා යෝජනාවක් කරා. ඒ යෝජනාව ඉතාමත් සාධනීයව ඔබතුමා පිළිගෙන, ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් අපි ඒ අදාල සාකච්ඡාවක් කරා. අපි හොඳ තීරණ ටිකක් ගත්තා ඒ සම්බන්ධයෙන් මම අදහස් දක්වන්නේ නැහැ මම බලාපොරොත්තු වෙනවා සෞඛ්‍ය කමිටුව ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් යම් කිසි සමාලෝජනයක් ඔබතුමාගේ පැත්තෙන් ඉදිරිපත් කරනවනම් අපිටත් යම් අදහස් ටිකක් ඉදිරිපත් කරන්න පුළුවන්.

**03(8)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමත් මමත්, අපි කවුරුත් හිතවත්ව ලඟින් ඇසුරු කරපු ජගත් පනාගොඩ මහත්මයා, ඔහු ඒ කලේ ඉඳලම සමාජ ක්‍රියාකාරිකයෙක් හැටියට කටුයතු කරා විවිධ අවස්ථාවල විවිධ විදිහට. අපි දන්නවා ඔහු කුඩා පත්තර කිහිපයක මධ්‍යවේදීයෙක් ලෙස සේවය කරා. දැන් ඔහු පුරවැසි මාධ්‍යවේදීයෙකු ලෙස මේ මොහොතේ මොරටුවේ යූ ටියුබ් චැනල් එකක් සහ මොරටුවේ ෆේස් බුක් පේජ් එකකුත් කරගෙන යනවා. ඉතින් ඔහු ඉල්ලීමක් කරා මේ සභාවේ මධ්‍යකරණයට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්න කියලා. අද ඔහු මෙතනට මොරටුව පුරවැසියෙකු ලෙස ඇවිත් ඉන්නවා. නමුත් මම ඉල්ලීමක් කරනවා එතුමාටත් අවස්ථාව ලබා දෙන්න කියලා මේ සභාවේ මධ්‍ය කටයුතු වලදී ඒ කටයුතු වලට සම්බන්ධ වෙන්න කියලා. මේ ලෝකයෙත් තියෙනවා පුරවැසි වාදය කියලා ව්‍යුහයක් ඉතින් ඒ ව්‍යුහය මත පදනම් වෙලා මේ අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඊලඟ සභාවේදී හෝ ඒ මහත්මයාට ඒ මාධ්‍යකරණය සඳහා අවස්ථාව සලසා දෙන ලෙස.

**03(9)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඇත්තටම අපේ සභාවේ කාලයක් තිස්සේ අපි නොදැකපු මුහුණක් බරපතල අසනීප තත්ත්වයකට මුහණ දීලා, ඉතාමත් අවාසනාවන්ත ලෙස ඇය රෝගාතුර වෙලා සිටියා. ඇයගේ පැමිණීම සම්බන්ධයෙන් ඔසඳ මන්ත්‍රීතුමා කතා කරපු නිසා මම වැඩිදුර කතා කරන්න යන්නේ නැහැ. පසුගිය කාලයේ අපේ මාධ්‍ය එකකයේ පයා නැති වෙච්ච රේඛාව අද පායලා තියෙනවා. එතුමියට සුබ පතනවා.

**03(10)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම අපගේ ගණකාධිකාරිතුමිය ප්‍රබෝධනී මහත්මියගේ ඉලඟ පළාත් සහා ආයතනයේ මේ වගේම කටයුතු කරලා එතුමියගේ රාජකාරි ජීවිතය සාර්ථක කරගන්න ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**03(11)** **මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනී, අපේ ප්‍රියනාත් ගරු මන්ත්‍රීතුමා අවුරුද්දකුයි මාසයකටත් පස්සේ පොදු ජන පෙරමුනේ මන්ත්‍රීවරයෙක් ලෙස පුරප්පාඩු මන්ත්‍රීධූරය සඳහා අද දින පත්වුනා. විපක්ෂය විදිහට එතුමා පැමිණිම සම්බන්ධයෙන් මගේ සුබ පැතුම් එක් කරනවා.

**03(12)** **මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනී, අපේ සමන්ත මන්ත්‍රීතුමා සර්වජන බලයේ පළාත් පාලන සභාපති කිව්වම හැමෝම බලනවා එතකොට දිලිත් ජයවීර මන්ත්‍රීතුමා නෙමෙයිද කියලා සභාපති. සර්වජන බලයේ තේරී පත් වෙච්ච පළාත් පාලන ආයතනවල පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් ඒ ආයතනයේ මන්ත්‍රීවරුන්ගේ සංසදයේ සභාපති ධූරය ලැබිලා තියෙනවා. මොරටුවේ පුරවැසියෙකු විදිහටත් මගේ සහෝදරාත්මක හිතවතෙකු විදිහටත් මම මගේ ගෞරවනීය සුබ පැතුම් එතුමට එක් කරනවා.

**03(13)** **මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනී, මොරටුව මහා නගර සභාවේ අපිත් එක්ක බොහොම ලෙන්ගතුව කටයුතු කරන සුජිත් මන්ත්‍රීතුමාගේ ආදරනීය මෑණියන් අප අතරින් සමුගත්තා. ඇත්තටම එතුමන්ගේ ඒ මෑණියන්ගේ අවමංගල්‍යා උත්සවයට මට සහභාගි වෙන්න බැරි වුනේ මම අසනීප වෙලා රෝහල්ගත වෙලා සිටි නිසා. මම ඇත්තටම මගේ ගෞරවනීය සාතිශා සංවේගය සුජීත් පුෂ්පකුමාර ගරු මන්ත්‍රීතුමාටත් එතුමාගේ පවුලේ සියළු දෙනාටත් පළ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

**03(14)** **මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනී, විශේෂයෙන්ම මේ සභාවේ වසරක් ගිය කළ අපිට හිඩසක්ව පැවති විපක්ෂයේ මන්ත්‍රී ධූරය සඳහා හිටපු ජොෂ්ඨ මන්ත්‍රීවරයෙකු වන ප්‍රියනාත් මෙන්ඩිස් මන්ත්‍රීතුමාගේ පැමිණිම සම්බන්ධයෙන් ඉතාමත් සන්තෝස වෙනවා මේ අවස්ථාවේ. එතුමාට සුභාෂිංශන ගෙන එනවා. මම නිවැරදිනම් මට මතක විදිහට 2002 වර්ෂයේ තමයි එතුමා පළමු වරට නගර සභාවට තේරී පත්වෙන්නේ ඊට පසුව 2006, 2011 වර්ෂ වල මේ නගර සභාව නියෝජනය කළ දීර්ඝ අත්දැකීම් තියෙන මේ සභාවට වැඩක් කරපු මන්ත්‍රීවරයෙක් විදිහට අපි ප්‍රියනාත් මන්ත්‍රීතුමාව දකිනවා. එතුමාගේ කාතවේදී එතුමා සඳහන් කරා එතුමා නියෝජනය කරපු කොට්ඨාශය බොහොම බැරෑරුම් කොට්ඨාශයක් ඒක ඇත්ත කතෝලික ජනතාව වැඩි, ඒ වගේම එක්සත් ජාතික පක්ෂයට වැඩි ඡන්ද ප්‍රමාණයක් තියෙන, ඒ වගේම ඔහුගේ දක්ෂතාවය නිසාම ඔහු ඒ මනාප ලබා ගත්තා කියන එක අපි සන්තෝෂයෙන් මතක් කරනවා විපක්ෂයක් විදිහට. එතුමාගේ පැමිණිම විපක්ෂයක් විදිහට අපේ කණ්ඩායමට ශක්තියක් කියලා මතක් කරමින් එතුමාට සුබ පතනවා.

**03(15)** **මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනී, සර්වජන බලයේ පක්ෂයේ පළාත් පාලන සංසදයේ සභාපතිවරයා ලෙස මොරටුව මහා නගර සභාව නියෝජනය කරන අපේ විපක්ෂ කාණ්ඩායමේ ප්‍රබල සමාජිකයෙකු වන හිටපු උප නගරාධිපති සමන්ත සිල්වා මැතිතුමා පත්වෙලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් අපි අපගේ සුභාෂිංසනය පුද කරනවා.

**03(16)** **මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනී, බණ්ඩාරවෙල දියතලාව ප්‍රදේශයේදී සුජිත් මන්ත්‍රීතුමාගේ මෑණියන්ගේ අභාවය සිදුවුනා. ඊට ටික කාලයකට පෙර එතුමාගේ පියත් නැති වුනා අපිට සහභාගි වෙන්න බැරුව ගියා. නමුත් මෑණියන්ගේ අභාවය වෙනුවෙන් අපි සහභාගි වුනා. මම ඉතා ස්තුතිවන්ත වෙනවා

නගරාධිපතිතුමා ඉතා දුර බැහැර වුනත් සුදේශ් මන්ත්‍රීතුමත් මේ අවමංගල්‍ය උත්සවය වෙනුවෙන් සහභාගි වුනා ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින්. අපි විපක්ෂය නියෝජනය කරමින් මා සමඟ සහභාගි වුනා බ්‍රෙන්ඩන්, දිලිප් මන්ත්‍රීවරුන් වගේම හිටපු මන්ත්‍රී නිරෝෂන් මහතා. ඒ මැණියන්ගේ කුස තුළින් සුජිත් පුෂ්පකුමාර වැනි දක්ෂයෙකු මෙලොවට බිහිකිරීම සම්බන්ධයෙනුත් එතුමියගේ අභාවය සම්බන්ධයෙනුත් එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**03(17)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අද දින මේ වාර්තා කරණය සඳහා සහභාගිවන හිටපු මාධ්‍යවේදීනිය රේඛා තරංගනී මහත්මිය පසුගිය කලයේදී ඉතා දරුනු ලෙස රෝගාතුර වී සිටියා. කණ්ඩායමක් විදිහට අපි දුන්න දායකත්වය, විශේෂයෙන්ම ඔබතුමා ලබා දුන්න දායකත්වය, නගර සභාවෙන් ලැබුණ දායකත්වය එතුමියට ලොකු පිටුවහලක් වුනා කියන එක මතක් කරනවා.

**03(18)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම තමුන්නාන්සේ බොහොම නම්‍යශීලී වුනා පහුගිය කාලයේ ඩෙංගු මර්ධන ව්‍යාපාරය සම්බන්ධව කටයුතු කිරීමේදී විපක්ෂ මන්ත්‍රීවරු සහ පක්ෂ මන්ත්‍රීවරු සහභාගි කරවගෙන ඒ අදාල ආයතන ගෙනල්ලා මෙහෙට විදිමත් වැඩපිළිවෙලකට අවකාශය වෙන්න තමුන්නාන්සේගේ ලොකු උත්සහයක් තිබ්බා මම එකට ස්තුතිවන්ත වෙනවා. නමුත් තමුන්නාන්සේගේ මන්ත්‍රීවරුන්ගේ අත්දැකීම් නොමැතිකම නිසා වෙන්න ඕන වැඩි අවබෝධයක් තිබුනේ නැහැ අපි ගිය බජට් එකේ කතා කරනකොට ඩෙංගු සම්බන්ධයෙන් ලක්ෂ 5ක් වෙන් කරනකොට මට මතකයි මම කතා කරනකොට නිකන් විහිළුවකට වගේ අරගෙන ලක්ෂ 5 වැඩි වෙන විදිහට තමයි කතා කරේ. මම ඇහුවම ඇයි කියලා එක මන්ත්‍රීවරයෙක් කිවුවේ එහෙම වෙන්නේ නැහැ අපි කාණු ටික සුද්ධ කරගෙන යනවා කියලා. දැන් ඔබතුමන්ලාට තේරේනවා නේද මෙහි බැරෑරුම් තත්ත්වය මොකද්ද කියලා. අද ලංකාවේ ඩෙංගු සංඛ්‍යාත්මක අතින් මොරටුව ඉහළම ස්ථානයක ඉන්නේ. අපි ඒ සම්බන්ධව බොහොම කණගාටුවට පත්වෙනවා. හැබැයි මේක තමයි යථාර්තය මේ දේවල් කලින් වෙනවා කියලා අපි කිවුවට තමුන්නාන්සේලා පිළිගත්තේ නැහැ. අපි සතුටු වෙනවා පහුගිය කාලයේ කොමසාරිස්තුමිය ඉන්නකොට, ආණ්ඩු බලයක් නැතිව පාලනය කරනකොට ඩෙංගු සඳහා ලක්ෂ 15ක මුදලක් වෙන් කරලා තිබුණා. මේ මුදලත් මදී මෙන්න මේ තත්ත්වය අපි අවබෝධ කරගෙන කටයුතු කරන්න ඕන කියන එක මම මේ අවස්ථවේදි මතක් කරනවා. අද මේ අවස්ථාව වෙන විට ඉතාමත්ම බැරෑරුම් තත්ත්වයක් තියෙන්නේ. මේ අවස්ථාවේ දැන් මට දුරකථනයෙන් දැන ගන්නට ලැබුණා මොරටුව විශ්ව විද්‍යාලය සම්පූර්ණයෙන්ම වහලා තියෙනවා කියලා. මේ අයට ජුලි මාසේ 20 වෙනකන් නිවාඩු ලබා දීලා තියෙනවා. ඩෙංගු රෝගීන් 40 ක් වගේ ප්‍රමාණයක් කැම්පස් එක ඇතුලේ විතරක් වාර්තා වෙලා තියෙනවා. ඒ වගේම අනධ්‍යයන කාර්ය මණ්ඩලය පමණක් අද සේවයේ යෙදෙනවා. ඉතින් එක නිසා අපි කණගාටු වෙනවා මොරටුවේ තියෙන ප්‍රමුඛ ස්ථානයක් වෙන අධ්‍යාපන පීඨය විශ්ව විද්‍යාලය වැසීමට සිදු වීම සම්බන්ධයෙන්. මේකට විදිමත් වැඩපිළිවෙලක් අපි ක්‍රියාත්මක කරන්න ඕන. මම දැක්කා සමහර මිනත්‍රීවරු උනන්දුවෙන් වැඩ කරා, ඔබතුමාටත් පැහැදිලි උවමනාවක් තිබුණා. නමුත් මේ උනන්දුව අපි ගත්තේ අශ්වයා පැනලා ගියාම ස්ථාලය වහනවා වගේ වෙලාවක. ඒ නිසා මේ සඳහා විධිපත් වැඩපිළිවෙළකට අවතීර්ණ වෙන්න කියන ඉල්ලීම කරනවා.

**03(19)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පහුගිය කාලයේ මොරටුව ප්‍රදේශයේ වතුර කැපීමක් සිදුවුනා. අදටත් එකේ ප්‍රතිවිපාක බලපාලා තියෙන්නේ. මම මේ ලැයිස්තිවෙලා එන්න එනකොට රාවතාවත්ත ප්‍රදේශයේ පුද්ගලයෙක් කිවුවා දවස් 05ක් තිස්සේ ඒ අයගේ ගෙදරට වතුර නැහැ කියලා. සොයිසාපුර මම හිතන්නේ අපේ සුදේශ් මන්ත්‍රීතුමත් ඉන්නවා. මම එතුමාගෙත් අවධානය යොමු කරනවා. සමහර විට එතුමා දන්නවා ඇති සොයිසාපුර ඉන්න ජනතාව ගැන අපි මීට වඩා සංවේදීව හිතන්න

ඕන. මොකද ඒ මිනිස්සුන්ට අපිට වගේ එළියට ගිහින් වතුර අරන් එන්න බැහැ ඒ මිනිස්සු ඉන්නේ මහල් නිවාස වල. ඒ නිසා එතන තියෙන ටැංකිය. තමුන්නාන්සේලා හොයලා බලන්න පහුගිය කාලයේ මේ ටැංකියේ වතුර නැති වුනේ බොහොම කළාතුරකින්. ඉස්සරනම් මේක බොහොම ලඟ සම්බන්ධයක් තිබුණා වෝටර් බෝඩ් එකත් එක්ක මොනවා හරි දේයක් වුනොත් මන්ත්‍රීවරු විදිහට අපි දන්නවා මේකේ මොනවද වුනේ කියන එක. නමුත් දැන් එහෙම සම්බන්ධීකරණයක් නැහැ එක නිසා සොයිසාපුර ජනතාවත් අපහසුතාවයට පත්වෙනවා. මේක සොයිසාපුරට අඹතලෙන් විතරක් නෙමෙයි කළුතරිනුත් ජල සැපයුමක් කරනවා. ඒත් එතන සේවකයෝ බොහොම කල් මැරීමක් කරනවා කියලා අරංචි වුනා. මේක අපේ රාජකාරියක් නොවුනත් මොරටුවේ වරිපනම් ගෙවන ජනතාව වෙනුවෙන් අපි ඒ දේවල් බලන්න මහජන නියෝජිතයින් හැටියට කටයුතු කරන්න ඕන කියන ඒ ඉල්ලීම කරනවා.

**03(20)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, ප්‍රථමයෙන්ම කාලයකට පෙර මේ සභාව නියෝජනය කරපු කඩලාන කොට්ඨාශය නියෝජනය කරපු අපේ ප්‍රියනාත් මන්ත්‍රීතුමාට සුභ පතනවා මොරටුවේ ජනතාවටත් කඩලානේ ජනතාවටත් සේවය කරන්න නැවතත් මේ ගරු සභාව නියෝජනය කරන්න ලැබීම සම්බන්ධව.

**03(21)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, අපගේ මොරටුව මහා නගර සභාවේ හිටපු නියෝජ්‍ය පුරපතිතුමන්ගේ ආදරනීය මැනියන්ගේ ආභාවය සම්බන්ධව අපගේ කණගාටුව හා ශෝකය සුජිත් මන්ත්‍රීතුමා ඇතුලේ පවුලේ සියළුදෙනාටම පුද කරන්න මේක අවස්ථාවක් කරගන්නවා.

**03(22)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, සර්ව ජන බලය පක්ෂයේ පළාත් පාලන සංසධයේ සභාපතිවරයා ලෙස මොරටුව මහා නගර සභාවේ හිටපු නියෝජ්‍ය පුරපති සමන්ත සිල්වා මැතිතුමා පත්වීම සම්බන්ධයෙන් හදවතින්ම සුභ පතනවා. ඒ තුළින් විශාල සේවාවක් රටට කරන්න ධෛර්ය ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**03(23)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, අපි මේ සභාවේ දිගින් දිගටම කිවුවා ඉදිබැද්ද ප්‍රදේශයේ තිබෙන ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රිඩාංගනය සම්බන්ධව. අද එම ක්‍රිඩාංගනයේ තත්ත්වය එන්න එන්නම දරුනු අතට හැරිලා තියෙනවා. ක්‍රීඩා කිරීමේදී විවිධ දුෂ්කරතා අවහිරතා මැද තමයි මෙහි ක්‍රිකට් තරඟයක් වුනත් පවත්වන්නේ. බොහොම කණගාටුදායක තත්ත්වය තමයි ක්‍රිකට් තරඟයක් තිබෙන්නේ මොන දවසේද ඔබතුමන්ලා මැදිහත් වෙලා ඒ ක්‍රිකට් මැච් එක තියෙන දවසට කලින් දවසේ තමයි මේකේ තණකොළ ටික හරි කපන්නේ. හැබැයි මේක බොහොම කණගාටු දායක තත්ත්වයක් අපි දිගින් දිගටම මේ සභාව තුළ අපි කරුනු මතු කරා. මේක එහෙම කරන්න එපා මේක දෛනිකව ක්‍රිඩා කරන්න එතනට ජනතාව එන තත්ත්වයක් තියෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලාගේ කාරුණික අවදානය යොමු කරලා මැච් එකක් තියෙන දවසට විතරක් මේක සුද්ධ පවිත්‍ර කරන්න තියාගන්න එපා. නමුත් එක හරියට වෙන්නේ නැහැ. දැන් ඔබතුමත් ආවා ගිය සතියේ ඉරිදා තිබුන මැච් එකට. එකෙදී ඊට ඉස්සෙල්ලා දවසේ තමයි තණකොළ කැපුවේ. එක හරියට වෙලා නැහැ. මේ වෙනකොටත් ලොකුවට තණකොළ තියෙන තැන් කිහිපයක් පමණයක් කපා ගන්න පුළුවන් වුනේ. මේ වෙනකොට ක්‍රිඩා පිට්ටනියේ විවිධ අඩුපාඩුකම් තිබියදී ප්‍රේක්ෂකාගාර වල විදුලිය නැහැ, වතුර

නැහැ, ගොඩනැඟිලි වල දොර ජනේල ගලවන් ගිහින් තිබෙන තත්ත්වයක් තිබියදී තමුන්නාන්සේලා මෙහෙන් සැළසුම් කරනවා වටිනා මී ගසක් තිබෙනවා එය කපලා ඉවත් කරන්න. මෙච්චර ක්‍රීඩාංගනය තුළ අඩුපාඩු තිබෙනවා, ක්‍රීඩා කරන්න විදිහක් නැහැ, තමුන්නාන්සේලාගේ නියෝජිතයෝ ගිහිල්ලා මේ ගස කපලා ඉවත් කරන්නේ කොහොමද කියලා කල්පනා කරනවා. මේකේ මාස කිහිපයක් තිබුණා දිරපු ගසක් හැබැයි ඒ ගස කපන්න කිසිම කෙනෙක්ට වුවමනාවක් තිබුනේ නැහැ. අපි මැදැහත් වෙලා ඔබතුමා සමඟ එක කරනකන්. හැබැයි තමුන්නාන්සේගේ නියෝජිතයෝ ඔන්න ඕක තමයි කරන්නේ. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ මැදැහත් වීම කරන්න මේ ක්‍රීඩාංගණය ක්‍රීඩා කරන්න පුළුවන් මට්ටමට සකසන්න කියන ඉල්ලීම කරනවා.

**03(24)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාවනා හා පෙත්සම් යටතේ මා වෙත ඩෙංගු සම්බන්ධව ලිපි 5ක් වගේ ලැබී තියෙනවා. ඉදිබැද්ද බිලාසියුස් පාරේ සියළුදෙනා අත්සන් කරලා ලිපියක් ලබා දීලා තියෙනවා. මේ වෙනකොට බිලාසියුස් පාරේ රජවත්තේ ඩෙංගු රෝගීන් 5 ක් 6 ක් පමණ ඉන්න තත්ත්වයට පත්වෙලා තියෙනවා කියලා. එකට හේතුව හැටියට එගොල්ලෝ කියලා තියෙනවා ඒ අය පරිසරය සුද්ධ පවිත්‍ර කරාට අපේ සභාවට අයත් ඉඩම් කොටසත් තියෙනවා බිල්මොරියා පාරේ පර්චස් 10ක 15ක කැල්ලක් තියෙනවා. මේක තුළ වතුර වලක් තියෙනවලු මේ ප්‍රදේශවාසීන් ගිහිල්ලා මේක බැලුවට පස්සේ මේ අය විශ්වාස කරනවලු මෙන්න මේ ඉඩමෙන් තමයි මේ ඩෙංගු බෝ වෙන්න පුළුවන් කියලා. ඒ නිසා මේ සම්බන්ධයෙන් කාරුණික අවදානය යොමු කරලා මහජන සෞඛ්‍ය පරික්ෂකවරු යවලා මේ ගැන සොයා බලලා මේ සඳහා විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(25)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඉදිබැද්ද සේවා පටුමගේ පවුල් 25ක් පමණ අත්සන් කරලා දීලා තියෙනවා ලිපියක්, මේ ප්‍රධාන කාණු එකක්වත් සුද්ධ පවිත්‍ර කරලා නැහැ කියලා මාස කිහිපයකින්. මා එම ලිපිය සභාගත කරනවා. මේ සඳහා ඔබතුමන්ලාගේ කාරුණික අවදානය යොමු කරලා මේ වසංගත තත්ත්වයෙන් ජනතාව මුදවා ගැනීමට තමුන්නාන්සේලාගෙන් විය යුතු ඒ පිරිසිදු කිරීමේ කටයුතු ටික සිදුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(26)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පහළ ඉදිබැද්ද ධනසිරි ලී මෝල පාරේ ඊයේ දිනයේදී මම යනකොටත් කුඩා දරුවෙක් ඩෙංගු රෝගය වැළදිලා ඉන්නවා. තවත් එක්කෙනෙක් රෝහල් ගතකරලා තියෙනවා. තවත් කිහිප දෙනෙක්ටම උණ රෝගය වැළදීලා ඉන්නවා. ඒ ගැන සොයා ලබා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම තමයි මම මේ පාරේම කිවුවා පොල් ගසක් සම්බන්දයෙන්. තවම තමුන්නාන්සේලා එහි න්‍යාතික තත්ත්වය හොයනවා. මේ ගස කපන්නේ කොහොමද එහි අයිතිකාරයෝ නැහැ කියලා. ඒ අයම මේ සම්බන්ධව මැදැහත් වෙලා වත්තේ අය සමඟ කතා කරලා ගස කපා ඉවත් කරා. දැන් මේ වෙනකොට ඒ වත්තත් අක්කර 2ක පමණ ඉඩමක්. මම ඊයේත් සීපීඑච්අයි මහත්තයට කතා කරා ඔවුන් සමඟ ඉන්නකොටම. ඒ ඉඩමේ ලොකුවට ගස්කොළන් තියෙනවා මදුරුවන් බෝ වන ස්ථාන තිබෙන්නට පුළුවන්. එහෙම නැති වෙන්නත් පුළුවන් ඒත් ඒ මිනිස්සුන්ගේ අදහසක් තිබෙනවා මෙතනින් මදුරුවෝ බෝ වෙන්න පුළුවන් කියලා. එම නිසා ඒ

ස්ථානය පරික්ෂා කරලා බලලා, ඒ අයට අවවාද කරලා මදුරුවෝ බෝ වන ස්ථාන තිබෙනවනම් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනන් කියන ඉල්ලීම කරනවා. මම එම ලිපියත් සභාගත කරනවා.

**03(28)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඉදිබැද්ද සේවා පටුමගේ ඩෙංගු රෝගීන් ඉන්නවා දැනටත් කළුබෝවිල රෝහලේ ප්‍රතිකාර ලබනවා නේවාසිකව. එතන කුඩා ළමයිනුත් ඉන්නවා. එම නිසා දූමායනය හරි කරලා ඒ මිනිසුන්ට යම් කිසි සහනයක් ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. මොකද මේ වෙනකොට මිනිස්සු ඉතාමත් භීතියට පත්වෙලා තියෙන්නේ. වැඩිහිටියන්ට කුඩා දරුවන්ට කියලා නැහැ හැම කෙනාම අපි මේ තත්ත්වයෙන් මුදවා ගන්න ඕන. සෞඛ්‍ය අංශ වලින් මේ සඳහා විසඳුම ලෙස කියන්නේ පරිසරය අපි පිරිසිදුව තියාගන්න ඕන කියලා. ජනතාව ඔවුන්ගේ නිවාස පිරිසිදුව තබා ගන්නකොට නගර සභාවක් හැටියට අපි දැන ගන්න ඕන පාරවල් වල තිබෙන කාණු ටික, බෝක්කු ටික සුද්ධ පවිත්‍ර කරලා තියන්න. අද වන විට තමුන්නාන්සේලාගේ ක්ලිනීන් ශ්‍රී ලංකා වැඩසටහන නැති වෙලා තියෙනවා. මොකද මැතිවරණයට කලින්නම් තමුන්නාන්සේලා සියළුදෙනා එකතු වෙලා කොමසාරිස්තුමියව සම්බන්ධ කරගෙන කාණු, පාරවල් සුද්ධ පවිත්‍ර කරා. පාරවල් හෝදන මටට්මට ගියා එදා නමුත් අද තමුන්නාන්සේලාගේ කණ්ඩායමත් නැහැ, පක්ෂිකයොත් නැහැ අද වන විට ඒ සියළුදේ නැති වෙලා තියෙනවා. කොච්චර හොඳට සුද්ධ පවිත්‍ර කරලද කියන එක පේනවා අද වන විට ඩෙංගු රෝගය වැඩි වෙලා තියෙනවා. මිනිස්සු ගනනාවකටම අද වන විට රෝගය වළඳිලා තිබෙනවා. ඒ නිසා දැන් හරි ඔය බොරු කියන එක නවත්තලා මේ ජනතාවට සේවයක් කරන්න මොකද අපි මේක තුළ පාලනය කරනකොට අපි ප්‍රශ්නය හොයාගෙන ගියා. ඒ ප්‍රශ්නය හොයාගෙන ගිහිල්ලා අපි ඒ ප්‍රශ්නය මේ සභාවට අරගෙන ආවා. හැබැයි ඔබතුමන්ලාගේ නියෝජිතයින්ට මේ ජනතාව ප්‍රශ්න ගෙනල්ලා දුන්නම තමුන්නාන්සේලා ඒ ප්‍රශ්නය අතහරිනවා. එක තමුන්ගේ ප්‍රශ්නයක් විදිහට අරගෙන සභාව තුළට ගෙනල්ලා විසඳන්න හදන්නේ නැහැ. එවා තවත් කෙනෙකුට පස් කරන උද්දච්චකම තමයි මේ දේශපාලනය තුළ තියෙන්නේ. ඒ නිසා ඒ උද්දච්චකම ටිකකට නවත්තලා මේ ජනතාවගේ ප්‍රශ්න වලට විසඳුම් හොයන්න තමුන්නාන්සේලාට හැකි වේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

**03(29)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, අද දින අපේ සභාවට තේරී පත්වෙලා පැමිණි ජ්‍යෙෂ්ඨ නාගරික මන්ත්‍රී ප්‍රියනාත් මෙන්ඩිස් මහතාට මගේ උණුසුම් සුභ පැතුම් එක් කරනවා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ රාවතාවත්ත බටහිර කොට්ඨාශයේ සුභාසිරි මාවතේ ඉදිකර තිබෙන කාණුව වැසිකාලයට වතුර පිරීම නිසා ඒ නිවෙස් වල දාලා තිබෙන නළ මාර්ග ඔස්සේ නැවතත් නිවෙස් තුළට වතුර කාන්දු වීමක් සිද්ධ වෙනවා. ඉතින් කිහිප විටක්ම නගර සභාව දැනුවත් කරලා තියෙනවා. නමුත් එක් පවිත්‍ර කිරීමක් වෙලා නැහැ. ඉතින් ඒ සුභාසිරි මාවතේ ප්‍රදේශවාසීන් ඉල්ලා සිටිනවා මේ සභාවෙන් ඉතා ඉක්මනින් සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සිදු කරලා දෙන්න කියලා.

**03(31)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ මොරටුව නගරයේ තිබෙන ප්‍රධානම ස්ථානයනක් තමයි මෙඩිහෙල්ප් ආයතනය, ඉතින් එම ආයතනය අධික වර්ෂාව නිසා ඒ ආසාන්නයේ කාණු සුද්ධ පවිත්‍ර නොකිරීම හේතුවෙන් එම ආයතනය තුළට වතුර එනවා කියලා සඳහන් කරලා ලිපියක් ඔවුන් විසින් ලබා දී

තිබෙනවා. ඔබතුමාටත් මීට පෙර ලිපියක් ඉදිරිපත් කරා තියලා ඔවුන් දැනුවත් කරා. නමුත් තවමත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් අරගෙන නොමැති නිසා ඉතා කඩිනමින් මේ කාණු පද්ධතිය පවිත්‍ර කිරීමේ කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(32)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුව ඉඩම මෙඩිහෙල්ප් ආයතනයේ කරිලිච්ස් හෝටලය මැදින් තවත් කාණුවක් තිබෙනවා. එතකොට මේ කාණුවත් වංගු ආකාරයෙන් තිබෙන නිසා කාණුවේ මුළු වල කුණු හිරවෙලා එම කාණුව ඇතුලේ ගස් වල මුල් වැවි ඇති නිසා ඒ කාණුවේ වතුර පිටාර ගලලා නිවාස තුළට එනවා කියලා ඒ අය කියනවා. අවුරුදු 2කින් පමණ මේ කාණුව සුද්ධ කරලා නැහැ ඒ නිසා මේ කාණුවත් පිරිසිදු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(33)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, අර්බන් එලිෆන්ට් ආයතනය අසල තිබෙන මාර්ගයෙත් ඒ තත්ත්වයම තමයි තියෙන්නේ ඒ පාරත් ඉතා අබලන් තත්ත්වයක තියෙනවා කියලා ඔවුන් දැනුවත් කරලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේ සඳහා ඉක්මන් විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(34)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, වාචික ඉදිරිපත් කිරීමක් තිබෙනවා සිදුකරන්න මොරටුව ප්‍රදේශයේ සෑම තැනකම වගේම අනවසර ඉදිකිරීම් ගණනාවක් තිබෙනවා. ඒ හේතුවෙන් අපිට කාණු සුද්ධ කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මේ ඩෙංගු ව්‍යාප්තිය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මේ නගරයේ ප්‍රධාන පුරවැසියා වශයෙන් ඔබතුමාගේ අවධානය මේ සඳහා යොමු කරලා මේ සඳහා ඉතා ඉක්මන් විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(35)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, විශේෂයෙන්ම අපි පළමු කොට අපේ සුභාශිංසන පුදකර සිටිනවා හිටපු ජ්‍යෙෂ්ඨ නාගරික මන්ත්‍රීවරයෙක් වන ප්‍රියනාත් මෙන්ඩිස් මහතාට එතුමාගේ පත්වීම සම්බන්ධයෙන්. මම ඇත්තටම සතුටු වෙනවා පොදු ජන පෙරමුණ දැන් හෝ ප්‍රතිශතය පිළිබඳ හිතන එක ගැන. එදා ප්‍රතිශතය පිළිබඳව හිතුවනම් පොදු ජන පෙරමුණ අදත් බලයේ ඉන්නවා. මොකද එදා ප්‍රතිශතය බලන්නේ නැතිව තනතුරු දීපු නිසා ඒ අය මූලික වෙලා අරගලය දරුනු අතකට යවලා ගෝඨාභය රාජපක්ෂ මහතාට ගෙදර යන්න සිදුවුනේ. ඒ නිසා මොළේ කල්පනා කරලා දැන් හරි වැඩ කරන එක ගැන මම පොදු ජන පෙරමුණට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම මම ප්‍රියනාත් මන්ත්‍රීතුමාට විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා අපිත් සමඟ සම්බන්ධ වෙලා වැඩ කරන්න පැමිණීම ගැන.

**03(36)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, රේඛා මහත්මියටත් නිරෝගී සුව ප්‍රාර්ථනා කරනවා.

**03(37)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ හිටපු උප නගරාධිපති සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමාගේ මෑණියන්ගේ අභාවය පිළිබඳව ශෝකය සර්ව ජන බලය පක්ෂය වෙනුවෙන්, දිලිත් ජයවීර මැතිතුමා වෙනුවෙනුත්, සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා වෙනුවෙනුත් පළ කරනවා.

**03(38)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කටුබැද්ද වෙලොනා ඉඩමේ කොටස් කර විකිණීමෙන් අනතුරුවත් තවම ඉදිකිරීම් කටයුතු කිසිවක් සිදුවෙන්නේ නැහැ. තවම පොදු කටයුතු සඳහා එතන භාවිතා කරනවා. ඒ ඉඩම් කොටස් වල අයිතිකරුවන්ගෙන් එක් මහත්මයෙක් අපට දැන් කතා කරලා කිව්වා එතුමා අවශ්‍යනම් මුදල් යොදවන්නම් කියලා ඒ ඉඩම සංවර්ධනය කරන්න කියලා, දරුවන් සඳහා සෙල්ලම් කිරීමට පාක් එකක් හෝ නිවාඩු පාඩුවේ සිටීමට හැකි ස්ථානයක් නිර්මාණය කිරීමට. අපි ඒ රන්දිමාල් මහතාට කිව්වා මේ සම්බන්ධයෙන් ඔබතුමාව දැනුවත් කරන්න කියලා. අපි යම් සැලසුමක් හදලා ඇස්තමේන්තුවක් එතුමට දුන්නොත් ඒ යන මුදල් සභාවට ලබා දෙයි නැතිනම් එතන හැමදාම සභාවේ දේවල් යොදවලා සුද්ධ කර කර ඉන්න වෙයි. මේ තැන ඩෙංගු මදුරුවෝ බෝ කර කර ඉන්නවට වඩා හොඳයි අපි එවැනි දෙයක් කරන එක. ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(39)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අද අපි මේ සභාව නියෝජනය කරන දවසේ මෙය ජාතික මට්ටමේ ප්‍රශ්නයක් වුනත් මෙය අපේ මොරටුවේ ජනතාවටත් බලපානවා. බස් ගාස්තු අද දින ඉහළ නැංවෙනවා 12% න්, එයට හේතුව ලෙස මම දකින්නේ තෙල් මිල ඉහළ යෑම. ලෝක වෙළඳ පොළේ තෙල් මිල ඉහළ යාමට සාපේක්ෂව අපේ රජය මැදිහත් වෙලා ගන්න ඇනවුම් කරන තෙල් වල මිල වැඩි. ඒ මිලට ගැනීම ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. අපි ඉතිහාසයේ පළමු වතාවට තමයි කිලෝමීටර් 100 වැඩි දුර ගමනක් යන මනුස්සයෙකුට රුපියල් 5000ක් දක්වා ගණන් යනවා ටිකට් එක. එවැනි තත්ත්වයකට මේ අවස්ථාවේ මිනිස්සු මුහුණ දීලා තියෙනවා. මොරටුවේ ජනතාවගෙන් කිහිප දෙනෙක්ම ඉල්ලීමක් කරා මේ ගැන සඳහන් කරන්න කියලා. අපි මේ සභාවේ කතා කරන්නේ අපේ මොරටුවේ ජනතාව වෙනුවෙන්. ඒ වගේම මේ දවස් වල ගොවීන් ලොකු ගැටළු රාශියකට මුහුණ දීලා ඉන්නවා. ඔවුන්ට පොහොර ටික වෙලාවට ලැබෙන්නේ නැහැ. වී ටික අලෙවි කරගන්න විදිහක් නැහැ. එහෙම තිබියදී වෙනත් රටවල් වලින් සහල් ගෙන්නනවා. ඉතින් මෙවා අපිට ප්‍රශ්න බවට පත් වෙලා තියෙනවා. ගොවීන්ගේ සහල් ටික රාජ්‍ය සේවකයින්ට ලිහිසිං ක්‍රමයට ලබදෙන්න කියලා සමහර මන්ත්‍රීවරු විහිළු සපයනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ එදා ගොවීන් වෙනුවෙන් කතා කරපු අය අද එහෙම කතා කරන්නේ නැහැ. රාජ්‍ය සේවකයා එදා මේ ආණ්ඩුව බලයට ගේන්න විශාල වැඩ කොටසක් කරා. එදා ප්‍රතිඵල ගණන් කරදදි රෝයල් එකේ රාජ්‍ය සේවකයෙ ඔබතුමන්ලා ලබන ජයග්‍රහනය සම්බන්ධයෙන් සතුට සමරන්න අත්පොළසන් දීලා විශාල වශයෙන් ප්‍රීති වුණා. අද ඒ අයට ඉතාමත් අපහසයට ලක් කරන වැඩ කොටසක් තමයි අද සිදු වෙන්නේ. එ ගැන අපි ඉතාමත් කණගාටුවට පත් වෙනවා.

**03(40)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ දින වල නව ගාලු පාර අපි මැදිහත් වෙලා සුද්ධ කරගෙන යනවා. එක හොඳ වැඩක් අපි ඒක අගය කරනවා. අපි මේ ගාලු පාරේ යනකොට පේමන්ට් එක අඩි 20ක විතර විශාල ප්‍රමාණයක් තියෙනවා. මේ මහා මාර්ග නිර්මාණය වෙනකොට ඒ ඉඩම් හිමියන්ට ඔවුන්ගේ ඉඩම් පරිත්‍යාග කරන්න සිදුවුනා. ඔවුන්ට යම් ප්‍රමාණයන්ට සීමා වෙන්නට සිදුවුනා. ඔවුන් ව්‍යාපාර කරන්නේ ඒ සීමාවන් වල පසුගිය කාල වලදි ඒවා නැති වුනා. ඔබතුමා සමඟ වගේම හිටපු නගරාධිපතිවරයා සමඟ අපි ෆයිට් කරලා මිනිස්සුන්ට ඒ අවස්ථාව ලබා දුන්නා. මොකද ඒ අයට තමන්ගේ ව්‍යාපාර කරගෙන යන්න ඉඩක් නැහැ. ඔවුන්ගේ ඉඩම් පාරට ගිය නිසා. අපි පොලීසිය හා දේශපාලනය සමඟ කතා කරලා පේමන්ට් එක අවහිර නොවෙන විදිහට ඒ අවස්ථාව ලබා දුන්නා ඔවුන්ගේ භාණ්ඩයක් ප්‍රදර්ශනය කරගෙන අලෙවිකර ගන්න. ඔබතුමා මේ සමාජයේ ඉන්න

කෙනෙක් වශයෙන් මේ සම්බන්ධයෙන් දන්නවා. පුළුවන්නම් මේ සඳහා මැදිහත් වෙලා ඔවුන්ට ඒ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

03(41) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඩෙංගු වර්ධනය විශාල වශයෙන් වැඩි වෙලා තියෙනවා. ඔබතුමන්ලා සියළුදෙනා මේ දවස්වල ඒ සඳහා වැඩ කටයුතු කරගෙන යනවා. නමුත් මෙය ප්‍රමාණවත් නැති බවක් තමයි අපිට පෙන්නේ. දැනට ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 60000ක් පමණ වෙලා තියෙනවා. මරණ සංඛ්‍යාව 40කට වඩා වැඩි වෙලා තියෙනවා. අපි පහුගිය කාලයේ දැක්කා ජනාධිපතිවරයා ක්ලිනින් ශ්‍රී ලංකා කියලා වැඩසහටනක් ගෙනාවා. අද අපිට කියන්න තියෙන්නේ අද ඒ වැඩ සටහන ආසාර්ථකයි කියලා තමයි. එක හරියට සිදුවුනානම් අද ඩෙංගු තියෙන්න විදිහක් නැහැ. ඒ නිසා ඒ සඳහා වෙන් කරපු මුදල් අපරාදේ කියලා තමයි අපි කියන්නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් රිලව් ගණන් කරන්න කොටි ගණන් වියදම් කරා. ඒ වගේම තමයි මේ වැඩසටහනත් සාර්ථක නැහැ. ක්ලිනින් ශ්‍රී ලංකා කියලා වැඩසහටනේ ප්‍රචාරණ කටයුතු සඳහා විශාල මුදලක් වැය කරා. ඒ සල්ලි අපරාදේ. මීට වඩා ක්‍රමවත් වැඩපිලිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, සර්ව ජන බලය පක්ෂයේ පළාත් පාලන මන්ත්‍රී සංසදයේ සභාපතිවරයා වශයෙන් මා තේරීපත් වීම වශයෙන් මා හට සුභ පැතුම් එක්කල සියළුදෙනාට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අපි හැමදාම මේ ගැන කතා කරනවා.අපිට දීලා තියෙන තත්ත්වය තේරුම් අරගෙන ලිඛිතව හරි වාචිකව හරි කෙටියෙන් කමක් නැහැ. අපි උත්සාහ කරනවා දෙක වෙනකොටවත් මේ සභාව අවසන් කරන්න. ඒ නිසා කෙටියෙන් ඉදිරිපත් කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් යටතේ වාචික පෙත්සමක් ඉදිරිපත් කරනවා. ප්‍රථමයෙන්ම හිටපු ජ්‍යේෂ්ඨ මන්ත්‍රී, එම්. ප්‍රියනාත් මෙන්ඩිස් මහතා පොදුජන එක්සත් පෙරමුණේ නාගරික මන්ත්‍රීවරයා විදියට අද සභාවේ අසුන්ගෙන තියෙනවා.එක්සත් ජාතික පක්ෂය විදියට එතුමාට අපේ මන්ත්‍රී කණ්ඩායම වෙනුවෙන් සුභාශිංසනය මේ අවස්ථාවේ පුදකරන්න ඕනා.

ඒ වගේම සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමාගේ මෑණියන් සඳහටම සමුගත්තා. ඒ වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමේ ශෝකයත්,එතුමා ඇතුලු පවුලේ සියලු දෙනාටම අපේ ශෝකය පල කරනවා. මාධ්‍යවේදී රේඛා තරංගනී මහත්මිය අසනීප වී සිටියා. අද දිනයේ සභාවට ඇවිල්ලා තියනවා. එතුමියට සුබ පතනවා නීරෝගීව ඉදිරියට වැඩ කරන්න කියලා. ඒ වගේම සර්ව ජන සංධානයේ හිටපු උප නගරාධිපතිතුමා පක්ෂයේ පලාත් පාලන සංසදයේ සභාපති වෙලා තියනවා. එතුමාටත් අපේ එක්සත් ජාතික පක්ෂය තුලින් සුසාශිංසන පල කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ නායකත්වයෙන් විශේෂ ඩෙංගු මර්ධන වැඩ සටහනක් ග්‍රාමීය මට්ටමෙන් ගිය සතියේ ආරම්භ කරා. කලා. කමිටු හදන්න. අපේ වෛද්‍යවරු වගේම කොමසාරිස්තුමා ලේකම්තුමා ප්‍රමුඛව කටයුතු කරා. කල්දමුල්ල කොට්ඨාශයේ කමිටුව හැදුවා. ගිය සෙනසුරාදා අපි ගෙයින් ගෙට ගිහිල්ලා ඩෙංගු මර්ධන වැඩසටහන වෙනුවෙන් නිවාස පරීක්ෂණයට ලක්කලා. මේ වෙනකොට රට තුල විශාල ඩෙංගු අවධානමක් තියනවා. මොරටුවත් ඩෙංගු

අවධානමකට ලක්වෙල තියනවා. ගරු නගරාධිපතිතුමනි, ඒ නිවාස වලට අපි යනකොට විස්තර පත්‍රිකාවක් ලබාදෙන්න අවශ්‍යයයි. සභාවෙන් විස්තර පත්‍රිකාව ලබාදෙන්න අවධානය යොමු කරන්න කියලා ඔබතුමාට කියනවා.ඒ වගේම තමයි අයිතිකරු නැති හිස් ඉඩම් තියනවා.ඒවාට දැන්වීම් පුවරුවක් හදන්න ඕනා නිර්නායකයක් දාලා නීතිමය පියවර ගන්නවා කියලා බැනර් ටිකක් සකස් කරනවානම් හොඳයි කියලා මම කියනවා.

ඒ වගේම ප්‍රධාන නාගරික ගණකාධිකාරීතුමිය වසර ගණනාවක්ම අපිත් එක්ක කටයුතු කරා.එතුමිය මාරුවීමක් වෙලා අද උත්සවයකුත් තියනවා.එතුමිය අපේ නගර සභාවට සේවය කරා වගේම අලුත් සේවා ස්ථානයෙත් සේවය කරන්න කියලා සුභ පතනවා.

ගරු නගරාධිපතිතුමනි, මේ කාලයේ ඩෙංගු රෝගය වගේම වෙනම උණ රෝගයක් මුළු රට පුරාම පැතිර යනවා. මොරටුව මහා නගර සභාවක් විදියට අපිටත් වගකීමක් තියනවා ඩෙංගු රෝගය වගේම උණ රෝගයට සභාවක් විදියට ඉදිරියට ගන්න පුලුවන් පියවර සොයා බලා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, ගොලුමඩම හන්දියේ කල්දෙමුල්ල පාර මාර්ග සංවර්ධන අධිකාරියට අයිතියි. නමුත් මොරටුව ආසනය බෙදෙන්නෙ එතනින්.ඒ පාරේ විශාල ලෙස මිනිසුන් සහ වාහන ගමන් කරනවා. මේ පාරෙ යන්න බැහැ.මේ පාරෙ යන්න බැහැ වාහන කැඩෙනවා.තාක්ෂණ නිලධාරීතුමියත් එක්ක කතා කරාම පාර හදන්න වර්ෂය අවසානය වෙනකන් ඉන්න වෙනවා කිව්වා.ඒ පාර කාපට් දමා සංවර්ධනය කරදෙනන් කියලා ඉල්ලනවා.

නගරාධිපතිතුමනි, මම සොයිසාපුර ප්‍රජාශාලාවෙ උත්සවයකට ගියා.වැසිකිලි වලවල් පිටාර ගලනවා.ස්ටේජ් එකේ පිටුපස තෙමෙනවා.ඒ ගැන අවධානය යොමු කරන්න කියල් මම ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,විශේෂයෙන්ම ජනතා අප්‍රසාදයන් කිහිපයක් තියනවා අප වෙත දැනුම්දෙන.ඒවා වාචික පැමිණිලි විදියට තමයි එදිනෙදා යොමු වන්නේ.ඩෙංගු වසංගතය කොළඹ දිස්ත්‍රික්කයේ හැටදාහක් දක්වා වැඩිවෙලා තියෙනවා.විශේෂයෙන්ම කියන්න ඕනා දෙයක් තමයි ඔබතුමන්ලා වෙනස්ම ක්‍රමවේදක් අනුගමනය කරනවා සෞඛ්‍ය කමිටුව හරහා.කලින් අපිට සාමාන්‍යයෙන් කරගත හැකි වැඩ ටිකක් තිබුනා.අපි මන්ත්‍රීවරුන් විදියට හැමදාම ඉල්ලීම් කරනවා.ඉල්ලීම් වලට ප්‍රතිචාරයක් නැහැ.විශේෂයෙන්ම සේවකයින්ගෙන් ඇහුවාම කියන්නේ අහවලා හරහා විතරයි වැඩ කරන්න පුලුවන්.දැන් කතා කරලා වැඩක් නැහැ අපිට බලතල නැහැ.මම හිතන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක හැරුනහම අනෙක් ඔක්කොම ඔබතුමාලගෙ බලය යටතේ තමයි තියෙන්නෙ.ඒක ඉතාම වැරදි ක්‍රමවේදයක් තුල ඔබතුමන්ලා ගමන් කරනවා මම හිතන්නේ.පරිපාලනය තුල බලය විමධ්‍යගත කරන්න.ඕනා.ඔබතුමන්ලා සෞඛ්‍ය අංශයේ බලය විමධ්‍යගත කරන්න.අදාල අංශවල ප්‍රධානීන්ට වැඩ කරන්න අවස්ථාව දෙන්න.මේ සෞඛ්‍ය අංශයේ අපිට වැඩක් කරගන්න ඉතාම අමාරුයි.ඩෙංගු වසංගත උවදුරට ලක්වෙලා තියෙන්නේ ඔබලගෙ තියෙන කළමනාකාරීත්වයේ වරදක් නිසා.ඔබලා බලය තදින් අල්ලගෙන තියනවා ලබන පාර ජන්දෙන් දිනන්න තමන්ගෙ වැඩපිළිවෙල කරන්න.අහවල් දිනය වෙන් කරලා තියනවා අහවල් මන්ත්‍රීට.අද මොනදේ ආවත් කරන්න බැහැ.අද අහවල් මන්ත්‍රීගෙන් විතරයි.අහවල් මන්ත්‍රී යනවා.එක්ස් කියන මන්ත්‍රී ගිහිල්ලා ගමට වැඩ කරද්දී එක්ස් මන්ත්‍රී කැමති පුද්ගලයන් ඉන්න පාරවල් විතරයි එක්ස් මන්ත්‍රී සුද්ධ කරන්නෙ.එක්ස් මන්ත්‍රී හිතනවා එයාට ජන්දෙ දුන්නා ප්‍රදේශයේ

පුද්ගලයො විතරයි මට ඉන්නෙ.අනෙක් කණ්ඩායමට වෙන්නෙ ජන්දෙ දුන්න අයට ලොකු හානියක්.බලය විමධ්‍යගත නොකල හොත් ඔබ කරගන්න ලොකුම මෝඩකමක්.සේවකයා කියන්නෙ එතන ප්‍රධානියා.මන්ත්‍රී නවකයො,විවිධ කණ්ඩායම් මෙතන ඇවිල්ලා ඉන්නවා.හැබැයි අර පුද්ගලයන්ට තියෙන පරිපාලන දැනුම අවශ්‍යතාවය ඔබේ මන්ත්‍රීට වඩා දන්නෙ ආයතන අංශ වල ප්‍රධානීන්.ඒ ප්‍රධානීන්ව යට ගහලා මේ මන්ත්‍රීවරයා උඩට ඇවිල්ලා මේ කරන විනාසය තමයි ඩෙංගු වසංගතයක් බවට පත්වෙලා තියෙන්නෙ මුළු කොළඹ දිස්ත්‍රික්කයම කියලා කියන්න ඕනා.ඔබේ මන්ත්‍රීවරයාගේ බලය අයථා විදියට පරිහරණය කිරීම තුලින් ඩෙංගු වසංගතය අද ලංකාව පුරාම දීප ව්‍යාප්ත වෙනවා ඔබේ පරිපාලනය තුල සිදුවන දුර්වලතාවයත් තමයි ඒකෙන් ප්‍රකාශ කරන්නෙ ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය අංශ ප්‍රධානීන් කියන්නෙ අපිව ගෙටගහලා තියෙන්නෙ අපිට වැඩකරන්න දෙන්නේ නැහැ.ඒ පුද්ගලයින්ව හිර කරලා ඔබලා කරන විනාසය තමයි අද ඩෙංගු වසංගතය බවට කොළඹ දිස්ත්‍රික්කය සහ බස්නාහිර පලාත ව්‍යාප්ත වෙලා තියෙන්නෙ කියලා මම ප්‍රකාශ කරන්න කැමතියි.

ගරු නගරාධිපතිතුමනි,සුරපුරයක් කරන්න ආවා.පොහොසත් රටක් අවුරුද්දක් යනකොට තුන්වේල කාලා බීලා හොඳට සැප සම්පත් විඳින්න පුලුවන් වෙයි කියලා හිතුවා නගරාධිපතිතුමනි, හැබැයි අද වෙනකොට පෝසත් රටක් කියන සංකල්පය පස්ස දොරෙන් පැනලා ගිහිල්ලා තියෙන්නෙ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,දැන් තියෙන්නේ න්‍යාය පත්‍රයේ පෙත්සම් පැමිණිලි අයිතමය.මහා ලොකු කතන්දර ගොඩාක් මේ සභාවට කිව්වට අඩුම තරමේ ඔබතුමියට ඉදිරිපත් කරන ආකාරය දැනුවත් නැහැ.ඔබතුමියට කේන්තියක්,වේදනාවක් ඇති.හැබැයි මම කියන්නේ ඉදිරිපත් කරන විලාසය ගැන.ඔබ කරන ප්‍රකාශයම හැම මන්ත්‍රී කෙනෙක්ටම තියනවා.ඩෙංගු මර්ධන වැඩ කරමින් ඉන්නවා.ඔබතුමිය විවේචන ඉදිරිපත් කරාට මම විරුද්ධ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මට මේ ප්‍රශ්න විසදගන්න බැරිනම් මහා සභාවට ප්‍රශ්න ගේන්න ඕනා නගරාධිපතිතුමනි, ඉදිරිපත් කරන ප්‍රශ්න ඔබතුමාට ඇහුන්කම් දෙන්න පුලුවන් කමක් තියනවානම්, මොකද අපිට මේවා විසදගන්න බැරි නිසා තමයි මේ ප්‍රශ්න ගේන්නෙ. අපිට මේ ප්‍රශ්න මහා සභාවට ඉදිරිපත් කරන්න අයතියක් නැද්ද කියලා කියන්නකො.

ගරු නගරාධිපතිතුමනි,ජල ප්‍රශ්නය කියන එක අත්‍යාවශ්‍ය කාරනයක්නෙ.ඔබ නගරාධිපති වදියට ඔබේ වගකීමක් ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන එක.ඔබතුමා ජල ප්‍රශ්නය විසදන්න.මොකක් හරි ක්‍රමවේදයක් හදන්න.අපි අපහසුතාවයට පත්වෙලා තියනවා.එතකොට කේන්ති යනවා කාට වුනත්. මට විතරක් නෙමෙයි.මට මිනිස්සු බනිනිකොට මේ වැඩේ කරන්න නැහැ කියලා.අපි හැමෝටම ප්‍රශ්න.ඔබතුමා මේක පිළිගන්න .ඔබතුමා අකැමැති වුනත් අපිට මේක මහා සභාගත කරන්න අවශ්‍යයයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මටත් ඔබට තියෙන වුවමනාව තියනවා. මේ වැඩ කරන්න ගියාම ඉතාමත්ම දුෂ්කරතාවලට මුහුණ දෙන්න වෙනවා. ඩෙංගු කීටයො දිනකට සෑහෙන ප්‍රමාණයක් හොයා ගන්නවා. මගේ සේවකයො නිලධාරීන්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මන්ත්‍රී කණ්ඩායම්, පොදු ජනතාව මේ හැමදෙනා වෙනදාට වඩා වුවමනාවකින් මේ පිළිබදව මැදිහත්වීමක් තිබෙනවා. රට

පුරාම ඩෙංගු වර්ධනයක් තිබෙනවා. මොරටුවටත් යම් මට්ටමක වර්ධනය වෙලා තිබෙනවා. එකිනෙකා අතර තිබෙන කෑ ගැසීම් වලින් උත්තර ලැබෙන්නෙ නැහැ. හරියට ප්‍රශ්නය අල්ලගෙන හරියට ඉදිරිපත් කරමු. ඒකෙ ඇතුලෙ දේශපාලනය තියාගන්න. එතනට ගියොත් අපිට සභාවක් ලෙස විසඳුමක් හොයාගන්න පුලුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පසුගිය දවස්වල ඔබතුමාගේ උපදෙස් මත පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්, අපේ කොට්ඨාශයේ මන්තීවරුන් සියලුම දෙනා එකතු කරගෙන ජනතාව දැනුවත් කිරීමේ සංචාරයේදී ඔබතුමාට ස්තුතිය පලකරන්න කියලා ජනතාව ප්‍රකාශ කරා.මා යෝජනාවක් විදියට අද දවස තුල මුළු සභාවම කතා කලේ ඩෙංගු පැතිරවීම,අසිමිත වීම මොරටුව නගර සභාව වගකිවයුතුයි කියන වාගේ අදහසක්.මම මේ සම්බන්ධයෙන් කණගාටු වෙනවා.අපි ප්‍රතිපත්තියක් ලෙස ආරම්භයේ සිටම පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් කරගෙන ගියා.ඒවා ප්‍රමාණවත් නැති වෙන්න ඇති හැබැයි පසුගිය මාසවල ඇති වෙච්ච වර්ෂා තත්ත්වය නිසා ඇතිවෙච්ච විශාල ජල ඒකරාශීවීම් මේවා අසාමාන තත්ත්වයක්.මොරටුව වගේ ප්‍රදේශවලට මිලිමීටර් එකසිය ගණන් වහිනකොට මේක ඉතිහාසයේ මෑත කාලයේදී සිද්ද නොවිච්ච දෙයක්.අපේ කාණු පද්ධති ප්‍රමාණවත් වුනේ නැහැ.දරාගන්න බැරුව ගියා.මේක මුළු රටටම බලපාපු තත්ත්වයක්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,මේ සභාවේ මම උත්සාහ කරන්නෙ න්‍යාය පත්‍රය ඇතුලෙ විදිමත් බවකින් කැදවගෙන යන්න. මූලාසනයටනෙ වගකීම.ඩෙංගු වල විවාදයක් නැහැ. අරෙහෙන් ප්‍රශ්න ඉදිරිපත් කරනවා මෙහෙන් උත්තර දෙනවා. එහෙම කරන්න පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ බැහැ.මේ අවස්ථාව තියෙන්න ඔබේ තියෙන පෙත්සම පැමිණිල්ල ලිඛිතව හෝ වාචිකව කෙටියෙන් ඉදිරිපත් කරනවා.නැත්නම් භාරාදෙනවා. නැත්නම් වෙන්නෙ හැමකෙනාටම මේ අවස්ථාව පාවිච්ච කරොත් න්‍යාය පත්‍ර ඕන නැති වෙනවා.න්‍යාය පත්‍ර හදලා තියෙන්නෙ අපිම නෙමෙයි.දීර්ඝ කාලයක් තිස්සෙ න්‍යාය පත්‍ර සකස් කරමින් සභාවක් පවත්වාගෙන යන්න ඕන කරන ක්‍රමයටනෙ.මේකට අපි අනුගත වෙමු.ආණ්ඩු පක්ෂයද විපක්ෂයද කියලා නෙමෙයි.මට හොද අහගන්නම නෙමෙයි.මට ඕනා මම මෙතනින් යනකොට යම් මට්ටමකට හදන්න උත්සාහ කරපු මිනිහෙක් කියලා අහගන්න තිබුනනම් ඇති. කෙටියෙන් ඔබේ අදහස කියන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මම අදහස් කරේ.අපි පැය දෙකහමාරක තුනක කාලයක්ම පාවිච්චි කලේ. මේ අසීරු තත්ත්වය තේරුම්ගත්තෙ නැති බොහෝ දේවල්නෙ කතා කළේ වොල්වැකියා ව්‍යාපෘතියක් දැනට ක්‍රියාත්මක වෙනවා මිලියන අටසියයක් වෙන්කරා. අවුරුදු එකහමාරක් ඇතුලත සදහටම ඩෙංගු තුරන් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරලා තියෙන්නෙ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම්, පැමිණිලි යටතේ මට පැමිණිලි දෙකක් තියනවා ඉතා කෙටියෙන් ඉදිරිපත් කරන්න. නො:15/6, මේජර් ශවේන්ද්‍ර ප්‍රසාද් වික්‍රමරත්න මාවත, රාවතාවත්ත, මොරටුව. මහේෂ් විජේසිංහ මහතා සහ එම පාරේ ජීවත් වන විජිත ප්‍රනාන්දු, අසේල ප්‍රනාන්දු, සී. ඩී. අනුර, එම්. කේ. සී. සිල්වා, ඩිනාරා ද අල්විස් කියන අය අත්සන් කරලා තමයි මේ ලිපිය ලබාදීලා තියෙන්නේ. කුඩුවාමුල්ල ප්‍රදේශයේ පවතින දැඩි ගංවතුර තත්ත්වය වැලැක්වීමට කඩිනම් පියවර ගන්න කියලා මේ ලිපියේ සදහන් වෙනවා. එහි සදහන් වෙනවා පසුගිය ජුනි මස දහතුන්වන දින අලුයම ඇද හැලුණු වර්ෂාව හේතුවෙන් අප ප්‍රදේශයේ නිවාස හයක් පමණ දැඩිලෙස

ජලයෙන් යටවී එහිදී මගේ නිවස අඩි එකහමාරක් පමණ ජලයෙන් යටවූ අතර,අසල්වැසි නිවස අඩි හතරක් විතර මට්ටමට යටවී හදිසි ගං වතුර තත්ත්වයක් ඇති වීමට හේතුවුනා.ඒ අනුව අදාල දේපල සහ නිවාස හානි සිද්ද වුනා. එබැවින් මේ පිළිබඳව සොයා බලා මහා නගර සභාවේ ඉංජිනේරු අංශයට සහාය ලබාදෙන ලෙසත්, අවහිර වුනු කාණු පද්ධතිය සුද්ද කරදෙන ලෙසත් ලිපියක් ඉදිරිපත් කරලා තියනවා.මම එම ලිපිය සභාගත කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ජනතාවගෙ ඉල්ලීමක් තියනවා.මොරටුව නගරය කලාප වලට වෙන් කරලා සුද්ද කිරීම් කටයුතු කරගෙන යනවා.හැබැයි මේක විධිමත්ව සිද්ද වෙන්නෙ නැහැ කියලා ජනතාවගෙන් පැමිණිලි ලැබෙනවා.ජනතාවගෙ ඉල්ලීමක් තියනවා මේක මොරටුව වෙබ් සයිඩ් එකේ න්‍යාය පත්‍රයක් දාන්න කියලා. හරි ලිපියක් ඉදිරිපත් ඉදිරිපත් කරනන් කියලා.උදාහරණයකට මොරටුවේ කලාප විසිනමයක් තියනවා.මගේ කලාපය මොරටුමුල්ල උතුර නම් මේක කවදාද සුද්ධ කරන්නෙ කියලා අපි දන්නවා.එතකොට අපි දන්නවා දිරින කුණු,නොදිරන කුණු ගෙනියන දවස් වෙන වෙනම දීලා තියනවා.නමුත් ඉස්සර නම් ෂෙඩුල් එකක් හදලා ගමේ බෙදුවා. ඒක කාලයක් තිබුනා.තව ඉල්ලීමක් තියනවා.සුද්ධ කිරීම සම්බන්ධයෙන් අපි ඉල්ලීම් කලාම සුද්ද කරන්නෙ.මම සහ ජනතාව ඉල්ලීමක් කරනවා.තමාගේ කොට්ඨාශය පිරිසිදු කරන කාල සටහන කරුණාකරලා සමාජ ජාලා වල පල කරන්න කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා, පැමිණිලි, පෙත්සම් යටතේ වාචික පැමිණිලි තියනවා. සොයිසාපුර විශාල ගෙවල් ප්‍රමාණයක් තියන ගම්මානයක්.ඒකෙ කාණු පද්ධතියට සම්බන්ධව පොදුවේ ගත්තම එකින් එකට අපිට කියන්න බැහැ මේ කාණුව කියලා.පොදුවේ ඒගම්මානය පිරිසිදු කරන්න කියලා ඔබේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.එගොඩඋයන දකුණ මෝදර මුස්ලිම් දේවස්ථානය පාරේ කාණුවක් තියනවා.කවදාවත් ඒක සුද්ද කරන්න බැහැ.මම ගිය සැරේ රංගන මන්ත්‍රීතුමත් කමිටුවේ ඉන්නකොට මම කමිටුවට ඉදිරිපත් කරා.පාරෙන් එහාට වතුර බහින්නෙ නැහැ කියලා මේක කරන්න බැහැ කියලා නැවැත්තුවා.ඊට පස්සෙ පිරිසිදු කරේ නැහැ.අපිට එකින් එකට කියන්න බැහැ.අපි දන්නවා කොට්ඨාශයේ කොච්චර පාරවල් තියනවාද?කොච්චර කාණු තියනවාද කියලා.මන්ත්‍රීවරු දැනුම්දෙන්නනම ඕනා නැහැ මේ ටික පිරිසිදු කරන්න.කලාපයේ සෞඛ්‍ය කණ්ඩායමක් ඉන්නවා. ඒගොල්ලන්ට පුලුවන් ඒවා සුද්ධ කරන්න.මේක පොදු රාජකාරියක්.ඒකට අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, විපක්ෂනායකතුමා ඉදිරිපත් කරා වෝටර් සම්ප් එක ගැන.අපිට සම්ප් දෙකක් තියනවා.ඉස්සරනම් කාට වතුර නැති වුනත් සොයිසාපුරටනම් වතුර තිබුනා.දැන් වතුර ලැබෙන්නේ නැහැ.වතුර එන ප්‍රමාණයත් අඩු වෙලා තියනවා.ඉදිරියට එන්න තියෙන එන්ඩීමෝ තත්ත්වය මත ඔබගේ අවධානය යොමු කරන්න කියලා.මහල් නිවාසයේ උඩ තට්ටුවේ ඉන්න අයට වතුර ගෙනියන්න තැනක් නැහැ. අපිටත් ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී -ඩබ්. ඒ. ඩී.බ්‍රෙන්ඩන් එච්. ක්‍රිස්ටල් කාන්ත මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල පළමුවන පටුමගේ අදත් ඩෙංගු රෝගීන් දෙන්නෙක් වාර්තා වෙලා ඔවුන්ව රෝහල්ගත කරලා තියනවා. පළමුවන පටුමගේ කාණුව අපවිත්‍ර වෙලා තියන නිසා එම කාණුව සුද්ධ කරලා දෙන්න කියලා සහ දුමායනය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, මාස කිහිපයකට කලින් ධිවර නිවහන් පෙදෙසෙ වතුර බට දාන්න ජල සම්පාදන මණ්ඩලයෙන් පාර කැපුවා.පාර කඩනවාට මොරටුව මහා නගර සභාව ජල සම්පාදන මණ්ඩලයෙන් මුදලක් අය කරනවා.එහෙම වුනත් තවමත් පාර යථා තත්ත්වයට පත්කරලා නැහැ. එම පාර ඉක්මණින් යථා තත්ත්වයට පත්කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, මොරටුව කොරළවැල්ල දකුණේ කණුව ලග විද්‍යාල මාවතේ ආරම්භයේම අපේ මාතෘ සායනය තිබෙනවා. ඒ මාතෘ සායනයට යාබදව දන්ත සායනය තියනවා. මේ දන්ත සායනය වසර ගණනාවක් පුරාවටම කොරළවැල්ල ප්‍රදේශයට පමණක් නෙවෙයි, කටුකුරුන්ද එගොඩඋයන, මොරටුවැල්ල ප්‍රදේශ වල ජනතාවට විශේෂ සේවයක් සපයපු දන්ත සායනයක්. කියන්න කණගාටුයි. මම දවස් කිහිපයකට කලින් ගියාම දන්ත සායනය වහල දාලා. එහි සිවිලිම ගලවලා දාලා. එම දන්ත සායනයේ වටිනා කියන උපකරණ දූවිලි වැදි තිබෙනවා. සාමාන්‍යයෙන් දන්ත සායනය සේවා සපයන දිනවලදී දිනකය පුද්ගලයන් දහයක් විස්සක් ප්‍රමාණයක් ඇවිල්ලා දන්ත සායනයෙන් සේවය ලැබුවා. හැකි ඉක්මණනි මේ දනත් සායනය ජනතාවට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ජූනි අටවන දින උදේ නමයට ආර්ජී 9805 දරණ කසල අදින ටැක්ටරයේ රෝදයේ පැච් එකක් ගියාම.එතන සිටින සේවකයො මහා නගර සභාවේ ගරාජයට දාලා රෝදයේ පැච් එක දාලා ටැක්ටරය ලබාදෙන්නේ හවස තුනහමාරට.මේක තමයි ඔබතුමන්ලගෙ අකාර්යක්ෂම පාලනය.

ගරු නගරාධිපතිතුමනි, මේ දවස්වල ඩෙංගු වලින් මොරටුව වැහිලා තියෙන්නෙ.පසුගිය දිනක කොරළවැල්ලෙ අත්පත්‍රිකා බෙදලා තියනවා.මේ අත්පත්‍රිකාවෙ තියනවා දෙදහස් විසිහය ජූනි මස පස්වන ඉරිදා දින උදේ නවයෙ සිට අපි එනවා කසල ගෙනියන්න.ඔබේ වත්ත පිරිසිදු කොට පොල්කටු,පොලිතින්, ප්ලාස්ටික්, මැටි භාණ්ඩ, වීදුරු,පෝසිලේන් භාණ්ඩ වෙන්කර උරවල දමා ගෙදර ඉදිරිපිට තියන්න කියලා සදහන් වෙනවා.කියන්න සතුටුයි කොරළවැල්ල බටහිර ජනතාව ඒ ආකාරයෙන්ම කටයුතු කරනවා.ආසිරි පෙදෙස,ටකරන් මාවත ජනතාව සියලුම කුණු බෑග් වලට දාල පාරෙ තියනවා.කියන්න කණගාඩුයි.කුණු ටැක්ටරය ආවට කුණු ගෙනියන්නනෙ නැහැ.මුලින් කියනවා සියලුම කුණු ගන්නවා කියලා.හැබැයි පාරට දැම්මට පස්සෙ ඒ කුණු බාරගන්න එක ප්‍රතික්ෂේප කරනවා.ඒ වගේම තමයි නගරාධිපතිතුමා මේ තියෙන්නේ ඒ කුණු වල පිංතූර.දැන් ගියොත් ආසිරි පෙදෙස බලාගන්න පුලුවන් කුණු ටික.

ගරු නගරාධිපතිතුමනි, මහවිදාන මාවතේ එෆ්එන්ජී දේපල වෙළද සමාගමට අයත් පෞද්ගලික ඉඩමක් තියනවා.ඒ ඉඩමට කුණු ටැක්ටර් හතරක් පහක් පමණ හලනවා.මම දන්නෙ නැහැ ඔබතුමන්ලා මේ සමාගමට යම්කිසි ගෙවීමක් කරනවාද නැත්නම් අවසරයකින් තොරව දාලාද කියලා.මේ ඉඩමේ ඉරිදා දවසක නගර සභාවේ බැකෝ යන්ත්‍රය ඇවිල්ලා වලක් හාරලා කුණු වල්ලනවා.මේ ඉඩම නගර සභාවෙන් කුලියට හෝ බද්දට අරගෙන තියනවානම් කමක් නැහැ.අනවසරයෙන් කරලා තියනවානම් ඒ පිළිබද පොඩ්ඩක් හොයලා බලන්න.මොකද කොරළවැල්ලේ ජනතාවගේ කුණු එකතු කරලා නැවතත් දාලා තියෙන්නේ කොරළවැල්ලේ පෞද්ගලික ඉඩමක.තාමත් කුණු ටික එතන මදුරුවො බෝ වෙනවා.නගර සභාව ඉන්නෙ මදුරුවො බෝ කරන්න නෙමෙයි.මදුරුවො බෝ වෙන එක වලක්වන්න.මොන දේ වුනත් විශේෂයෙන් අපි ස්තුතිවන්ත විය යුතුයි එදා වැඩ කරපු සේවකයන්ට.පසුගිය ඉරිදා දින මං හිතන්නෙ සේවකයො වැඩ ඉවර වෙද්දි රාත්‍රී නමයට විතර ඇති.වෙලාව බලන්නෙ නැතුව සේවකයො වැඩ කරා.වැඩ කරපු තැන හිටපු නිසා තමයි මම දැක්කෙ ටැක්ටර් රථවල හෙඩ් ලයිට් වැඩ නැහැ.හෝන් එක වැඩ නැහැ.

ටැක්ටර් රථ ටික රාත්‍රියේ වැඩ කරේ හෙඩ් ලයිට් නැතුව.එදා මොකක් හරි අනතුරක් වුනානම් කවුද මේකට වගකියන්නෙ.

__ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා__

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මන්ත්‍රීතුමනි,ඒ වත්තෙ විශාල කුණු ගොඩක් තිබුනා.ඒක සම්පූර්ණ සුද්ධ කරා.ඔබ දන්නවා කරදියාන වත්තට කුණු දාන එක කොච්චර අමාරුද කියලා.බොහොම අමාරුවෙන් තමයි ලෝඩ් එකක් වැඩිපුර ඉල්ලා ගන්නෙ.අපි කොහොමහරි කළමනාකරණය කල යුතුයි. දැන් එන්නෙම කලවම්.ඒක නිසා අපි උස්සාහ කරනවා භූමියක කොහොමහරි කුණු වළලන්න.මේක කරා කියලා භූමියේ අගය අඩු වෙන්නෙ නැහැ.මේ වෙලාවෙ ඔබ මතු කරන ඩෙංගු මර්ධන කටයුතු වෙනුවෙන් ඒක කළ යුතුයි.පත්‍රිකාවෙ අඩුපාඩුවක් තිබුනා.මම ඒක පිළිගත්තා.මෙහෙම කටයුතු කරන කොට අදාල අඩුපාඩුකම්,අත්දැකීම් අඩුකම නිසා මෙහෙම අඩුපාඩු තියෙයි.හැබැයි ඔවුන්ගෙ උවමනාව ඩෙංගු මර්ධනය කරගන්න.පක්ෂ විපක්ෂ භේදයකින් කියන්නෙ අපි කවුරුත් උදවු කරමු.දේශපාලනයේදී ඒ අවස්ථාව ගන්න.අපේ අරමුණ අවංක එකක් නම් මිනිසුන්ගෙ ජීවිත බේරගන්න.ඒ විවේචනය ඒ බරින් කරන්න.කිසිම ගැටලුවක් නැහැ.හැබැයි මම කියන්නෙ සේවකයන් මහන්සි වෙන එක කාණු ටීම් එක විශාල ලෙස මහන්සි වෙනවා.ලොකු මහා විශාල පිරිසක් නැහැ.සීමිත පිරිසක් විශාල ලෙස මහන්සි වෙනවා.ඒක නිසා අපි ඇගයීමක් කරමු.ඉතාම කෙටියෙන් කරන්න තියෙන විවේචන කරලා ගණකාධිකාරීතුමියගේ අවස්ථාවට ඉඩ හදාගන්න වෙලාව ලබාදෙන්න.

__මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා__

ගරු නගරාධිපතිතුමනි,මම රීති ප්‍රශ්නයක් යොමු කරන්නෙ.දැන් තියෙන්නේ ආයාචනා හා පෙත්සම් අයිතමය.මේකෙ තියෙනවා. එක කරුණක් යම් සභිකයෙක් ඉදිරිපත් කරාට පස්සෙ ඒ කරුණම තවත් සභිකයෙක්ට ඉදිරිපත් කරන්න බැහැ.ඒ වගේම මේ අයිතමය යටතේ යම් කරුණක් ඉදිරිපත් කරොත් ඒ සම්බන්ධයෙන් කාටවත් පිළිතුරු දෙන්නත් බැහැ.නමුත් ගරු නගරාධිපතිතුමනි,එකම කරුණ කීප දෙනෙකු අතින් කියවුනා.ඩෙංගු ප්‍රශ්නෙදී පළමුව මම නැගිටලා කිව්වා.මට ඕන තරම් කතා කරන්න තිබ්බා මේ අයිතමය.අතුරු ව්‍යවස්ථාව අවබෝධයක් තියෙන මන්ත්‍රීවරයෙක් හැටියට මම ඔබතුමාට පොඩි ගයිඩ් ලයින් එකක් දුන්නෙ සෞඛ්‍ය කමිටුවෙ අපි ඩෙංගු කියන එක කතා කරන්න ඕනා.ඒක විවේචනය වෙන්නත්පුලුවන්.සාධනීය වෙන්නත් පුලුවන් සාකච්ජාවක් යන්න ඕනා.ඒ සාකච්ජාව මේ අයිතමයේ කරන්න බැහැ.ඒ නිසා තමයි මම ඔබතුමාට කිව්වෙ මම සෞඛ්‍ය කමිටුවේදී ඒක ගමු කියලා.එතුමා මූලාසනයේ ඉදගෙන ඒ කන්ට්‍රෝල් එක කරන්න ඕනා.මේකට අවස්ථාවක් එළඹෙනවා.මේ කමිටුවල සමහර කාරණා කතා කරන්න පුලුවන්.කමිටුවටල කතාකරන්න ගියාම විවාද වෙන්න පුලුවන්.

\- සභා ඝෝෂා -

__ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා__

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ අවස්ථාව එන්නෙ ඔබට මාසයකට දවසයි.පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ තියෙන රීතීන් කතා කරන්න යන්නෙ නැහැ.හැම මන්ත්‍රීවරයෙකුටම අවස්ථාවක් තියෙන්න ඕනා තමන්ගේ ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න.අපේ දැනුම අවබෝධය වර්ධනය කරගන්න ඕනා මේ සභාවේ න්‍යාය පත්‍රයට අනුගත වෙමින් වැඩ කරමු.ඒකට බාධාවක් නැහැ.උදෙන්ම මන්ත්‍රීතුමා මතුකරපු කාරනාව කිව්වම ඒක ආයෙත් සංවාදයට ලක්වෙන්නෙ

පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ.සෞඛ්‍ය කමිටුවේ බොහෝ අවස්ථා තියෙයි ඒකට ගන්න.ඒක ගමු.දැන් පෙත්සම් පැමිණිලි අයිතමය ඉවර කරමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.සභාව තුල තිබෙන යම් ක්‍රමවේදයේ තිටයන යම් අඩුපාඩුවක් හඳාගන්න.සැලසුම් අංශයට පැල්න් එකක් පාස් කරගන්න ආවම හොල්මන් වෙන අවස්ථාවක් තියෙන්නෙ. අපිට සමහරක් වෙලාවට නගරාධිපතිතුමනි,අපිට අත්දැකීම් බලපානවා.නාගරික සංවර්ධන අධිකාරියේ පනතේ රෙගුලාසි වගේම ආයතනයේ තියෙන පුරුද්ද බලපානවා.සැලසුමක් අනුමත කරගන්න ආවට පස්සෙ ඇත්තටම අපිෙ අනාගතයේදී නගරාධිපතිතුමා සමහරක් වෙලාවට ගෙදර ඉඩමයි ගේදොර ජේසීබී එකට දාගෙන ගේන මට්ටමකට අපි මේ ක්‍රමවේදය පැහැර හැරලා තියනවා.උදාහරණයක් ගත්තම පානදූර රෝහලේ ප්‍රසව හා නාරි වෛද්‍ය හර්ෂ මහතා ආවම පස්සෙ එතුමට නිරවුල් සහතිකයක් ගේන්න කිව්වා යූඩීඒකෙන්.ඇත්තටම නිරවුල් සහතිකයක් ඒකට අවශ්‍ය නැහැ. රුපියල් අටදහසක් වියදම් වුනා.නගරාධිපතිතුමනි මොරටුටව් ජනතාව නගර සභාවට ආවම පස්සෙ සැලසුම වෙනුවට ඔළුව අවුල්වෙන ස්වාභාවයක් නම් තියෙන්නෙ අපි ඒක නිරවුල් කරගන්න ඕනා.මෙතුමගෙත් යුතුකමක් අපෙත් යුතුකමක් අපෙත් වගකීමක්.ජූලි මාසයේ විසිතුන වෙනිදා සැලසුම සම්මත වුනාට එතුමාට තවස දුරකථන ඇමතුමක් ඇවිල්ලා නැහැ ඇවිල්ලා ගෙනියන්න කියලා.ඒකෙන් ඔබතුමත් අපහසුතාවයට පත්වෙනවා.ප්ලෑන් එක පාස් කරාට පස්සෙ ප්‍රොසීඩ් එක තමයි ප්ලෑන් එක ඇප්රූ වෙච්ච කන්ඩිෂන්ස් ටික අපි අත්සන් කරන්න ඕනා.ඒ කන්ඩිෂන් ටික අත්සන් කරලා එන්න අද ගත්තොත් එහෙම හරියටම දවස් දාහතරක් ගිහිල්ලා තියෙනවා.සැලසුම් අංශය යතාර්ථයක් බවට පත්කරන එක ඔබතුමාගේ වගකීමක්. අපිට ඒ සඳහා ක්‍රමවේද,පලපුරුද්ද අවශ්‍යයයි,දැනුම බෙදාහදාගැනීම අවශ්‍යයි.ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා පලවෙනි ආයාචනය.

ගරු නගරාධිපතිතුමනි,මොරටුව මහා නගර සභාවට අයිති සොයිසා ක්‍රීඩාංගණයේ ආසන්නයේ මේ වන විට නැවත වතාවක් තහඩු එල්ලෙනවා.ඉතිහාසයේ තහඩුවක් වැටිලා ළමයෙකුගේ ඔලුවක් පැලිලා මහ විනාසයක් බවට පත්වුනා. මොරටුව නගර සභාවේ සුළු නඩත්තු අංශය බොහොම දූර්වල අංශයක තියෙන්නෙ.මාස ගාණක් ගිහිල්ලත් නගර සභාවට තවම මේසන් කෙනෙක් හොයාගන්න බැරිවෙලා තියෙනවා.

නගරාධිපතිතුමනි, අගුලාන මහල් නිවාස සංකීර්ණයේ රුපියල් අසූදහසක විතර බිල් ගෙවලා නැහැ. ඉදිරියේදී මෙම ප්‍රශ්නය වැඩිවෙන්න පුලුවන්.එම ආයතන වලින් ක්‍රියාත්මක වෙන්න ඕනා. ඉදිරියේදී මේ ප්‍රශ්නය වැඩිවෙන්න පුලුවන්.

එගොඩඋයන ධීවර නිවාස සංකීර්ණයේ වැඩසටහන්වලට අපි සත්භාවයෙන් ඔබතුමාට උදවු කරා.ඒකට සල්ලි ලැබිච්ච අවස්ථාවේදී මොරොක්කෝවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙනයි ඒ වැඩේ කලේ.අද ඒක විනාසවෙලා නගරාධිපතිතුමනි.පවුල් හැටහතරකට අපි ප්‍රශ්නය විසඳලා දුන්නා.පවුල් තුනකට කරන්ට් එක තිබුනෙ නැහැ.මම කරන්ට් එක අරගෙන දුන්නා.අලිට ඡන්දය නෙමෙයි වැදගත් වන්නෙ අපිට වැදගත් වෙන්නෙ සත්භාවයෙන් කරන වැඩටික.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ආයාචනා හා පෙත්සම් යටතේ කරුණු දෙකක් තියනවා.සුදර්මරත්නාරාම පටුමගේ පාරේ තිබෙන බෝක්කුව අවුරුදු දෙකකටත් වැඩි කාලයක සිට කැඩිලා.වාහන දෙකක්

මාරු වෙන්න බැහැ.රාත්‍රී කාලයේදී පාරේ යනකොට ඉතාම අනතුරුදායකයි.කළුවර ස්ථානයක් නිසා පේන්නෙ නැහැ.කඩිනමින් පිළියමක් ගන්න කියලා ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද ප්‍රදේශයේ නොදිරන කසල ප්‍රශ්නයක්.අතුරු මාර්ගවල ගොඩාක් වෙලාවට ට්‍රැක්ටරය යන්නෙ නැහැ.මිනිසුන්ට ඉඩම් තියෙන්නෙ පර්චස් දෙකතුනක් තියෙන්නෙ. ඒවා ගෙනියන්නෙ නැතිවුනාම වහින කාලයේදී වතුර වැටිලා ඩෙංගු මදුරුවන් බෝ වුනාම දඩ ගහනවා.කුණු ගෙනියන්නෙ නැතිවුනාම මිනිස්සු බෑග් වලට දාලා පාරට කුණු දානවා.අතුරු මාර්ගවල කුණු ගෙනියන්න ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න.ඒ පිළිබඳ අවධානය යොමු කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අභිනවයෙන් මේ සභාව නියෝජනය කරන අපේ කල්‍යාණ මිත්‍රයා සහ ජ්‍යේෂ්ඨ නාගරික මන්ත්‍රීවරයෙක් වන ප්‍රියනාත් මෙන්ඩිස් සහෝදරයාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් සුභ ප්‍රාර්ථනාකරනවා.මෙතුමා මන්ත්‍රීවරයෙක් හැටියට පත්කරන්න පොහොට්ටුව ගත්ත හොද තීරණයක් හැටියට අපි දකිනවා.චෝදනා නැති මන්ත්‍රීවරයෙක්.එතුමාගේ දක්ෂතාවය පක්ෂය සහ මොරටු ජනතාව වෙනුවෙන් සහ සභාව වෙනුවෙන් යොදවයි කියලා මම බලාපොරොත්තු වෙනවා.පසුගිය මාසයේ දහඅටවෙනිදා මගේ දයාබර මෑණියන් අභාවප්‍රාප්ත වුනා.ඒ අවස්ථාව සැලහුන වහාම අපේ නායකයා හැටියට ඔබතුමා මට දුරකථනයෙන් කතා කරා.ඉතාමත්ම දුරබැහැර ප්‍රදේශයක තිබුනත් ඔබතුමා එම අවස්ථාවය සහභාගී වුනා.ඒක මට ලොකු හයියක්.ඒ වෙලාවෙ ඔබතුමා ආව එක ඉතාමත්ම මානසික ශක්තියක් වුනා.මම ස්තූති වන්ත වෙනවා ඔබතුමාර.දුරබැහැර ප්‍රදේශයක නිදි මරාගෙන පැමිණීම සම්බන්ධයෙන්.මගේ පවුලෙ උදවියත් එක්ක බොහොම කුලුපගුව කතා කරලා ඔබතුමා ඒ සුහදත්වය දැක්වීම සම්බන්ධයෙන් අපේ ගෞරවය ඔබතුමාට පිරිනමනවා.විපක්ෂ නායකතුමත් ඊට සම්බන්ධ වුනා.එතුමත් අපිත් එක්ක ඉදලා රාත්‍රියත් ගත කරලා තමයි එතුමා නැවත පිටපත්වුනේ.ඒවගේම සෞඛ්‍ය කමිටු සභාපති, සුදේශ් මන්ත්‍රීතුමා මගේ පාසල් මිත්‍රයා. අපි දේශපාලනික වශයෙන් කොච්චර ප්‍රශ්න ඇතිකර ගත්තත් අපේ සහෘදකම් හදවතේ තියනවා. එතුමත් ඔබතුමා එක්ක සමබන්ධ වුනා.එතුමන්ටත් මගේ ගෞරවය සහ ස්තූතිය පුදකරනවා.ඒවගේම දිලිප් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා සිද්ධිය සැල වූ වහාම එම ස්ථානයට පැමිණියා.ඒ වගේම බෙන්ඩන් හිමාෂා මන්ත්‍රීතුමා,මගේ සගයා, වන ෂෙයාන් දුලිප් මන්ත්‍රීතුමා සහ ඔහුගේ භාර්යාව පැමිණියා.ඔහු පවුලේ සාමාජිකයෙක් හා සමානවම මට විශාල හයියක් වුනා.ඔහුගේ රියදුරු මහතාවත් සිහිපත් කරනවා.අපේ හිටපු නාගරික මන්ත්‍රී නිරෝෂන් අපෝන්සු මන්ත්‍රීතුමාව සිහිපත් කරනවා.ආයතන අංශයේ උදයංග සහෝදරයාවත් මේ අවස්ථාවේ සිහිපත් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, අවමංගල්‍ය උත්සවය තිබුනේ පැමිණීමට ඉතාමත්ම අපහසු ස්ථානයක. නාගරික මන්ත්‍රීවරු පාට පක්ෂ නොබලා මා දුරකථන ඇමතුම් ලබාදුන්නා.ශෝකය ප්‍රකාශ කරපු සියලු දෙනාටම මාගේ ගෞරවය සහ ස්තූතිය මා මේ අවස්ථාවේදී පුදකරනවා.

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම සමන්ත සිල්වා මන්ත්‍රීතුමා සර්ව ජනබල මන්ත්‍රී කණ්ඩායමේ සභාපති හැටියට පත්වෙලා ඉන්නවා.එතුමන්ට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට එතුමාට සුභාශිංසන පිරිනමනවා.ඒ වගේම රේඛා තරංගනී අපේ සහෝදර මාධ්‍යවේදිනී ඉතාම විශාල කාලයක් මේ සභාවේ පැන හසුරවපු තැනැත්තියක්.ඇ රෝගාතුරු වෙච්ච වෙලාවෙ නගරාධිපතිවරයා හැටියටත් ආණ්ඩුපක්ෂයෙ මන්ත්‍රීවරු හැටියටත් සැම දෙනාටම කල හැකි උපරිම සහයෝගය හැමෝම දැක්වුවා.අපිත් දැක්වුවා.එතුමියට ලොකු සහකයක් වෙන්න ඇති ඒක.එතුමිය

සම්පූර්ණ නිරෝගී සුවය ලබලා අපිත් එක්ක නැවත වැඩ කරන්න ශක්තිය ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

ගරු නගරාධිපතිතුමනි, මට ඇවිල්ලා තියෙනවා සභාවට ඉතාමත් වැදගත් පෙත්සමක්. මේ පෙත්සම ඉදිරිපත් කරලා තියෙන්නේ එම්. ඕ. ඊ. ජී. ප්‍රනාන්දු කියන පුද්ගලයා. මේකෙ දීර්ඝ කතාවක් තියනවා. කාල වේලාව ඉක්මවා ගිහිල්ලා තියෙන නිසා මම කියන්නෙ නැහැ. කොහොම වුනත් සභාවට අනතුරුදායක තත්ත්වයක් උද්ගත වෙලා තියෙන්නේ.ඔබතුමා දන්නවා සිද්දිය.ගඟසිරිපුර නිවාස යෝජනා ක්‍රමයේ නිවාස දෙකක් සම්බන්ධයෙන්.දෙදහස් විසිතුනයි තුනයි නමය වන දින එතුමා නගර සභාවට නිවේදනයක් එවලා තියෙනවා. හිමිකම් සහතික එතුමාට නිදහස් කරන්න කියලා ජේෂ්ඨාධිකරණ තීන්දුවක් එවලා තියනවා.නමුත් අපේ සභාව ජේෂ්ඨාධිකරණ නියෝග දෙන්න ඕනා දෙදහස් විසිහතර අවුරුද්දෙ නාගරික කොමසාරිස්තුමිය තමයි මේකෙ පාලනය කරන්නෙ. හැබැයි නාගරික කොමසාරිස්වරිය විසින් ජේෂ්ඨාධිකරණ තීන්දුව ක්‍රියාත්මක කරන්නෙ නැහැ.ඒ නිසා ප්‍රශ්නයක් තියනවා.එතුමා නැවත වාරයක දෙදහස් විසිහයේ නමයයි විසිහයේ තුනයි නමවෙනිදා දැනුම්දීමක් කරලා මැයි මාසයේ තුනයි නමවෙනිදා නඩුවක් ෆයිල් කරනවා.රුපියල් හැත්තහතර ලක්ෂයක් වන්දි ඉල්ලලා.ඒ නඩුව දිසා අධිකරණයේ තියෙනවා.නඩුව දැම්ම කියලා සැලවුනාට පස්සෙ එතුමට ලියුමක් යනවා හිමිකම් සහතික දෙන්න ඇවිල්ලා සල්ලි බඳින්න කියලා.එතුමා ඇවිල්ලා සල්ලිත් බඳිනවා.විසිපන්දාහක් සහ දාහතරදහස් අටසිය අසූවක් එතුමා බඳිනවා.සල්ලි බැන්දට පස්සෙ කියනවා සාධන පත්‍රයක් හදලා එවන්න.එතුමාගේ සාධන පත්‍රය පිළිගන්න බැහැ කියලා ආපසු යවනවා.අපේ නගර සභාවත් එක්ක දීර්ඝ කාලයක් වැඩකරන සන්ධ්‍යා නෝනිස් නීතිඥ මහත්මිය හරහා සාධන පත්‍රයක් හදලා එවනවා.සාධන පත්‍රය හදලා එවුවාට පස්සෙ සභාවේ නීතිඥයා දුරකථනයෙන් කතා කරලා කියනවා.ඔයා නඩුවක් අහලා තියනවා.ඒක නිසා අපිට ඒක දෙන්න බැහැ කියලා.ගරු නගරාධිපතිතුමනි, එක නගරාධිපතිවරයෙක් වරදක් කරාම කරන්න ඕනා කන්ටිනිව් කරගෙන යන එක නෙමෙයි.ඒකෙ තව වරදක් තියනවා සභාවෙ හිමිකම් පත්‍රයකට අත්සන් කරන්න ඕනා නාගරික කොමසාරිස්වරිය විතරයි. මොකද හේතුව මේකෙ දාහතරෙ අයන්නෙ තියනවා සියලු දේපල වල භාරකාරිත්වය තියෙන්නෙ නාගරික කොමසාරිස්වරිය සතුව.නාගරික කොමසාරිස්වරිය තමයි හිමිකම් සහතිකයට අත්සන් කරන්න ඕනා.නාගරික කොමසාරිස්වරියයි නගරාධිපතිවරයයි දෙන්නම හිමිකම් සහතිකයට අත්සන් කරොත් ඒක නීත්‍යානුකූල නැහැ.ඒක නිසා දෙසිය පනස් හතර ආ වගන්තියට තමයි ප්‍රධාන විධායකය හැටියට ඔබතුමා පත්වෙන්නෙ.ඒකෙ දේපල වල භාරකාරිත්වය ඇවිල්ලා තියෙන්නේ නාගරික කොමසාරිස්වරයාට.නගරාධිපතිවාරයා සම්බන්ධ කරල තියෙන එක නිවැරදි කරගන්න.නැත්නම් කවදාහරි දවසක ඔබතුමාටත් ඒ ප්‍රශ්නය එනවා.සාධන පත්‍රය එවුවාට පස්සෙ අත්සන් කරන්න තවම දිනයක් දීලා නැහැ.නීති නිලධාරීතුමිය කියන්නෙ නඩුවක් දාලා තියෙන නිසා ඒ නඩුව අයින් කරනකම් කරන්න බැහැ කියලා.එතුමා කියන්නෙ මේක අත්සන් කරලා මගේ අතට ආවට පස්සෙ ඔබතුමත් එක්ක සාකච්ඡා කරලා නඩුව සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න එතුමා කැමැතියි කියලා.මේවා නගර සභාවෙ සල්ලි.නීතිඥ මහතුන්ට පසුගිය කාලයෙ ගෙවලා තියෙන සල්ලි බැලුවහම මොරටුව සංවර්ධනය කරන්න පුලුවන් සල්ලා ප්‍රමාණයක් ගෙවලා තියෙනවා.ලක්ෂ පහලවයි,ලක්ෂ අසූවයි, ලක්ෂ සීයයි,ලක්ෂ පනහයි.මොකටද මේ ගෙවන්නෙ කියලා හිතාගන්න බැහැ.කතා කරලා විසදගන්න පුලුවන් දේවල් වලටත් නීතිඥ මහත්වරුන්ට ගෙවලා තියනවා මොරටුව මහා නගර සභාව.නගර සභාව කියන්නෙ පෞද්ගලික දේපලක් නෙමෙයි.මේක පොදු දේපලක්.ඒක නිසා කරුණාකරලා නැවත වරක් නඩු වලට යන්නෙ නැතුව නැවත වරක් සාකච්ඡා කරලා විසදගන්න.මේක කාගෙවත් පෞද්ගලික හුදලේ නෙමෙයි.එක පාරක

ඒ මහත්මයාට එක්කෝටි හයලක්ෂයක් ගෙව්වා.ඒ මහතා ආපසු ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවක් දාලා.අපි ඒ නඩුව පරදිනවා.ඒ මහතා ඉල්ලපු හැමදේම ලැබුනේ නැහැ. හැබැයි අපිට කියනවා හිමිකම් දෙන්න කියලා.ඒ මහතා අවුරුදු තිස්හතරක් පදිංචිවෙලා සිටියා කියලා සලකන්න කියලා අපිට කියනවා.ඒවා සභාව දැනුවත් වෙනවද නැද්ද කියලා අවබෝධයක් නැහැ අපිට.ඒ නිසා විශාල ප්‍රශ්නයක් අපිට පැන නගිනවා.එතුමාට ගෙදරින් අයින් වෙනන් කියලා තියෙන්නෙ නගර සභාව.නගර සභාව ලිඛිතව දීලා තියනවා.ඒ ගෙදර අනතුරුදායකයි ඒකෙන් අයින් වෙන්න කියලා දෙදහස් දහඅට අවුරුද්දෙ.දෙදහස් දහඅට අවුරුද්දෙ ඉදලා මේ වෙනකම් එතුමා ඉන්නෙ කුලියට.එතුමා දිසා අධිකරණ නඩුව දාන්නෙ මම කුලියට ඉන්නෙ මට අයින් වෙන්න කිව්වෙ නගර සභාව.ඒ නිසා කරුණාකරලා නගර සභාවට කියන්න මගේ කුලී මුදල ගෙවන්න කියලා පොලියත් එක්ක.ඒ නිසා මම කියන්නෙ අනවශ්‍ය තැනකට යන්නෙ නැතුව මේක බොහොම සරල දෙයක් තියෙන්නෙ මේක කතා කරලා ඔබතුමා මැදිහත්වෙලා කරන්න පුලුවන්. ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් ඔබතුමාට මතක් කරනවා.මේක තවදුරටත් නගර සභාවට අවාසි සහගත තත්වයක් ඇති නොවන්න මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න කියලා ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඩී. කාන්ති පීරිස්, නො.11/126A, ශාන්ත ආනා පටුමග, කටුකුරුන්ද, මොරටුව හි පදිංචි අය විසින් ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තියෙනවා එම පැමිණිල්ල මම සභාගත කරනවා. ඒත් එක්කම තව ප්‍රශ්ණයක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි, කොරළවැල්ල කළාපය සම්බන්ධව. කොරළවැල්ල කළාපයේ ඔබතුමා සම්බන්ධව තිබෙන ප්‍රශ්ණයක්, ලක්ෂ්මන් කියන පුද්ගලයා ඔබතුමාගේ නම සම්බන්ධ කරලයි මේක කරන්නේ අපි දන්නේ නෑ කොහොමද තත්ත්වය කියලා. මා ලඟ දැන් තියෙනවා දැන් විඩියෝස්. එතන පුස්තකාලය ලඟ පුද්ගලයෙක් රේස් කොළය බලනවා, සෙනසුරාදා ඉරිදා කළාපෙට ඇවිල්ලා සිගරට් එක බොනවා, අසභ්‍ය වචන කියනවා. මේ පුද්ගලයා ඔබතුමාගේ මල්ලි කියලයි කියන්නේ. අපි දන්නේ නෑ ඔබතුමාට මල්ලිලා ඉන්නවද නැද්ද කියලා.ඔබතුමාගේ මල්ලි කියලා තමයි මේ සියලුම දේවල් කරන්නේ. ඔබතුමාට අවශ්‍ය නම් පෞද්ගලිකව හරි නැත්තම් මේ වෙලාවේ හරි වීඩියෝස් පෙන්වන්නම්. කවුරුත් වුනත් රේස් කොළේ බලන්න බෑ එතන වාඩිගෙන. ඒනිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. ඒක ඔබතුමාගේ ප්‍රතිරූපයට හොඳ නැති නිසා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, පෙත්සම් හා පැමිණිලි අයිතිමයට උත්තර දෙන්න අවස්ථාවක් නෑ. නමුත් යම් පැහැදිලි කිරීම් දෙක තුනක් තියෙනවා. එක් කරුණක් තමයි මීගහක් කපනවා වගේ කතන්දරයක් ආවා එහෙම එකක් නෑ ඒක අසත්‍යයක්. ඊළඟට අපේ විපක්ෂනායකතුමා ඩෙංගු සම්බන්ධව අයවැයෙන් වෙන්කරපු මුදල් සම්බන්ධයෙන් ප්‍රශ්ණයක් මතුකළා. ඩෙංගු වලට අදාළව වියදම් කරන්න අපේ අයවැයෙන් ඕනෑම වැය ශිර්ෂයකින් මුදල් ගන්න පුළුවන්. මුදල් පිළිබඳව ගැටලුවක් බාධාවක් මේ වෙලාවේ මතුවෙලා නෑ. හිස් ඉඩම් සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්ණයක් මතුකළා. අපි ඒ සම්බන්ධයෙන් මේ වන විටත් බැනර් ප්‍රින්ට් කරලා තියෙනවා. හෙට දින අපි සම්බන්ධීකරණ කාර්යාලයට විවෘත කිරීමෙන් අනතුරුව ඔබේ කළාපයේ හිස් ඉඩම්වලට අදාළ බැනර් සහ පත්‍රිකා එම කාර්යාලයෙන් ලබාගන්න පුළුවන්. විශේෂයෙන් අපේ සුජිත් මන්ත්‍රීතුමා මතුකරපු කරුණ ටිකක් සංකීර්ණ කාරණාවක්. ඒ සම්බන්ධයෙන් දීර්ඝ පැහැදිලි කිරීම් කරන්න යන්න බෑ. නමුත් එතුමා මතුකරන කාරණය නිවැරදියි. ඉතිහාසයේ නිලධාරින් සමහර සමහර දේවල් මගහැරීම් නිසා මහජනයාගේ මුදල් එක්කෝටි විසිහතර ලක්ෂයක් ගෙවන්න සිදුවුණා.

ඒවගේ තැනක් තමයි මේක. ඔහු නිවැරදිම කතන්දරයක් නෙමෙයි මේ කරන්නේ. මම ඔහුට ඉතාම පැහැදිලිව කිව්වා ශ්‍රේෂ්ඨාධිකරණයේ දීලා තිබෙන තීන්දුවක් තියෙනවා, ඒ තීන්දුව සලකලා අනිත් අයට දීපු පදනමින් ඔහුට නොදී සිටීමේ ගැටලුවක් තිබෙනවා ඒ අවස්ථාවේ මතුකරපු. මේ සභාව එකඟ වුණා. මම කිව්වා ඔයා නැවත නඩුවකට යන්න එපා. මම එහෙම ගෙන්නලා සාකච්ඡා කරලා යම් එකඟතාවයක් ආපු එකක් තමයි ආයෙත් ගිහිල්ලා මේ නඩුව දැම්මේ. මට ඇත්තටම ප්‍රශ්ණයක් තියෙනවා මේ මතුකරන ක්‍රියාවලිය ඇතුළේ උවමනාව තියෙන්නේ තවදුරටත් මේ සභාවේ මහජනයාගේ මුදල් පෙර ගත්ත ආකාරයට ගැනීමද අරමුණු කියන එක සම්බන්ධව. අපි මේ කරුණ ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේ වෙනම අරගෙන ඔහුව ගෙන්නලා සාකච්ඡා කරමු.

## 04. <u>ප්‍රශ්ණ</u> - නැත

## 05. <u>යෝජනා</u> -

**05(01) මහා නගර සභා මන්ත්‍රී, පී.එම්.ශෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මෝදර තුඩුවේ සිට රාවතාවත්ත දක්වා පාසල් 13 ආසන්න ප්‍රමාණයක් පිහිටා ඇත. මෙම පාසල් දරුවන්ට ආරක්ෂිත හා කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවාවක් නොමැති නිසා බොහෝ පීඩාවට පත්වෙති. එම නිසා පාසල් දරුවන්ට පමණක් සීමා වූ රජයේ බස් රථයක් ලබා දෙන මෙන් අදාළ ආයතන දැනුවත් කළ යුතු යැයි මෙම සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, එස්. ඩබ්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 05 (01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරන කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ශෙයාන් දුලිප් තිසේරා මහතා**</u>
ගරු නගරාධිපතිතුමනි, එගොඩඋයන සිට මෝදර දක්වා බස් රථයක් ඉල්ලා තිබෙනවා පාසල් ළමුන් සඳහා. මක්කිසාද පාලම හන්දියේ ඉඳලා ආපසු යන්න ත්‍රිවිල් රථයකට රු.200/-ත් 300/-ත් අතර මුදලක් යනවා. ඒනිසා ඒ සම්බන්ධව සලකා බලන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>
ගරු නගරාධිපතිතුමා, මෙතුමා කියන්නේ මෝදර ඉඳලා රාවතාවත්ත අවට පාසල් සඳහා විශාල ළමුන් ප්‍රමාණයක් උදේ සවස ගමන් කරනවා. ඒ දරුවන් බස් ගාස්තු සඳහා විශාල මුදලක් ගෙවලා තමයි එන්න ඕනේ. නමුත් මේ සඳහා පාසල් බස් රථ සේවාවක් දැම්මා නම් ඒ ළමයින් සීසන් එකත් අරගෙන කිසිම කරදයක් නැතුව පාසලට යන්න හැකියාව ලැබෙනවා. ඒවගේම දරුවාගේ ආරක්ෂාවටත් ලොකු පිටිවහලක් වෙනවා. සමහර දෙමාපියන්ට තකාහනියක් එන්න වෙනවා දරුවන්ව පාසලට ඇරලවන්න. ඒනිසා මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක්. ඒනිසා අපි

හැමෝම එම කාරණයට මැදිහත්වෙලා, ඔබතුමා පෞද්ගලිකව හරි මැදිහත්වෙලා ඩිපෝ එකත් එක්ක කතා කරලා කරගත්තොත් මම හිතන්නේ මොරටුවේ දරුවන්ට ලොකු සහනයක් ලැබෙයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, න්‍යාය පත්‍රයේ 05(01) යෝජනාව මම ඉතා අගය කරනවා. ඒ යෝජනාව සම්බන්ධයෙන් දැන් කතා කළා. ඒ සඳහා පොදු පාසල් සේවයක් දැම්මොත් වඩා උචිතයි.ඒවගේම ඒ හා සම්බන්ධව අපි මෝදර සිට මොරටුව දක්වා බස් සේවාවක් ඉල්ලුම් කරලා තිබ්බා. දැන් ඒකට මාස 08ක් විතර වෙනවා. මම හිතන්නේ අපි ඉදිරිපත් කරලා මාස 03 කට පස්සේ ලියුමක් ලිව්වා මාර්ග සංවර්ධන අධිකාරියට. ඊට පස්සේ ඒකේ අගක් මුලක් නෑ මොකක්ද වෙන්නේ කියලා. මම හිතන්නේ අපි යෝජනාවක් දැම්මොත් පටන් ගන්නේ කොහොන්ද ඉවර වෙන්නේ කොහෙන්ද කියන එක අපි සමහරවිට දන්නේ නෑ. ඒනිසා කවුරුහරි මේක නියාමනය කරනවද මේකෙන් පස්සේ මොනවද වෙන්නේ කියන එක. අපි දැනුවත් වෙලත් නෑ.අපෙන් ඇහුවොත් අපි ලියුම් ලියලා තියෙනවා. අනික් කමිටුවලට නිර්දේශ කරනවා නැත්තම් වාර්තා කරනවා. අයි තින්ක් කර්මිෂනර් යූ වෝස් ඕල්සෝ බෙටර් ගෙට් ඉන් ඉන්වෝල්ඩ් ඉන් දිස් ඇන් සී වෙදර් දිස් ටයිම් තින්ග්ස් කැන් බී ඩන් වෙන් වී සෙන්ඩ් ද ලෙටර්ස් ද රිප්ලයි ඩස්න්ට් කම් හූ ඩස් ද ෆලෝවින්ග් අප් සෝ අයි තින්ක් ඉෆ් යූ කැන් ටේක් සම් රෙස්පොන්සිබිලිටි ඔන් දිස් වී කැන් ගෝ ෆදර්.

**05(02) ගරු නියෝජ්‍ය නගරාධිපති,ඩබ්. පී. ප්‍රභාෂනී වික්‍රමසිංහ මහත්මිය, මහා නගර සභා මන්ත්‍රී, ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා, එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය, ඩබ්. ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු, එල්. ඩී. තිලක් විජේතුංග මහතා, ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය, ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා, යන මහත්ම මහත්මීන් මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ සභා රැස්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 13(ඌ) වගන්තිය යටතේ පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය මේ වන විට මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවක් වන කසළ කළමනාකරණ ගැටලුව සඳහා ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන සමග ඒකාබද්ධව කසළ කළමනාකරණ ව්‍යාපෘතියට සමගාමීව අප සභාව තුළ කසළ කළමනාකරණය විධිමත් කිරීම සඳහා මධ්‍යස්ථානයක් ඉදිකර ඒ තුළින් කසළ දාහක උඳුනක් ඉදි කිරීම, සෙරමික්, මැටි බඳුන්, ටයිල් වර්ග කුඩු කිරීම සඳහා යන්ත්‍ර ඉදිකිරීම, ද්‍රව්‍ය ප්‍රතිසාධක පහසුකම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම, කොම්පෝස්ට් අංගනයක් හා ජීව වායු උත්පාදක ස්ථානයක් ඉදිකිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා බොරුපන මාළිගාව පාරේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් අක්කර හයක පමණ භූමි ප්‍රමාණය මේ වන විට භාවිතයට නොගන්නා බැවින් එම භූමි ප්‍රමාණයේ අක්කර දෙකක පමණ කොටසක් මොරටු මහා නගර සභාව විසින් සැලසුම් කර ඇති කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වෙන් කරවා ගෙන ආරම්භ කළ යුතු බව මෙම සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, ඩී.සමන් සුජීව මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව සමහර විට හැමෝටම පොඩ්ඩක් හිතෙන්නට පුළුවන් ඇයි මේ ඒපාරටම මෙහෙම යෝජනාවක් ඇති කළේ, මේක සාමාන්‍ය යෝජනාවක් විදිහට සභාවට ගේන්න තිබ්බනේ කියලා. නමුත් ගරු නගරාධිපතිතුමනි, ගිය සතියේ පළාත් පාලන, පළාත් සභා නියෝජ්‍ය ඇමතිතුමාත්, ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ඒ වෙනුවෙන් නම් කරලා තියෙන අතිරේක ජනාධිපති ලේකම්තුමාත්, කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානින්, ඒ නිලධාරින් ඒකාබද්ධව විශේෂ සාකච්ඡාවක් පැවැත්වුවා කසළ කළමනාකරණය පිළිබඳව. අපි රජයක් විදිහට කසල කළමණාකරණයට ස්ථිරසාර විසඳුමක්.

විශේෂයෙන් කරදියානේ තියෙන ගැටලුව තවදුරටත් අපිට කරදියාන තුළින් යැපෙන්නට බැරි තත්ත්වයක් උද්ගත වෙලා තියෙනවා. නඩු තීන්දුවත් බොහොම ඉක්මනටම ලැබෙන්නට නියමිතයි. ඒ අනුව ඒ ඒ පළාත් පාලන ආයතනවලට තම තමන්ගේ සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා කෙටි කාලයක්, ඒ කියන්නේ සතියක් ඇතුළත මොරටුව මහා නගර සභාවේ ඉදිරි සැලැස්ම හා ඒ වෙනුවෙන් ක්‍රියාමත් කරන්නට යන්නේ මොන විදිහේ වැඩපිළිවෙලක්ද යන්න පිළිබඳ පැහැදිලි සැලැස්මක් දත්ත සහිතව ඉදිරිපත් කරන්න කියන ඉල්ලීම ඒ අයගෙන් ආවා. ඊට පස්සේ එතනින් නැවත මතුවුණා මෙය යෝජනාවක් ලෙස සභාවෙත් සම්මත කරමින් අදාළ ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතියටත්, දැන් අපි ඉඩමක් හඳුනාගෙන තියෙනවා ඒ සම්බන්ධවයි මේ කතා කරන්නේ. ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතියට සහ ප්‍රාදේශීය ලේකම් හරහා ඉඩම සම්බන්ධ කටයුතු, එය පවරා ගැනීමට හැකියාවක් තියෙනවද, එය පවරා නොගෙන අපිට භාවිතා කරන්නේ කොහොමද කාරණය සාකච්ඡාවක් ඇතුළේ ඒක විසඳගන්න ශ්‍රී ලංකා ව්‍යාපෘතිය මැදිහත් වෙනවා රජය මැදිහත් වෙනවා. ඒනිසා තමයි අපි මේ සතිය ඇතුළත මේ සැලැස්ම සකස් කරලා අපි යවන්න ඕනේ ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතියට. මක්නිසාද 2027 සඳහා බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කසළ කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් බිලියන 34ක් රජය වෙන්කරලා තියෙනවා. බිලියන 10ක් මේ අවුරුද්දෙම ක්‍රියාත්මක කරන්න සූදානමින් සිටිනවා. ඒනිසා තමයි අපිට සිද්ධ වුණේ අද මේ සභාවට මෙම යෝජනාව "ඌ" වගන්තිය යටතේ ඉදිරිපත් කරන්න. මක්නිසාද මේ සැලැස්ම අපි කඩිනමින් නදීන් මහත්මයාගේ සහයෝගයත්, කොමසාරිස්තුමිය, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක ඔබතුමත් සම්බන්ධ කරගෙන විශේෂ සාකච්ඡාවක් හෙට දිනයේ අපි අවස්ථාවක් කරගෙන තියෙනවා මෙම සැලැස්ම කොහොමද ඉදිරිපත් කරන්නේ කියලා. අපිට විශේෂ ගැටලු ගණනාවක් කසළ කළමනාකරණය ඇතුළත තියෙනවා. විශේෂයෙන් ඉඳුල්. අපි ගත්තොත් යූ.එන්.ඩී.පි.ආයතනය හරහා අපිට දත්ත කිහිපයක් ලැබිලා තියෙනවා දෛනිකව මොරටුව මහා නගර සභාවේ සමස්ථ කසළ ජනනය වෙනවා ටොන් 190ක් පමණ. එකෙන් අපි නගර සභාවක් විදිහට එකතු කරන්නේ සමස්ථ කසළ වලින් ටොන් 75ක පමණ ප්‍රමාණයක්. එවිට අපිට හිතාගන්න පුළුවන් ඉතිරි කසළ වලට මොකද වෙන්නේ කියලා. මන්ත්‍රීවරුන් ගණනාවක් මේ විවේචනයන් ඉදිරිපත් කරන්නේ මේක තමයි අපි මුහුණ දෙන ගැටලුව. අපිට වාහන ප්‍රශ්ණ තියෙනවා, සේවක ප්‍රශ්ණ තියෙනවා. අපිට මේ කසළ නැවත ප්‍රතිචක්‍රීකරණය කරලා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරලා මේ කසළ කළමනාකරණය කරගන්නේ කොහොමද කියන කාරණය බරපතල ලෙස මීට කලින් හිටපු පාලනයත් මුහුණ දුන්නා අපිට ඒකට මුහුණ දෙමින් ඉන්නවා. ඒනිසා තමයි රජයක් ලෙස විශේෂ මැදිහත් වීමක් මේකට යොමු කරලා 2027/2029 කියන කාල පරාසය තුළ ඉක්මන් විසඳුමක් සපයලා මෙම කටයුත්ත නිවැරදි කළමනාකාරි තත්ත්වයකට පත්කර ගන්න රජය විදිහට මැදිහත් වුණා. එකේ පළාත් පාලන ආයතනයක් විදිහට අපිටත් කාර්යභාරයක් තියෙනවා. ඒ අරමුණින් තමයි අපි මේ යෝජනාව ඌ වගන්තිය යටතේ ඉදිරිපත් කළේ. අපි විශ්වාස කරනවා අපිට විශාල ගැටලුවක් තියෙනවා විශේෂයෙන් ඉඳුල් සම්බන්ධව ගත්තොත් කරදියාන කසළ අංගණයේ ලොකු ගැටලුවක් අපිට නැති වුණත් කරදියානට යන ලිමිට් එක ඉඳුල් සම්බන්ධවත් ගැටලුවක් තියෙනවා.ලොකු ප්‍රමාණයක් තවදුරටත් කරදියානට බැහැර කරන්න බැරි මට්ටමක තියෙන්නේ. ඔබ කවුරුත් දන්නවා නගර සභාවේ කලවම් වේස්ට් ටේජ් එක කියන එක. විශාල ප්‍රමාණයක් අපි කරදියානට යොමු කරනවා. ඒකත් අවම කරගන්න මේ ළඟදි සාකච්ඡාවක් කැඳෙව්වා ආයතනයක් සමඟ. ඒගොල්ලෝ බර්නින් මැෂින් ප්‍රමාණයක් හඳුන්වලා දෙනවා, ඒක කිලෝ ප්‍රමාණයන් අනුව වෙන්කරවා.මාලදිවයිනේ තමයි ඒ ආයතනය තියෙන්නේ. අපේ යොගේෂ මන්ත්‍රීතුමත්, තුසිත් මන්ත්‍රීතුමත් විශේෂයෙන් මැදිහත් වෙලා ඒ සාකච්ඡාව අපට අරන් දුන්නේ. ගරු නගරාධිපතිතුමත් ඒකට සම්බන්ධ වුණා. අපි ඒකෙන් බලාපොරොත්තු වෙනවා මේ යෝජනා

සියල්ල සකස් කරලා, මෙන්න මේ වගේ ඉඩමක්. මේ ඉඩම ගත්තොත් මාළිගාව පාරේ අපි කවුරුත් දන්නවා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩම, මේකේ ඇත්ත හිමිකාරිත්වය තියෙන්නේ කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කොටස් නාගරික සංවර්ධන අධිකාරියට. නමුත් මේ කියන භූමිය ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව තමයි භාවිතා කරන්නේ. අද ඒ භූමිය ඇත්තටම කිසිම ප්‍රයෝජනයකට ගන්නේ නෑ. මේක මීට කලිනුත් සාකච්ඡා වෙලා තියෙනවා විවිධ අවස්ථාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්.  අපි කල්පනා කළා. මේක කර්මාන්ත පුරයක්. මෙම කර්මාන්ත පුරය ඇතුළේ පරිසරයට හානියක් නොවන ආකාරයේ ක්‍රමවේදයන් අළුතින් ඇවිල්ලා තියෙනවා. විශේෂයෙන් බර්නින් මැෂින් එක ගත්තොත් කිසිදු පරිසර හානියකින් තොරව ඉදිකරන්න ඒ ඒ සමාගම්වලට තාක්ෂණික හැකියාව තියෙනවා. මේ සියල්ල සම්බන්ධ කරගෙන ක්ලීන් ශ්‍රී ලංකාව ව්‍යාපෘතියෙන් අපට දැනුවත් කළේ ඔබ යම් ඉඩමක් හඳුනාගෙන තිබේ නම් එම ඉඩම පිළිබඳ විස්තර අපට ලබාදෙන්න රජයක් විදිහට මැදිහත් වෙන්නම් මෙය විශේෂ කරුණක් සේ සලකලා. ඒ ඉඩම මේ කටයුත්ත වෙනුවෙන් පවරා දීලා මේ කටයුත්ත කරගෙන යන්න රජයක් විදිහට මැදිහත් වෙනවා කියලා. ඒ අනුව හඳුනා ගැනීමක් කරලා සභාවක් විදිහට යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්න කියන කාරණාව නිසයි මේ කටයුත්ත මේ විදිහට සිද්ධ වුණේ. අපි බලාපොරොත්තු වෙනවා මේ වසර අවසාන වෙන කොට මෙම කටයුත්තේ යම් ආරම්භයක් ගන්න. මේ සම්බන්ධ යම් අදහසක් ඔබතුමාලගෙත් තියෙනවා නම් ඉදිරිපත් කරන්න. කවුරුත් සහයෝගය දැක්විය යුතු කාරණයක්. කසළ ප්‍රශ්ණය පිළිබඳව විශාල ගැටලුවක ඉන්නවා පළාත් පාලන ආයතන සියල්ලම වගේ. මේ ප්‍රශ්ණවලට අපිට යම් මැදිහත්වීමක් කරන්න වෙලා තියෙනවා උත්තර සොයන්න. අපි කාරුණිකව ඉල්ලනවා කවුරුත් සහයෝගය දක්වන්න. මේ කටයුත්තේ යම් අඩුපාඩු තියෙනවා නම් අපි හදාගෙන යමු. මෙය සිදුවිය යුතු කටයුත්තක් සේ සලකලා මෙය ක්‍රියාත්මක කරමු කියන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි මේ වෙලාවේ ඇතිවෙච්ච හදිස්සි ඉල්ලීමක්, කාලයක් ගන්න බෑ. අපි දැන් අදහසක් දෙනවා. කසළ අපිට විශාල ගැටලුවක්. ඊට ස්ථිරසාර විසඳුමක් රජය පැත්තෙන් යෝජනා කරනවා. අපිට කියනවා අපේ භූමිය ඇතුළේ තිබෙන හිස් ඉඩමක් නම් කරලා සභාවේ යෝජනාවක් සම්මත කරලා ලබාදෙන්න කියලා. අපි දැන් කරන්නේ ඒක.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ඉඩම නම් මම කැමති තක්සේරු නිලධාරිණියගෙන් අහන්න අපි අර්ධ රාජ්‍ය ගොඩනැගිලි සහ ඉඩම්වල වරිපනම් නොගෙවීම නිසා පවරා ගැනීමට කටයුතු කරමින් ඉන්නවා මේ දවස්වල. ඒකට අයත් වන ඉඩමද මේ කියලා. එහෙනම් කිසි ප්‍රශ්ණයක් නැතුව මෙම ඉඩම පවරා ගන්න පුළුවන්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒක අපිට ගැටලුවක් නෑ. අපි නෙමෙයි ඒක කරන්නේ. ඒක රජය පැත්තෙන් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ එහෙන් කරන්නේ. එහෙනම් අපි මේ යෝජනාවට දානවානේ පවරා ගත යුතුය කියලා. අපි මේක සම්මත කරනවා අපේ ගැටලුවක් තියෙනවා, ඒ ගැටලුවට විසඳුමක් සොයා ගන්න පුළුවන් ඉඩමක් තියෙනවා ඒ ඉඩමට අවශ්‍ය කටයුතු ටික රජය මැදිහත් වෙලා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කොහොමත් ඒක පවරා ගැනීමකට යටත් නම් ප්‍රශ්ණයක් වෙන්නේ නෑ. ඉන්සිලරේටරයක් හයි කරනවා නම් ඒ භූමියේ කිසිම ප්‍රශ්ණයක් නෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, එකේ තියෙනවා අක්කර 06ක්. මුකුත් ක්‍රියාත්මක නෑ. මැෂින් වගයක් තියෙනවා. කාලයක් තිස්සේ මුකුත් වැඩක් අරගෙන නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, එතන ජනතාව ඉන්නවා නම් ජනතාවගෙන් ගැටලුවක් එන එකක් නැද්ද.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි බලමු නේද, දැන් උපකල්පනය කරන්න බෑ. අපි දැන් ක්‍රියාත්මක කරන්න හදන වැඩසටහන්වලට අනිවාර්යයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍යමනේ. එවිට අපිට යම් ගැටලු බාධක ප්‍රමාණයක් තියෙයි. අපි ඒවට මුහුණ දීලා ජනතාවට පරිසරයට හානියක් නොවන පරිදි අපි මේ විසඳුමකට යන්නම ඕනේ. මොකද මේකට ස්ථිරසාර විසඳුමක් මොරටුවට අත්‍යාවශ්‍යයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි පිලිගන්නවා විපක්ෂයක් විදිහට කාලීන අවශ්‍යතාවයක් තියෙනවා විශේෂයෙන් මොරටුව වගේ ජනාකීර්ණ නගරයක. සීමිත ඉඩකඩක් පවතින විශාල ජනග්‍රහණයක් නියෝජයනය කරන ප්‍රදේශයක මේ බැරෑරුම් ප්‍රශ්ණයට අපි සියල්ලක්ම මුහුණුදෙන්න ඕනේ. ඒකේ කිසිම තර්කයක් නෑ. ඒවගේම මේ යෝජනාව ඌ වගන්තිය යටතේ ගෙනාපු නිසා අපට අධ්‍යයනය කරන්න කාල සීමාවක් මදී. නමුත් මේ යෝජනාව ක්‍රියාත්මක විය යුතුයි කියන පදනමෙත් අපි ඉන්නවා. ඒ එක්කම සඳහන් කරන්නට ඕනේ මේ ඉඩමේ පවරා ගැනීම සම්බන්ධව. මම හිතන්නේ රජයක් ඉඩමක් පවරා ගැනීම් කරද්දි ලොකු කාර්යභායක් තියෙනවා කරන්න. අපේ මට්ටමින් නෙමෙයි. අපිට තියෙන්නේ යෝජනාව සම්මත කරලා දාන්නට විතරයි. රජයෙන් තමයි ඒ කාර්යයට යොමු වෙන්න ඕනේ. ඒ නිසා අපි විරුද්ධත්වයක් ප්‍රකාශ කරන්නේ නෑ අපි නිහඬව ඉන්නවා ඔබතුමන්ලාගේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාව ඉතාම හොඳයි කාලෝචිතයි. ඒකේ ඉඩම් සම්බන්ධ ගැටලුවක් අපට තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ පිළිබඳව දැන් සජිත් මන්ත්‍රීතුමාට වැටහිලා තියෙන්නේ ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ගැන. දැන් අපි ඉන්නේ වෙනම මතකය. අපේ ගරු විපක්ෂ නායකතුමා කිව්වා වගේ අපට තියෙන ගැටලුව, අපි ඔක්කොම එක තැනක ඉන්නවා මේ කසළ වලට ස්ථිරසාර විසඳුමක් ඕනේ කියන තැන අපි ඉන්නවා. එකේ තර්කයක් නෑ. මොන කවුරු හෙට දවසේ ඔබ පුටුවේ වාඩිවුනත් ඒ වාඩිවෙන පුද්ගලයා සහ මේ පැත්තේ වාඩිවෙන කට්ටිය මුහුණ දෙන ප්‍රධානම ගැටලුවක්. ඒකට ඔබතුමාලා ස්ථිරසාර විසඳුමක් දෙනවා නම් එකේ ගැටලුවක් නෑ. අපි ඒකට අත් දෙකම උස්සනවා. හැබැයි මේකේ තියෙන්නේ අපිට පැහැදිලි නෑ ඌ වගන්තිය යටතේ ආව නිසා අපිට මේ වැඩේ කරන්නත් බෑ.ඉස්සෙල්ලා සුදේශ් මන්ත්‍රීතුමා කියපු කාරණයත් අපට පැහැදිලි

වුණේ නෑ. ඒනිසා අපි කියන්නේ අපිට පැහැදිලි කිරීමක් දෙන්න අඩුම තරමේ අපිට දැන ගන්න හරි, මනුෂ්‍යයෙක් ඇහුවොත් අපිට කියන්න හරි පැහැදිලි කිරීමක් දෙන්න මොකක්ද මේ කියලා.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි මෙහෙම ගමු. අපෙන් ඉල්ලනවා ඉදිරියේදී අපේ කසළ කළමනාකරණය කරන සැලැස්මක්. තවමත් නගර සභාවට කසළ කළමනාකරණය කිරීමේ ඉතාම හොඳ විද්‍යාත්මක අවසන් සැලැස්මක් නෑ. දැන් අපට අවස්ථාවක් තියෙනවා ඒ සැලැස්ම ක්‍රියාත්මක කරන්නට නම් නිශ්චිත ලෙස ඉඩමක් ඕනේ. ඊළඟට දැන් අපි කරපු සාකච්ඡා වලදි අපි ආපු තැන් තිබෙනවා ආයතන ගණනාවක් එක්ක. ඒ ආයතන ගණනාවක් එක්ක කරපු සාකච්ඡාවේදි අපි ආපු එකඟතා ප්‍රමාණයක් තියෙනවා, ඒ ඒ කාරණා ටික මේ යෝජනාවට ඇතුළත් කළා. අපිට රජයට ඉදිරිපත් කරන්න වඩාත් නිවැරදි විද්‍යාත්මක සැලැස්මක් පස්සේ අපි හැමෝම එකතුවෙලා කොහොමද, මොන මොන ආකාරයටද මේක කරන්නේ කියලා කතා කරමු. දැන් මූලික දේ තමයි ඉඩම පවරා ගැනීමට රජයට භාරදීම සහ අදාළ ප්‍රතිපාදන වෙන්කර ගැනීම. අප කසළ කළමනාකරණය කරන විදි කිහිපයක් අදහස් කරනවා මෙතන. එවිට අපිට වඩාත් හොඳ, පක්ෂ විපක්ෂ සියල්ලම එකතුවෙලා සාකච්ඡා කරලා අපි ඉතාම හොඳ සැලැස්මක් හදා ගෙන ඒ සැලැස්ම තමයි ඉදිරිපත් කරන්නේ. අපිට කියනවා කඩිනමින් යෝජනාවක් සම්මත කරලා එවන්න කියලා.

**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාලගේ යෝජනාව හොඳයි. අපි එකඟයි. නමුත් මේක ගෙනාපු විදිහ තමයි වැරදි ඒක එකක්. දැන් කසළ කළමනාකරණය කිව්වම අපි බෙලින් සෙන්ටර් එකක් පටන් අරගෙන තියෙනවා. එක තාම අපිට නිවැරදි තත්ත්වයටම ගන්න බැරි වුණා.මට මතකයි 2002 වගේ රවිනාත් ගුණසේකර මහත්මයත් කසළ පුච්චන උඳුන ගේනවා කිව්වා කළේ නෑ. වැඩේ හොඳයි. කරන්න පුළුවන්නම් අපි සහයෝගය දෙන්නම්. නමුත් නගරාධිපතිතුමා අපිට තාම පැහැදිලි මදී මොකක්ද මේක කියලා. ඒක පැහැදිලි කරලා වැඩේ අරන් යනවා නම් අපි සහයෝගය දෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, දැන් ඔබතුමා කියපු විදිහට මේක ඇවිල්ලා කසළ වලට කරන්න පුළුවන් හැමදේම කරන්න හදන බහුවිධ මධ්‍යස්ථානයක්. කොම්පෝස්ට් ටික හදනවා, ද්‍රව්‍ය ප්‍රතිසාධනය කරනවා, දහනය කරනවා ඒවගේ හැම දෙයක්ම කරනවා. ඒකට නම් ඔය අක්කර දෙක නම් ගැවෙන්නවත් මදී. අක්කර හයෙන් දෙකයිනේ ඉල්ලන්නේ. ඒනිසා ඉල්ලනවා නම් ඔය ඉඩමම ඉල්ලන්න. සුදේශ මන්ත්‍රීතුමා කිව්ව විදිහට ටොන් 180ක් විතර දෛනිකව එනවා නම්, ඔබතුමා හිතන්න ඕක බාපු ගමන්ම ඔය වැඩේ කෙරෙන්නේ නෑනේ. බාන්න තැනක් ඕනේ. ඕක ලොකු ප්‍රොසිඩියර් එකක්නේ. අපි කියන තරම්, යෝජනාව තරම් සුන්දර නෑනේ. ඒනිසා ඒ ඉඩමේ අක්කර හයක් තියෙනවා නම්, පවරගන්න පුළුවන්නම්, මේක අපේ බල ප්‍රදේශයේ තියෙනවා නම් අක්කර හයම පවර ගන්න කියලා ඉල්ලන්න. ඊට පස්සේ ඒ අය තීන්දු කරයි අක්කර හයම දෙන්න බෑ ඔගොල්ලන්ට අපි අක්කර තුනක් දෙන්නම් කියලා. ඒනිසා එහෙම තීන්දුවක් ගන්න. ඔබතුමාලගේ ගෙනාපු කට්ටියම තීන්දු කරන්න අක්කර දෙක නෙමෙයි ඒ ඉඩමම පවර ගන්න කියලා. මොකද ඔබතුමාලා කියන දේ නිර්මාණය කරන්න නම් විශාල වපසරියක් ඕන වෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාලගේ මුඛ්‍ය පරමාර්ථය ගැන කිසි ගැටලුවක් නෑ. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඒ ගැන කතා කල නිසා මම ඒ සම්බන්ධයෙන් කතා කරන්නේ නෑ. අනිවාර්යයෙන් මේ ප්‍රශ්නයට විධිමත් උත්තරයක් ඕනේ. මම හිතන්නේ මේ මහා නගර සභාවේ

මේ වෙන කොට ඉඩම් සම්බන්ධයෙන් ලොකු අවුල් කිහිපයක් තියෙනවා. එකක් තමයි මම ඉන්න සිවිච් රෙසිඩන්ට්ස් නිවාස සංකීර්ණය. ඒකේ ගෙවල් හදලා මේ වෙනකොට පවුල් 356ක් ප්‍රශ්ණයකට මුහුණදීලා තියෙනවා ආයතන දෙකක ගැටලුවක් නිසා. එතකොට මේ ඉඩම් පවරා ගැනීමේදි මෙම ඉඩම නගර සභාවේ ඉඩමක් නෙමෙයිනේ. අර ඉඩම නම් නගර සභාවේ ඉඩමක් කියලා කිව්වා නමුත් ඔප්පුවක් නෑ. නමුත් මෙම ඉඩම නගර සභාවේ ඉඩමක් නෙමෙයි. මේ ඉඩම පවරා ගැනීම නිශ්චිතව කරගෙන, මොකද මේකේ අරමුණ සම්බන්ධයෙන් කිසි ගැටලුවක් නෑ. නමුත් මෙම ඉඩම් පවරාගැනිමේදි ඇතිවන ගැටලු, ප්‍රශ්ණ, ඔය ප්‍රදේශය වැඩිපුර නේවාසික අය ගැවසෙන්නේ නැති පැත්තක්. එහෙම නමුත් ඇතිවෙන්න පුලුවන් මේ ගැටලු සියල්ල සලකා බලන්න ඕනේ. ගරු නගරාධිපතිතුමා, මට තේරෙන්නේ නෑ මේක ඌ වගන්තිය යටතේ ගේන්න තරම් හදිස්සි කටයුත්තක් උනේ කොහොමද කියලා එච්චර ඉක්මණට. මේ කියන තත්ත්වය හැටියට ඉක්මණට යෝජනාවක් සම්මත කරලා දෙන එකේ ගැටලුවක් නෙමෙයි තියෙන්නේ. නමුත් අපි ඉන්න පොදු ස්ථාවරය කිසි ගැටලුවක් නෑ මේ යෝජනාව ඉදිරිපත් කරන්න. කසළ සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා මොරටුවේ. ඒ ගැන උත්තර හොයන්න ඕනේ. හැබැයි මේ යෝජනාවේ ගරු නගරාධිපතිතුමනි, අපට පක්ෂ වීමටවත් විපක්ෂ වීමටවත් හැකියාවක් නැති සංධර්භයක අපි ඉන්නේ. අන්න ඒ අර්බුදය තමයි අපිට තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී- බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම විශ්වාස කරනවා මේ යෝජනාව අපේ උප නගරාධිපතිතුමිය ප්‍රභාෂිණී වික්‍රමසිංහ මහත්මියත් මෙතන මේ යෝජනාව ගෙනාපු එක බොහොම වැදගත් කියලා. ඒ නිසා ඔබතුමා නගර සභාවක් විදිහට වාසනාවන්තයි. ඒ තමයි කොළඹ කුණු අපිට එපා, මොරටුවේ කුණු අපිට එපා කියලා ප්‍රදේශයේ කසළ බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් එහෙම නැත්තම් අපි සනීපාරක්ෂක කසළ රඳවනයක් හදනකොට හුඟ දෙනෙක් උද්ඝෝෂණය කළා. ඒත් එක්කම අනිත් පැත්තෙන් ගත්තට පස්සේ අපේ කෙළවර පිටිය කසළ බලාගාරය හදනකොට උද්ඝෝෂණය කළා. ඒත් එක්කම අපේ මොරටුවේ කරදියාන හදන කොට බෙහෝ දෙනෙක් උද්ඝෝෂණය කළා අපට මේ කසළ විදුලි බලාගාර එපා කියලා. ඒත් එක්කම අපිට තවත් තැනක මතකයි ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා වාසනාවන්ත වෙන්නේ ඒකයි. ඒවගේම අපේ හිටපු සරෝජනි පෝල්රාජ් ඇමතිතුමියත්, අපේ නියෝජ්‍ය නගරාධිපතිතුමියත් එදා මේ මොරටුව මහා නගර සභාවේ කසළ වැඩසටහනක් යනකොට ඒ ලුනාව ප්‍රදේශයට ගිහිල්ලා ඒකට විරුද්ධ කතා කලා. ඒකේ වීඩියොත් අපි ළඟ තාම තියෙනවා. ඒ වෙලාවේ තමයි මොරටුවට විසඳුමක් ඕනේ කියලා නගරාධිපතිතුමා කියද්දි අපි එකතු වෙලා වැඩ කළේ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට පූර්ණ සහයෝගය අපි ලබාදෙනවා මේ කටයුත්ත ඉෂ්ඨ කරන්න. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ අපිට මේ ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය කියන සංකල්පය මීට අවුරුදු ගාණකට පෙර මතු වෙද්දි ඒකේ දිගුවක් විදිහට තමයි මොරටුව මහා නගර සභාවේ මේ කටයුත්ත ආරම්භ වෙන්නේ. ඒත් එක්කම ගරු නගරාධිපතිතුමනි, මම හිතනවා ඔබතුමාලා ඉදිරිපත් කරන යෝජනාව අනුව ඉඩම පවරගෙන, විශාල කාලයක් අපට මේ සඳහා යනවා. නමුත් මේ වැඩසටහන මේ ඉඩම පවරගන්න අතරවාරයේ කරන්න නිශ්චිත වැඩසටහනක් තියෙනවා. බොහොම සාධාරණ තාර්කික උත්තරයක්. ඒක තමයි ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා මොරටුව ජනතාවගේ ප්‍රශ්ණ විසඳන්න පුළුවන් එක අවස්ථාවක් තියෙනවා. ඒක තමයි කෙලවරපිටිය කසළ විදුලි බලාගාරයට සමගාමීව කරදියාන කසළ බලාගාරයේ ආරම්භ කටයුතු වල ෆයිල් ගහලා 40%ක් ඉවරයි. ෆයිල් ගහපු 60%ක වැඩක් තියෙනවා. ඒ ඉතුරු වැඩ කොටසත් සමඟ කිසිදු පවරා ගැනීමකින් තොරව මොරටුවේ, බොරලැස්ගමුවේ, මහරගම ප්‍රශ්ණ විසඳගන්න පුළුවන්. ඒකට ප්‍රමාණවත් මෙම මුදල්. ගරු නගරාධිපතිතුමනි, අප එම කටයුත්ත කරගෙන යන අතරවාරයේ අපට

පුළුවන් ඒකෙන් වියති රේඛයන් නිර්මාණය කරන්න. ඒත් එක්කම මේක පවරගන්න අවුරුදු 03, 04ක් යන්න පුළුවන්. අපි ඒත් එක්කම කොම්පෝස්ට් හදන්න ගත්තොත් ඒ කොම්පෝස්ට් හදන්න අපිට ෆයිල් ගහන්න වෙනවා මාස 02, 03කට වරක්, අවසාන වශයෙන් අපට මේකට පොටෑසියම්, පොස්පරස් එකතු කරන තව ක්‍රමවේදයක් තියෙනවා ඒ නිසා එම අක්කර දෙකක ප්‍රමාණය ප්‍රමාණවත් වෙන්නේ නෑ. ඊට පස්සේ එයටත් සමගාමීව අපිට තිබෙන සම්පත් භාවිතා කරන්න මේ වැඩසටහනෙන් අවධානය යොමු කළහොත් වැදගත් කියලා මම හිතනවා. එදා සරෝජනි පෝල්රාජ් මන්ත්‍රීතුමියාල ඇවිල්ලා මේකට විරුද්ධව කටයුතු කරද්දි , කතා කරද්දි නගරාධිපතිතුමා අපට කතා කළා මොකක්ද කරන්නේ කියලා. එහිදි තමයි ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය නිර්මාණය කළේ. ඒකෙන් හිටපු ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයා ලකුණු ටිකකුත් දාගත්තා. ඒකට කමක් නෑ. ඒකට අපිට සම්මානයකුත් ලැබුණා. ගරු නගරාධිපතිතුමා අපි එකතු වෙලා වැඩක් කරන්න ඕනා. අපිට මේ සම්බන්ධයෙන් එම්.ආර්.එෆ්. සෙන්ටර්ස් එකක් නෙමෙයි පහක් දාන්න යූ.එන්.ඩී.පී ප්‍රොජෙක්ට් එකේ සල්ලි තියෙනවා. ඒ නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න. ඒත් එක්කම අනිත් පැත්තෙන් ගත්තට පස්සේ අපේ කෙලවරපිටිය සමගාමීව පටන්ගත්ත කසළ බලාගාරය මෙතන ආරම්භ කරන්න. අනිත් කරුණ පාසල් මට්ටමින් ආරම්භ කරපු පිළිසරු පොළ කියන සංකල්පයක් එක්ක ගියාට පස්සේ මේකට විසඳුම් තියෙනවා. එහෙම නැත්තම් ගරු නගරාධිපතිතුමනි, මේ මුදල් ටික ලබන අවුරුද්දේ අපට අවසන් වෙන්න ලබන මාස 06 පළවෙනි එක ඉදිරිපත් කරලා අපි ප්‍රොජෙක්ට් එක සාර්ථක කරගන්න ඕනා.මෙම ඉඩම පවරා ගැනීමට අවුරුදු දෙක තුනක් ගියොත් එහෙම නැවත වතාවක් මහා භාණ්ඩගාරයට හෝ යූ.එන්.ඩී.පී එකෙන් ආවොත් යූ.එන්.ඩී.පී එකට හෝ මේක අපිට කරන්න බැරිව යනවා. ඒනිසා අපට කෙටි කාලීනව කරන්න පුළුවන් දේ තමයි දැනට අපි වැඩ ආරම්භ කරලා 40%ක් වැඩ අවසන් කරලා තිබෙන කසළ බලාගාරයට අවශ්‍ය කටයුතු කිරීම. සියලු ප්‍රශ්ණවලට එතන විසඳුම තියෙනවා. ඒනිසා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේකට වැඩපිළිවෙලක් නෑ කියලා එකක් නෑ. අවශ්‍ය තරම් වැඩපිළිවෙලවල් තියෙනවා. සීරෝ වේස්ට් කරන්න පුළුවන්. වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්නයි අපට අවශ්‍ය වෙන්නේ. ප්‍රභාෂිණී නියෝජ්‍ය නගරාධිපතිතුමිය මේ යෝජනාව ගෙනඒම සම්බන්ධයෙන් අපි සන්තෝෂ වෙනවා. එදා අර්බුදයකින් තමයි අපි මේ ප්‍රශ්ණයක් ආරම්භ කළේ. පාතාලය රජ කරපු බ්ලූමැන්ඩල් කුණු කන්දේ යම් ප්‍රශ්ණේ විසඳුනේ. මේ සියල්ලටම විසඳුම් සහ දැනුම තිබෙන පුද්ගලයින් ඉන්නවා. ඒ නිසා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීනව කරන්න පුළුවන් වැඩටික හරියට පෙළගස්ස ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මේකේ ඉන්සිඩලේටරය ගැන කතා කරද්දි, ඉන්සිඩලේටර මැනුෆැක්චරින් කම්පැණි එක එක්ක සාකච්ඡාවක් කළාද සති දෙකකට කලින්, ඒගොල්ලෝ අපිට මේකේ ප්‍රැක්ටිකල් ඩිස්ප්ලේ එකක් කරන්න තියෙනවා නගර සභාවේ. මේකෙදි අපේ සජිත් දුමින්ද මන්ත්‍රීතුමා හිතන විදිහට, සෙන්ටිග්‍රේඩ් අංශක 800 ඉදලා සෙන්ටිග්‍රේඩ් අංශක 1200ට වෙනකන් මේකේ උෂ්ණත්ව පරාසයක් තියෙනවා. අපිට මේක දාන දේවල විදිහට සාමාන්‍යයෙන් කතා කළේ දවසකට ටොන් 06ක් දහනය කරන්න. ඒක දවසට ටොන් 10 ගානේ වැඩි කරන්න පුළුවන් ඒකට එන්නේ සාමාන්‍යයෙන් මිලියන 300ක වගේ ගාණක්. හැබැයි ඒකෙදි කොම්පෝස්ට් කරන්න දෙයක් ඉතුරු වෙන්නේ නෑ ගරු නගරාධිපතිතුමා. සීරෝ වේස්ට් තමයි. ඒ කියන්නේ ද්‍රව්‍ය ප්‍රතිසාධනය කරනවා, ද්‍රව්‍ය ප්‍රතිසාධනය කරලා ඉවර වෙලා ඉඳුල් සහ ඉතිරිවන ද්‍රව්‍ය තමයි ඉන්සිඩරේට් කරන්නේ. ඉන්සිඩරේට් කරපුවම ටොන් එකක් දහනය කරපුවම ඝණ අඩියක අළු ප්‍රමාණයක් තමයි ඉතිරි වෙන්නේ. එතකොට නැවත කොම්පෝස්ට් කරන්නවත් පරිසරයට මුකුත් එකතු වෙන්නේ නෑ. පොඩි අළු ටිකක් තමයි තියෙන්නේ. වතුර පාරක් ගහලා සුද්ධ කරන්න

පුළුවන්. ඉතාම සංකීර්ණ ක්‍රමයක්, මේ වගේ එකක් එනවානම් ඇත්තටම ධාරිතාව වැඩිකළොත් මම හිතන්නේ කොළඹ දිස්ත්‍රික්කයටම කරන්න පුළුවන්. ඒකයි ඒකේ තියෙන වටිනාකම.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. චන්දන පී.විතානගේ මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කසළ කළමනාකාරණය සම්බන්ධයෙන් ඉතා හොඳ යෝජනාවක් ඇවිල්ලා තියෙනවා. නමුත් විශේෂයෙන් මේ කසළ කළමනාකරණය හරහා වෙන්නේ ඕනේ නාගරික ජන ජීවිතයටත් ඒ හා සම්බන්ධව යම් බලපෑමක් වෙනවා නම් අපි එයත් තක්සේරු කරන්න ඕනා. ඒනිසා සක්‍යතා අධ්‍යයන වාර්තාවක් කැඳවීම ඉතාම වැදගත්. මම හිතන්නේ මේ වගේ ලොකු ප්‍රොජෙක්ට් එකකදි මූලික විය යුතු දෙයක් මම එය දැක්කේ නෑ මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මේ අවස්ථාවේ කාලෝචිත යෝජනාවක් හැටියට මම දකිනවා. විශේෂයෙන් විවිධ අදහස් මතුවුණා. අදහස් හැම එකකටම අපි ගරු කරනවා. නමුත් මම හිතනවා යම් දෙයක් ක්‍රියාත්මක කරන්නට ගියාම හැම අදහසක්ම බල බල හිටියොත් කරන්නට බැරිවෙයි කියලා. මේ ක්‍රියාත්මක කරන්න ගත්ත වැඩසටහන හොඳයි. මක්නිසාද මොරටුවේ පර්චස් 10ක් හොයාගන්න බෑ නගර සභාවට අපිට අපේ කටයුතු කරගන්න. අක්කර දෙකක් හරි ලැබෙනවා නම් ලොකු රුකුලක් වෙනවා අපේ කටයුතු ටික කරගෙන යන්න. අක්කර හයම ඉල්ලුවොත් ශයිලොක්ලා වගේ මස් රාත්තලම ඉල්ලුවා ඒ නිසා දෙකක්වත් දෙන්න බෑ වගේ ප්‍රශ්ණයක් ආවොත් ඒකත් අපිට නැතිවෙයි. අපද්‍රව්‍ය ටොන් 190ක් පමණ දෛනිකව අපිට එකතු වෙනවා. දිරන කසළ ප්‍රමාණයට ඊට වඩා අඩුයි. අපි කියමු මේ අක්කර දෙකෙන් අපිට දිරන කසළ ටික හරි කළමනාකරණය කරලා පොහොර බවට පත්කරලා යම් ආදායමක් ලබාගන්න පුළුවන් කියන විශ්වාසය අප තුළ තිබෙනවා. මේක කාලෝචිතයි, ඇත්තටම අගය කිරීමක් කරනවා. මේ යෝජනාව සඳහා සර්ව ජන බලවේගය වශයෙන් ඡන්දයත් භාවිතා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව කාලීන යෝජනාවක්. ඔබතුමා කිව්වා ඔබතුමාලට ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය හරහා ලිපියක් ලැබුණා කියලා. මට දැනගන්න පුළුවන්ද එම ලිපිය ඔබතුමාලට ලැබුණේ කවදද කියලා. ඔය ඉල්ලීම කළේ කවදද කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, රැස්වීමක් තියලා සාකච්ඡාවකට කැඳෙව්වා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, කවදා වගේ දිනයක ද,

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, කොමසාරිස්තුමිය දිනය කවද්ද කියලා මතකද, රැස්වීමට අපි ගියේ. ගිය බදාදා තමයි මේ රැස්වීමට යන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මේක ඉතා විශාල ව්‍යාපෘතියක්. අදහසට එකඟයි. නමුත් මම හිතන්නේ මේ වගේ විශාල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විශාල වශයෙන් සාකච්ඡා විය යුතුයි.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, අපි සාකච්ඡා කරන්න අවස්ථාවක් දෙන්නම්. දැන් අපිට ඕනකම තියෙන්නේ මේ භූමිය ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ පවරා ගැනීම. ඊළඟට අපි සැලැස්ම කතා කරමු සැලැස්ම කොහොමද ඒ සඳහා හදාගන්නේ කියන එක.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, භූමිය නීර්ණය කරනකොට චන්දන මන්ත්‍රීතුමා කිව්වා සක්‍යතාව වාර්තාවක් තියෙන්න ඕනේ කියලා. භූමියක් තිබ්බා කියලා ඒක එකපාරටම පවර ගන්නත් බෑ. එම ඉඩම වටා ජනතාවට විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ ව්‍යාපෘතිය හරහා ජනතාවට ගැටලු වෙන්නත් බෑ. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා මහා නගර සභා ආඥා පනතේ 131 වන වගන්තිය හරහා පැහැදිලිව කියනවා කසළ බැහැර කිරීම සඳහා උපකරණ, ස්ථාන කොහොමද වෙන්නේ කරන්නේ ඕනේ කියන කාරණය. නාගරික මන්ත්‍රීවරුන්ගේ අවධානය වෙනුවෙන් 131 වන වගන්තිය මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න කැමතියි. මෙම ව්‍යාපෘතියේ අදහස හොඳයි. හැබැයි මෙය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව මීට වඩා සාකච්ඡා කළ යුතුයි කියලා කියනවා.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීතුවරුනි, බොහොම ස්තූතියි. අපි දැන් යම් වැඩසටහනකට ඇතුළත් වෙන්න උත්සහ කරනවා. ඒ වැඩසටහනේ දී අපිට බොහෝ දේවල් තිබෙයි අපිට කතා කරලා ජනතාවට බලනොපාන විදිහට සියලු එකඟතාවයන් ඇතුළේ. ඒ සැලැස්ම අපි සියලු දෙනාම කතා කරලා හදමු. ඒකේ ගැටලුවක් නෑ. අපිට ඉක්මණට කරගන්න ඕනේ, එගොල්ලෝ ඉක්මණින් ඉල්ලනවා ප්‍රතිපාදන වෙන්කරන්න මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ සභා රැස්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 13(ඌ) වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති අංක 05(2) යෝජනාව සඳහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා

18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරුන් මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ සභා රැස්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 13(ඌ) වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති අංක 05(2) යෝජනාව සඳහා පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
19. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් එම්.මැන්දිස් මහතා

මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ සභා රැස්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 13 (ඌ) වගන්තිය යටතේ ඉදිරිපත් කළ 05(02) දරණ යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

## 06. 2026 ජුනි මස ස්ථාවර කමිටු වාර්තාවල නිර්දේශයන් සලකා බැලීම

**06(01) 2026.06.05 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, අංක 02(1) ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාගෙන් සාකච්ඡාවක් ඉල්ලීම සම්බන්ධයෙන් සඳහන් වෙලා තිබුණා. සාමාන්‍යයෙන් ඉඩම් පවරා ගැනීමේදි සමහර ඉඩම්වල කොන්දේසි තියෙනවා. මම කියන්න කැමති ස්ටේඩියම් එකේ ප්‍රශ්ණය සම්බන්ධයෙන්. ඒ අවස්ථාවේදීත් මොරටුව නගර සභාවේ ඉඩමක් පවරා ගන්නා විට ඒ සම්බන්ධයෙන් ගැසට් කිරීමක් සිද්ධවුණා. මේ පරණ ඔප්පුවල කොන්දේසි තියෙනවා. ඒවා අලුත් ඔප්පුවට යනකොට, හිමිකම් සහතිකයට යනවිට ඒවා ගැසට් කළ යුතුයි. සභාවේ වගකීම තියෙනවා, ඔබතුමාලගේ වගකීම තියෙනවා ඒ කොන්දේසි අනිවාර්යයෙන් ගැසට් වෙනවද කියන එක සම්බන්ධයෙන්. ගැසට් වුණේ නැතිවුනොත් ඒක අයිතිය පිළිබඳ ප්‍රශ්ණයක් වෙනවා.ඒක පළමුවෙන ගැටලුව. දෙවැනි ගැටලුව 2(3) කරුණ සම්බන්ධයෙන්. මේක අපි දිගින් දිගටම කතා කරනවා. පාරක් පවරා ගැනීම සම්බන්ධයෙන්. අපි මෙතන සභාවේදි සාකච්ඡා කළා මේක පළාත් සභාවට හා ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කළ යුතුයි කියලා. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැතුව ඉංජිනේරුතුමාගෙන් ප්‍රොසස් එකක් දානවා.ඒකත් නීතියට පටහැනියි. සිද්ධවිය යුත්තේ මේක ඇප් එකේ කියනවා නම් කළ නොහැකි කියලා ඔබතුමන්ලට කළ හැක්කේ ඒ සම්බන්ධයෙන් පළාත් ආණ්ඩුකාරතුමාගෙන් නිර්දේශයක් ලබාගැනීමයි. නමුත් ඒක සිද්ධවෙන්නේ නැතුව ඉංජිනේරුතුමාගෙන් නිර්දේශයක් ලබාගැනීමයි. ඒ ඉංජිනේරුතුමාගෙන් ලබාගත් නිර්දේශයත් නීතියට පටහැනියි. මම ඉල්ලීමක් කරන්න කැමති නැවත මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාට ලියන්න කියලා. මේ දාලා තිබෙන ප්‍රොසස් එක නීතියට පටහැනියි. ඊළඟට 2(6) කරුණ යොමු කරන්න කැමැති නීති නිලධාරිණිය වෙත. වඩු හිමියන්ගේ සෞභාග්‍යා සමිතිය විසින් කරනු ලබන ඉඩමේ අයිතිය සම්බන්ධයෙන්. එහි එක් තැනක සඳහන් වෙනවා මෙම ඉඩම වරිපනම් ලෙජරයට අනුව මොරටුව මහා නගර සභාවේ භුක්තිය යටතේ පවතින ඉඩමක් වන අතර, එහි මුල් ඔප්පු හා හිමිකම් ලියවිලි අප සතුව නොමැත. නමුත් අප සතු නොමැති අපේ ඉඩමක අලුතින් කඩ කාමර දෙකක් ඉදිකිරීමට අනුමැතිය ඉල්ලන්නේ. මේ අප සතු ඉඩමක් කියලා නීර්ණය කරනවා නම් මේ සම්බන්ධයෙන් අපි අඩුම ගානේ ලීගල් ලෙටර් එකක් හරි එන්තරවාසියක් හරි යැවිය යුතු නැද්ද. ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් නගරයේ විවිධ වූ අවස්ථාවන් සඳහා ඉල්ලීම් කරනවා. පශු වෛද්‍ය කාර්යලයක් සඳහා ඉල්ලීමක් කරනවා 2(7) කරුණ මගින්.මේකත් මොරටුව මහා නගර සභා සතු ඉඩමක්, එහෙම දෙනවා නම් බදු පදනම මත පමණයි දෙන්න ඕනේ. 2 (22) කරුණ මගිනුත් ඉල්ලනවා , "ප්‍රජා ශක්ති" දිළිදුකම තුරන් කිරීම සඳහා කල්දෙමුල්ල, ඊබට් පටුමග ප්‍රජා ශාලාවේ අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීමට. ඒ කියන්නේ කඩ ඉදිකිරීමට. ඇත්තටම මේවා ගැටලු. අපි සතු ඉඩම් මේ වගේ ව්‍යාපෘති සඳහා ලබාදෙනවද, මොකක්ද මේ සම්බන්ධයෙන් නගර සභාවේ ප්‍රතිපත්තිය. ලබාදෙනවා නම් නගර සභාවේ ප්‍රතිපත්තියක් තියෙන්න ඕනේ ලබාදෙන සෑම ඉඩමක්ම බදු පදනමින් දෙනවා කියලා. එහෙනම් මොන බදු පදනමින්ද, අවුරුදු 30ක්ද, අවුරුදු 60ක්ද, අවුරුදු 99ක්ද, මොකක්ද බදු කොන්දේසි, මෙතනදි නිතරම වෙන්නේ රජයෙන් යම්කිසි ව්‍යාපෘතියක් ගෙනාවම, දිළිදුකම තුරන් කිරීම හොඳයි, ප්‍රජා ශක්ති ව්‍යාපෘති හොඳයි, නමුත් නගර

සභාව සතු ඉඩම්වල අලෙවි මධ්‍යස්ථාන පිහිටුවන කොට අවසානයේදී මෙම භූමි නගර සභාවට නැති වෙලා නැවත නඩු කියලා අත්පත් කරගැනීමටයි සිදුවෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(22), මේකේ තියෙනවා මෙම සභාවේ එකඟතාවය දන්වා මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීමට කටයුතු කරමින් පවතින බවට. අපි මේ සඳහා එකඟතාවය දීලා ඉවරද ගරු නගරාධිපතිතුමා. කොහොමද එකඟතාවය ගත්තේ, කඩ කාමර ගහනවද කියන එක අපි දන්නේ නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේකේ තියෙන්නේ මම කියන්නම්, උක්ත කරුණ සලකා බැලූ කමිටුව, මොරටුව ප්‍රාදේශීය ලේකම් විසින් 2026.05.06 දිනැතිව යොමු කර ඇති ලිපිය මගින් කර ඇති ඉල්ලීම සම්බන්ධව සාකච්ඡා කළ කමිටුව "ප්‍රජා ශක්ති" දිළිඳුකම තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරයට අදාළව කල්දෙමුලල්, ඊබට් පටුමඟ ප්‍රජාශාලා භූමියේ අලෙවි මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා පමණක් මෙම සභාවේ එකඟතාවය දන්වා මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීමට කටයුතු කරමින් පවතින බවට කමිටුව වාර්තා වූ බැවින්, එම ලිපිය මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කිරීමට නිර්දේශ කරමි. මම අහන්න කැමතියි අපි මේක සභාවේ සාකච්ඡා කළෙත් නෑ, මොරටුව මහා නගර සභාව සතු ඉඩමක, ප්‍රජාශාලාවක කඩ ඉදිකරන්න දෙනවා නම් මොකක්ද ඒකේ ප්‍රතිපත්තිය. බදු දෙනවද? බදු අයකිරීමක් සිද්ධවෙනවද?

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි දැන් මේ සභාවේ යෝජනාවක් සභාවක් සම්මත කළා. දැන් මේ වෙනකොට අපි සතු විශාල දේපළ ප්‍රමාණයක් තිබෙනවා කිසිම මහජන සේවයකට යොදා ගන්නේ නැති වල් බිහිවෙමින් තියෙනවා. කිසිම කටයුත්තක් වෙන්නේ නෑ. ඒවා මහජනයාගේ දේපළ. දැන් මේ එන්නේ මහජනයාගේ දුප්පත් කිරීම තුරන් කිරීම සඳහා මහජනයා නගා සිටුවන වැඩසටහනක්. අපි ඒ යෝජනාවේදි කිව්වා අපි දේපළවලට අපේ අයිතියට කිසිදු හානියක් සිදුනොවන ආකාරයේ අපි තෝරාගත්, ඒ තෝරා ගැනීම සිදුකළ යුත්තේ අපගේ අදාළ ඉංජිනේරුවරු. ඔවුන්ගෙන් මෙම කටයුත්ත කළ හැකිද, නොහැකිද යන්න පිළිබඳ වාර්තාවක් අරගෙන ඒ අනුව තමයි අදාළ කටයුත්ත කරන්නේ.මෙය අපි කළ යුතුයි. යම්කිසි වියදමක් දරලා අපට ඒ භූමිය, ජනතාවගේ යහපත වෙනුවෙන් යමක් කරනවා. පුද්ගලිකව කාටවත් ඉඩමේ අයිතිය යන්නේ නෑ. ප්‍රාදේශීය ලේකම්ට අයිති දේවලුත් අපිට දෙන්න සූදානම්. නගර සභාවට පවරා දෙමින් ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් පාවිච්චි කරනවා. හැමදාම මෙම ඉඩම් වල් බිහිවෙමින් එකිනෙක්කෙනා අල්ල ගනිමින් තිබෙන්නේ. ඔබ හොඳට හොයලා බලන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, කටයුතු කිරීම පිළිබඳ විවාදයක් නෑ. අදහස හොඳයි. මම කියන්නේ නගර සභාවේ ඉඩම් ආරක්ෂා කර ගැනීමට නිසි පියවර ගන්න කියන එකයි. බදු පදනම මතද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දෙන්නේ කියන එකත් මෙම සභාවට දැනුම් දෙන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඒක අවසානයේ නිවැරදි ලෙස එකින් එක මේ සභාවට ගේන්නම්. තාම ඒ දීමට අවශ්‍ය කරන අවසන් වාර්තාව නෙමෙයි. කමිටුවේ සාකච්ඡා කරලා කොහොමද ඒක කරන්නේ ඒකට මොන ආකාරයට ද අපි ඒ එකඟතාවය පළ කරන්නේ. යෝජනාවේ කියලා තියෙන්නේ සභාවේ දේපළ වල අයිතිය කිසි ලෙසකින් අත් නොහැර.අපේ අයිතියේ තියෙන්නේ. මේක හරහා

උත්සහ කරනවා අපේ විශාල ඉඩම් ප්‍රමාණයක් අපි අපේ කිච්චට තහවුරු කරන්න ඔප්පු නෑ. අපිට මේවම පාවිච්චි කරන්න වෙනවා මේ ඉඩම්වල අපේ අයිතිය සනාථ කරන ක්‍රියාවලියකුත් මේ හරහා හදාගන්න. අපිට තිබෙන වටිනා ඉඩමක් වන මිහිරිපැන්නේ ඉඩම සඳහා ඔප්පු නෑ.බොහො ක්‍රීඩාංගණ තියෙනවා ඔප්පු නෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා අපට කියනවා මේ ඉඩම්වල සමහර ඒවා වල ඔප්පු නෑ කියලා. නීත්‍යානුකූලය හිමිකම්පාන්න විදිහක් නෑ කියලා. එසේ නම් හිමිකම්පාන්න හිමිකමක් නැති ඉඩමක් අපි තව කාටහරි දුන්නට පස්සේ අපි ආපසු කොහොමද පවර ගන්නේ. දැන් බලන්න උදාහරණයක් අපි දුන්නා අඟුලාන පොලීසිය. අදටත් ගන්න බෑ. ආදායමකුත් නෑ අපිට. ඒවගේ විශාල ප්‍රමාණයක් තියෙනවා අපිට අහිමි වෙච්ච දේවල්. ඒනිසා ගරු නගරාධිපතිතුමා මම කියන්නේ මේ ගැන සුවිශේෂී සාකච්ඡාවක් කරන්න කියන එකයි. ප්‍රාදේශීය ලේකම්ට ඉඩම් තියෙනවා ඕනෑ තරම්. රජයේ ඉඩම් තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් යටතේනේ. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්ට දෙන එකේ තේරුමක් නෑ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි ප්‍රාදේශීය ලේකම්ට මුකුත්ම දෙන්නේ නෑ. මේ දෙන්නේ අදාළ ගමේ ජනතාවට. ප්‍රාදේශීය ලේකම් කියන්නේ රජයේ ප්‍රධාන වගකිව යුතු නිලධාරියා. නගර සභාව සතු හැමදේම ජනතාවට. දැන් අපේ ඇස් පනාපිට තියෙනවා අපි නඩත්තු කරන්නෙත් නෑ සේවා සපයන්නෙත් නෑ වල් බිහිවෙමින් යන බොහෝ තැන්. අබලන්වන ගොඩනැගිලි. දැන් ගැටලු ඇවිල්ලා තියෙන තැන්වල භූමියට බැහැලා බලපුවම, අපේ චූලරත්න මහත්මයා ඕනා කිච්චේ ඔන්න ඕකට. විශාල මහන්සියක් ගනිමින් යම් පමණකින් අපිට අපේ අයිතිය සනාථ කරන මහන්සියක හිටියා. අපි එක පැත්තකින් යන්න ඕනා මේ දේපලවල අපේ අයිතිය සනාථ කරගැනීමට, අපි නම් දෙන්නේ අයිතිය එතනින් අපට සනාථ වෙලා. අපි තමයි මොකක් හරි බදු ගිවිසුමකින් හරි කාටහරි දෙනවා. දෙන කෙනාගෙනේ අයිතිය පිලිගැනෙන්නේ. මම කියන්නේ යම් උපක්‍රම ක්‍රියාවලියක් ඇතුළේ මේ නගර සභාව සතු දේපළ කාටවත් නොදී ජනතාවගේ යහපත වෙනුවෙන් යොදා ගැනීම තමයි අරමුණ. දැනට සැහෙන්න දේපළක් පෞද්ගලික අය අත්පත් කරගෙන ඉන්නේ. මේ ඉතුරු ටික ඒ තත්ත්වයට යන්න නොදී රැකගැනීම තමයි අපේ ප්‍රතිපත්තිය.අපි ඒ කටයුත්ත කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉඩම් කමිටුවේ 2(22), කල්දෙමුල්ල ප්‍රජා ශාලාවේ මෙම "ප්‍රජා ශක්ති" දිළිඳුකම තුරන් කිරීම සඳහා යෝජනාවක් ගෙනල්ලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මේ භූමිය මම දන්නා තරමින් නගර සභාව සතු ඉඩමකුත් නෙමෙයි. මේ ප්‍රජා ශාලාව අයත් භූමියේ කොටසක් අයිති විචින් ආයතනයට. මුලින්ම බලන්න ඕනේ මේකේ අපට අයිතියක් තියෙනවද කියලා. දැන් මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාරදෙන්න කලින් මේ ඔප්පුව කොහෙද තියන්නේ කියලා බලන්න ඕනේ. මේකේ පිඹුරුපතේ ප්‍රමාණය කොච්චර ද කියලා බලන්න ඕනේ. මේ වගේ යෝජනාවකට ගමේ ජනතාව ඉල්ලීමක් කරලා නෑ. කවුද ඉල්ලලා තියෙන්නේ. මම ගමේ මන්ත්‍රීවරයා විදිහට මට කවුරුත් කියලා නෑ මේ ප්‍රජා ශාලාව මේ වගේ ප්‍රජා ශක්ති වැඩසටහනකට දෙන්න කියලා. එහෙම ඉල්ලීමකුත් නෑ ගරු නගරාධිපතිතුමා. මම කියනවා මේ යෝජනාව ඇත්තටම කාලීන යෝජනාවක් නෙමෙයි. ඒනිසා කණගාටුයි ජනතාවගේ ඉල්ලීමකුත් නැතුව ඉදිරිපත් කිරිම ගැන. මුලින්ම බලන්න මේකේ පිඹුරුපත කාටද තියෙන්නේ, ඔප්පුව කාටද තියෙන්නේ කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 2(3), ඉංජිනේරුවරයාගේ වාර්තාවක් දාලා තියෙනවා සභාව වෙත පවරා නොගෙන මාර්ග සංවර්ධනය කිරීමේදි පැන නගින ගැටලු සම්බන්ධව. මෙම කරුණ පැහැදිලිව අධ්‍යයනය කළොත් මෙවැනි ආකාරයේ පාරක් පවරා ගැනීමට හැකියාවක් නෑ මා විශ්වාස කරන නීතිමය රාමුව තුළ. මේ තියෙන කොන්දේසි මම කියවන්නේ නෑ දීර්ඝ වේලාවක් යන නිසා. මේ පාරේ සියලු දෙනාගෙම කැමැත්ත අවශ්‍යයි, සියලු දෙනාම අත්සන් කරන්න අවශ්‍යයි, අඩුම තරමේ කවුරු හරි එක් අයකු නොසිටියහොත් හෝ විරෝධතාවය ප්‍රකාශ කළොත් පාර පවරා ගැනීමට හැකියාවක් නෑ. ඒනිසා මේක සම්පූර්ණයෙන්ම වැරදි. මෙය ආයතනයේ නීති නිලධාරි හා අදාළ ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් දාලා තියෙන්නේ. මේක නැවත සලකා බලන්න. මේ කාරණය කරන්න ගියහොත් කිසිම වෙලාවක නගර සභාවට පාරක් පවරා ගැනීමට හැකියාවක් නෑ නීත්‍යානුකූලව හා කාර්ය පටිපාටි වශයෙන්. ඒනිසා මේ සම්බන්ධයෙන් ඔබතුමාලා නැවත අධ්‍යයනයක් කරන්න. උපදෙස් ලබාගන්න කියලා මම යෝජනා කරනවා. ඒවගේම මම කලින් කිව්ව කාරණය නීතිමය කාරණයක් පමණයි. සභාවේ තැනින් තැන මේ සම්බන්ධව සාකච්ඡා කළා. අපි මේ සම්බන්ධව ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේදි දීර්ඝව සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් මෙහි කාරණය තියෙන්නේ මුලින්ම නගර සභාව සතු දේපළ මොනවද කියලා අපි මීට පෙරත් සාකච්ඡා කළා. නගර සභාව සතු දේපළ සම්බන්ධයෙන් යථාවත් කළ ලේඛනයක් අප සතුව නෑ. ඔබතුමාගේ චේතනාවත් සමඟ සීයට සීයක් එකඟයි. මක්නිසාද නගර සභාව සතු වල් බිහිවී ඇති වැඩකට නොමැති ඉඩම් මොරටුව ජනතාවට සේවය කරන්න දෙන්න ඕනා. නමුත් පළමුවෙනි කාරණාව අපිට තියෙන ඉඩම් මොනවද කියලා අපි හඳුනගෙන ඒවායේ අයිතිය හා භුක්තිය තහවුරු කරගන්න ඕනේ. දැන් මේ කියන කාරණාවල, ඉඩම්වල අපිට අයිතිය සම්බන්ධයෙන් ලේඛන ඉදිරිපත් කිරීමට හැකියාවක් නෑ. මේවායේ භුක්තිය අපට දැනට තිබෙනවා නම් අඩුම තරමේ මේ භුක්තිය සනාථ කරලා අයිතිය ලබාගැනීමේ ලේඛනයක් සකස් කරගන්න ඕනේ. ඒ ඇරෙන්න මේ තිබෙන තත්ත්වය යටතේ අයිතිය සනාථ කිරීමට ලේඛණයක් නොමැතිව මේ තිබෙන භුක්තිය ප්‍රාදේශීය ලේකම්තුමා හරහා හෝ කවුරු හරි හරහා දුන්නොත් අවුරුදු 10ක කාලයෙන් පස්සේ කාලාවරෝදය අයිතිය අපට නැති වෙනවා. දැන් මේ ආයතන කමිටුවට එන ගොඩක් නඩු තියෙන්නේ අපිට අයිතියක් තිබුණා හෝ නැතුව යම් තැනැත්තෙක් කාලයක් තිස්සේ භුක්තිවින්දට පස්සේ ඒ අයිතියට අපිට නැතිවෙනවා. මෙහි නීතිමය කාරණය සම්බන්ධයෙන් නීති නිලධාරි හා ආයතන කමිටුවේදි දිර්ඝ වශයෙන් සාකච්ඡා කරමු. පළමුවෙන්ම නගර සභාව සතු දේපළ මොනවද කියලා හරියාකාරව හඳුනාගන්න ඕනේ. ඒවායේ අපිට අයිතිය තියෙනවද හා භුක්තිය තියෙනවද කියලා පැහැදිලිව හඳුනා ගන්න ඕනේ. අයිතිය නැත්තම් ඒ අයිතිය ලබාගැනිමට දැනට තිබෙන භුක්තිය තහවුරු කරලා ලේඛන සකස් කරගන්න ඕනේ. ඉන් අනතුරුව අයිතිය සහ භුක්තිය තියෙන ඒවා පමණක් නිසියාකාරව, අපිට නිකන් දෙන්න හැකියාවක් නෑ. ලිහිණි මන්ත්‍රීතුමිය කිව්වා වගේ, නිසියාකාර බදු ඔප්පුවකට හෝ යම් ආකාරය ලේඛනයක්, මොකද අපේ අයිතිය පිළිඅරගෙන අවසරලාභියෙක් විදිහට තමයි යම් අයෙක් එනවා නම් එන්න ඕනේ. ජනතාවට සේවය කරන්න ඕනේ කියලා මේ දේපළ දීගෙන ගියහොත් ඔබතුමාගේ සත්භාවයම චේතනාව ඉටුවෙන්නේ නෑ. ප්‍රථමයෙන් ඉඩම්වල අයිතිය තහවුරු කරගෙන ඉන් අනතුරුව නිසි ලියවිල්ලකින් ලබාදෙන්න කියන එක තමයි මගේ යෝජනාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔය ප්‍රශ්ණෙම සමහර ගැටලු තියෙනවා. අපි උදාහරණයක් වශයෙන් ගත්තොත් කඩලානේ තියෙන ට්‍රාන්ස්පෝමරය අයිති ඉඩම සමෘද්ධි බැංකුව. මුළු කඩලානම දන්නවා එය නගර සභාවට අයත් ඉඩමක් කියලා. ඒකට කෙනෙක් නඩුවක් දාලා තියෙනවා. එයා ප්‍රකාශණ ඔප්පුවක් හදලා තමයි නඩුව දාලා තියෙනේ. දැන් එහෙම වුණාම මේ මොරටුව නගර සභාව භූමිය ගත්තම අපි හිතමු ඔප්පුවක් නෑ කියලා. කවුරුහරි මේකේ අයිනෙන් ඉල්ලනවා මොකක් හරි හට් එකක් ගහන්න. මන්ත්‍රීතුමා කියපු විදිහට අවුරුදු 10ක් දුන්නට පස්සේ ඒ මනුෂ්‍යාන්ට නීතිමයෙන් අයිතිවෙනවානේ නිකන්ම. හැමෝම දන්නවා මොරටුවේ මේ ඉඩම මේ

ඉඩම අපේ කියලා. එහෙමනම් අපි කියන්න ඕනා මේ ඉඩම අපේ උනාට මේකට අපිට ඔප්පුවක් නෑ කියලා ඉස්සරහින් බෝඩ් එකක් දාන්න වෙනවා. එහෙම කරන්න එපා ගරු නගරාධිපතිතුමා. මේක අපේ අයිතිය. අපේ අයිතිය තියාගෙන තමයි කාටහරි පවරනවා නම් පවරන්න ඕනේ. හෙට වෙනකොට ඉදිබැද්ද ප්‍රදේශයේ තියෙනවා නගර සභාව සතු ඉඩම් දෙක තුනක් තියෙනවා ගෙවල් හදපු නැති හිස් ඉඩම්. කවුරුහරි කට්ටියක් එතනින් හදලා ඉවරවෙලා මොකක් හරි සමිතියක් ඒකෙන් ඉල්ලුවොත් මේකේ අයිතිය අපට දෙන්න කියලා ඊළඟට එන පාලනයට කිසිම දෙයක් කරගන්න බැරිවෙනවා. ඒනිසා අයිතියට අපට තියාගෙන, අපි වරිපනම් ගෙවනවද, එහෙම නැත්තම් කැඩැස්තරෙන් මේකට අයිතිය අපට තියෙනවද, අපිට මේකට බිම් සවියක් ගන්න පුළුවන්ද, නැත්තම් කොහොමද මේකට අපි අයිතිය කියන්නේ, එහෙම අයිතියක් තියාගෙන තමයි මේ දෙන්න වෙන්නේ. නිකන් ඔහොම ඉල්ලන ඉල්ලන ඉඩමකට දෙන්න ගියොත් විශාල ප්‍රශ්ණයක් වෙනවනේ සභාව සතු ඉඩම්වලට.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, මේකට කාලයක් යන නිසා මම විවාදයකට යන්නේ නෑ. මොකක් හරි එකක් තියෙනවා නම් එහෙම දීපු එකක් කියන්න. මේක අද ඊයේ වෙච්ච දෙයක් නෙමෙයි. කඩලානේ ඔය කියන ඉඩම නගර සභාව සතු කියලනේ කියන්නේ. හැබැයි මේකේ තිබුණේ මොකක්ද,

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ට්‍රාන්ස්පෝමරය,

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ට්‍රාන්ස්පෝමරය ඉඩමට පස්සේ

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, සමෘද්ධි බැංකුව,

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, සමෘද්ධි බැංකුව කාගේ යටතේද?

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යටතේ

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, කවුද දුන්නේ,

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, සමෘද්ධි බැංකුවට දීලා තියෙන්නේ අපි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්නකෝ, මේකට නඩුවක් ගියා. අදාළ මනුෂ්‍යයා නඩුවක් දැම්මා. නගර සභාව තමයි මැදිහත් වුණේ. අධිකරණය අපෙන් ඇහුවා මේ ඉඩම ඔගොල්ලන්ට දෙන්න ආරක්ෂා කරගන්න පුළුවන්ද කියලා. ක්‍රමවේදයක යොදන්න. මේ ඉඩම් ආරක්ෂා කරගන්න ක්‍රමවේදයක් හදන්න අපි මොකක්ද කරන්නේ. අපි මොකක්වත් සින්නක්කර දීලා නෙමෙයි. අදිකරණයෙන් ඒ වේලාවේ දීපු නියෝගයත්, ඒක ආරක්ෂා කරගැනිමේ ක්‍රියාමාර්ගයත් ලෙස අපිට ඒ වෙලාවේ ප්‍රායෝගික තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්ට කියනවා මේ කටයුත්ත කරන්න. එයා එකහයි.අපි මේ ඉඩම කාටවත්ම දීලා නෑ. තිබ්ච්ච කායාීලය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දීපු

මොකක්හරි විදියක් තියෙන්න ඇතිනේ. අධිකරණය විසින් දීපු නියෝගයකට ඉඩම ආරක්ෂා කරන්න. නීති නිලධාරිණියට පුළුවන්නම් මේක පැහැදිලි කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නීති නිලධාරිණිය පැහැදිලි කරන්න ඉස්සෙල්ලා මම ඌර්ණ පූර්ණයක් කරන්නම් ඔබතුමාගේ කතාවට. දැන් ඉස්සර මොරටුව නගර සභාවනේ. නගර සභාව කාලේ කටුබැද්ද කැම්පස් එක ඉස්සරහ බෝගහ ලඟ තිබෙන ඉඩම, ඒකත් අපි දැන් අතහැරලා දාලා තියෙන්නේ. ඒකාලේ ට්‍රාන්ස්පෝමර්ස් හැදුවේ නගර සභා ඉඩම්වල. නගර සභාවනේ විදුලිය පාලනය කළේ. මේකත් ට්‍රාන්සපෝමරයක් තිබුණු ඉඩමක්නේ. එවිට එම ඉඩමේ භුක්තිය විඳලා තියෙන්නේ නගර සභාව. ට්‍රාන්සපෝමරය තිබ්බා කියන්නෙම නගර සභාවේ භුක්තිය. ඒ කාලේ ජීවන් කුමාරණතුංග ඇමතිතුමා හිටියේ. ඒ කාලේ සමෘද්ධි ඇමති විදිහට හිටයේ ජීවන් ඇමතිතුමා, ජීවන් ඇමතිතුමා නගරාධිපතිට කතා කරලා සමෘද්ධියට ඉඩමක් දෙන්න කියලා කිව්වම ප්‍රාදේශීය ලේකම්ට මෙම ඉඩම දීලා කිව්වා හදන්න කියලා. ඒකේ සමෘද්ධි බැංකුව හැදුවා. සමෘද්ධි බැංකුවට ඉඩකඩ නැති නිසා තමයි වෙන තැනකට ගියේ. සමෘද්ධි බැංකුව වෙන තැනකට ගියත් එතන හැදුවේ ප්‍රාදේශීය ලේකම් කියලා එහි හිමිකම ප්‍රාදේශීය ලේකම්ට යන්නේ නෑ. හිමිකම අපේ. නමුත් නීතිඥතුමිය ඒකට නඩු කියන්න බෑ කිව්වා. ඒ නඩුවට අපිට ඉදිරිපත් වෙන්න බෑ කියලයි මුලින්ම කිව්වේ. අපේ ආයතන කමිටුවේ නීතිඥ මහත්වරු දෙදෙනාගේ මැදිහත්වීම මත තමයි ඔය නඩුව පටන් ගත්තේ. එතුමන්ලට ස්තුතිවන්ත වෙනවා. එතුමාලා දෙන්නා තමයි උපදෙස් දුන්නේ මේකට නඩු කියන්න මේක අපට ගන්න පුළුවන් එකක් මේක කරන්න කියලා. ඒක මහා විශාල වටිනාකමක් තියෙන ඉඩමක්. මම කියන්නේ ඔන්න ඕක තමයි ප්‍රශ්ණේ. විදුලි මුරපොළවල් තිබුණු නිසා අපි දන්නවා අපේ කියලා. එහෙම නැති අපේ අනිත් හිස් ඉඩමක් දුන්නට පස්සේ හිමිකම කියන්න විදිහක් නෑ. අපිට විවිධ ක්‍රමවලින් ආපු ඉඩම්. සමහර වෙලාවට ඔප්පු නෑ මේවලට. ඔබතුමා කිව්ව එක ඇත්ත. ඒනිසා මම කියන්නේ කාටහරි අපි දෙනවා නම් අපිට ඔප්පුවක් තියෙන එකක් දුන්නට කමක් නෑ. අපිට ගන්න පුලුවන්නේ ඔප්පු තියෙනවනේ. නමුත් අපිට හරියට අයිතිය කියාගන්න බැරි භුක්තිය විඳින අපේ කියලා කියන ඉඩම් දෙන එක හරිම අවධානම්. ඉන්පසු එගොල්ලන්ට භුක්තියට යටත් වෙනවා. මොකද හේතුව ඔබතුමා ඔය පුටුවේ ඉන්නවා කියන්නේ ඔබතුමා වගකියන්න ඕනේ නගර සභාවේ සියලු දේපළවලට. මේක පරිස්සමින් කරන්න ඕනා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලූනාව තානායම වත්ත ගන්න පුලුවන්නේ. ඒක දීලත් ගන්න පුලුවන් වුණාද? නැහැනේ.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.05 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |

| | | | |
|---|---|---|---|
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.05 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |

21. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

**2026.06.05 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා)

**06(02) 2026.06.05 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සොයිසාපුර දිවා සුරුකුම් මධ්‍යස්ථානය 02(06) කරුණ මෙහි තියෙනවා තෙලවල සිඟිති හමුව පෙර පාසල. මොරටුව මහා නගර සභාවේ තීරණ අංක 06(02) 02(06) 2025.08.12 දිනැති කමිටු තීරණය හා සම්බන්ධවයි. මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුව මඟින් පත්කළ අනු කමිටුව මඟින් සිදුකළ ස්ථානීය පරීක්ෂාවට අනුව තෙලවල සිඟිති හමුව පෙර පාසල සම්බන්ධයෙන් සිදුකර ඇති යෝජනාව වූයේ හැකි ඉක්මනින් මෙම පෙර පාසල ඉගෙනුම ලබන දරුවන් සහ පාලිකාවන් යාබද දන්දෙනියවත්ත පෙර පාසලට හා බොරුපන සමඟි තරු පෙර පාසලට ආසන්නතාවය අනුව අනුයුක්ත කළ යුතු බවයි. ගරු නගරාධිපතිතුමනි, තෙලවල පදිංචිකරුවෙක් හැටියට මම බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා මේ තෙලවල මිනිස්සු දන්දෙනියවත්තට යන්නේ නැහැ. ඒක ප්‍රායෝගික නැහැ. දන්දෙනියවත්තේ කෙනෙක් තෙලවලට එනවා මිසක් තෙලවල පෙර පාසලේ ඉන්න ළමයෙක් දන්දෙනියවත්ත පෙර පාසලට අරගෙන යන්නේ නැහැ. ඒක හරියට වේල්ස් කුමර විදුහලේ ළමයෙක්ව කටුබැද්ද බෝධිරාජ විදුහලට එක්ක යනවා වගේ වැඩක්. ඒ නිසා එහෙම කරන්නේ නැහැ. මොකද හේතුව ඒ පහසුකම්, දුර ඒවා බලපානවා. ඊත් ඒක්කම තමයි බොරුපන පෙර පාසල. 4 වන පටුමගේ තමයි බොරුපන පෙර පාසල තියෙන්නේ. ඉතා විශාල දුරක් ගමන් කරන්න සිද්ධ වෙනවා බොරුපන පෙර පාසලට තෙලවල ඉන්න මිනිස්සු. මොකද ප්‍රවාහන පහසුකම් ඇත්තෙම නැහැ. බස් එකක් නැහැ පයින් තමයි යන්න ඕන. මේ තීන්දු තීරණ ගන්නකොට අඩුතරමේ මේවා කතා කරලා හරි ගන්න ඕන තීන්දු. ඒ නිසා කරුණාකරලා දැනට මේක පවතින්නේ පන්සලේ මම දන්න විදිහට. පන්සලෙන් මේක ඉවත් කරගන්න කියලා කිවුවාද? අපිට ඒක දැනගන්න ඕන නගරාධිපතිතුමා. අපි සභාපතිතුමියගෙන් අහන්නේ හමුදුරුවෝ මේක අයින් කරගන්න කියලා කිවුවාද?

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, 2025.07.04 වෙනිදා අවුරුද්දකට කලින් මම ඇතුළුව මහජන උපයෝගිතා කමිටුව උප නගරාධිපතිතුමියත් සමඟ නිරීක්ෂණ චාරිකාවක් ගියා මොරටුවේ තියෙන පෙර පාසල් 17 තුළ තියෙන තත්ත්වයන් සම්බන්ධව පරීක්ෂණයක් කරන්න. එතකොට අපි මේ තෙලවල මහා පන්සලේ තියෙන පෙර පාසලට ගියා. එතකොට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එතැනට ගිය හැම මන්ත්‍රීවරයෙක්ගේම අදහස මේ දරුවන්ට ඉගෙනුම ලබන්න කිසිසේත්ම සුදුසු නැති පරිසරයක

අපි මොරටුව මහා නගර සභාව විසින් දරුවන් රදවා තැබීමක් සිදු කරනවා. පන්සලේ දාන ශාලාවේ තමයි මේ පෙර පාසල පවත්වාගෙන යන්නේ. එතකොට පන්සලේ උත්සව තියෙන කාලයේ දී දරුවන්ට පෙර පාසල තියන්න බැහැ. ඊළඟට දරුවන්ට ඉගෙනුම් ආධාරක මුල් ළමාවිය සංවර්ධනය වන දරුවන්ගේ 85%ක් වර්ධනය වෙන්නේ මේ කියන පෙර පාසල් අවධියේ දී කියලා කියනවා. එතකොට ඒකට අවශ්‍ය කරන කිසිදු තත්ත්වයක් මේ පෙර පාසල තුළ පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක තමයි දරුවෝ 17 දෙනෙක් අපි ඒ පෙර පාසලේ තියලා තිබුණේ. ඒ වගේම ඒ ඉදිරිපිට තණකොළ වැවිලා සෙල්ලම් මිදුල තියෙන්නේ පොල් ගස් යට. ඒ වෙනකොටත් පොල් අතු එල්ලෙනවා. අපේ ඒ ගිය රියදුරු මහතා පොල් අතු ඇඳලා බිමට දැම්මා මේ මන්ත්‍රීවරුන්ට මතක ඇති. එතකොට අපි ඒ අවස්ථාවේ ගත්ත තීරණය තමයි මේ වගේ තත්ත්වයක අපිට මහා නගර සභාවක් යටතේ පවතින පෙර පාසලක දරුවෝ තියන්න බැහැ. ඒක කිසිසේත්ම සුදුසු නැහැ අනාරක්ෂිතයි. ඒ නිසා මේ දරුවන්ව හැකි ඉක්මනින් මේ යාබද තියෙන පෙර පාසල් දෙකට යොමු කරන්න අපි මේ පෙර පාසල තියෙන ස්ථානය සම්බන්ධයෙන් තීරණයකට එනකන් කියලා. නමුත් නගරාධිපතිතුමා මේ පෙර පාසලේ දෙමාපියෝ ගුරුවරුන් අපිට කමිටු නිර්දේශයට ඒ ලිපි යොමු කළා. ඒ ලිපි යොමු කරලා ඔවුන් ඉල්ලා සිටියා මේ පෙර පාසල් දුර වැඩියි මේ දෙකට දාන්න අකමැතියි. ඒ නිසා මෙයට වෙනත් විකල්පයක් ලබා දෙන්න කියලා. ඒ විකල්පයට අනුව තමයි අපි පසුගිය දින නිරීක්ෂණ චාරිකාවක් කළා අපිට මේ පෙර පාසල් තෙලවල ප්‍රදේශයේ තියන්නත් ඕන, හැබැයි අර තියෙන්න ඕන ස්ථානයේ තියන්නත් බැහැ. ඒ අනුව අපි අනු කමිටුවක් පත් කරලා තමයි චාරිකාව යන්න යොදා ගත්තේ. නමුත් එදා එකතු වුණේ යෝගේෂ මන්ත්‍රීතුමයි මමයි ප්‍රජා සංවර්ධන නිලධාරී, ලේකම්තුමයි ඇතුළු පිරිසක් පමණයි. එතකොට අපි මේක තෙලවල පුස්තකාල ගොඩනැඟිල්ලේ වැඩි ප්‍රමාණයක් මේ දරුවන් වෙනුවෙන් වෙන් කරලා අපි ඊට පස්සේ මේක යෝජනාවක් විදියට ගත්තත්, තෙලවල පුස්තකාල ගොඩනැඟිල්ල ඉක්මනින් හදලා දරුවෝ එතැනට ගෙනිහිල්ලා තියන්න. පෙර පාසල තිබුණ අනාරක්ෂිත තත්ත්වයට තමයි 2025.07.04 වෙනිදා තමයි අපි තීරණය දුන්නේ නිර්දේශ නිකුත් කළේ. මේ දරුවෝ යාබදව තියෙන පෙර පාසල් දෙකට අනුයුක්ත කරන්න කියලා. නමුත් දෙමාපියන්ගෙයි ගුරුවරුන්ගෙයි ඉල්ලීමට අපිට ඒක කරන්න බැරිවුණා. ඒ නිසා තමයි අපි දැනට තියෙන ඉඩකඩ පහසුකම් අනුව තියෙන ස්ථානයකට ඉක්මනින්ම මේ දරුවෝ ගෙනියන්න කටයුතු යොදලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම අවුරුදු 18ක් ගුරුවරයෙක්. ඒ නිසා ළමයින්ට අධ්‍යාපනය ලබන්න පුලුවන් ක්‍රමවේදය, පරිසරය ඒ සියලුම දේවල් අපි හොඳට දන්නවා. මොකද පාසල් ගුරුවරයෙක් හැටියට අවුරුදු 18ක් සේවය කරලා තියෙනවා මම. ගරු නගරාධිපතිතුමනි, පැහැදිලිව කියන්නට ඕනෑ තෙලවල මහා පන්සලේ තමයි මොරටුවේ හොඳම පෙර පාසල අපි කළේ. ළමයි එකසියහැත්තෑ ගානක් හිටියා තෙලවල මහා පන්සල පෙර පාසලේ. ක්‍රමක්‍රමයෙන් දුර්වල වෙලා අඩුවෙලා අඩුවෙලා ගිහිල්ලා තමයි මේක ළමයි 17 දෙනෙකුට අඩුවෙලා තියෙන්නේ. ගරු නගරාධිපතිතුමනි, තෙලවල පන්සලේ විතරක් නෙවෙයි මේ මොරටුවේ පන්සල් වල අනන්ත අප්‍රමණාව පෙර පාසල් කළා. මම ඔබතුමාට යෝජනා කරනවා ඔබතුමා කරුණාකරලා ගිහිල්ලා බලන්න ඔබතුමා පියෙකු හැටියට, ඔබතුමා නගරාධිපතිවරයා හැටියට ගිහිල්ලා බලන්න තෙලවල මහා පන්සලේ මේ කියන අඩුපාඩු ටික තියෙනවාද? තෙලවල මහා පන්සලෙන් අරගෙන දන්දෙනියවත්ත පෙර පාසලට යනකොට තියෙන ප්‍රශ්ණ ටික මොනවාද? ඒ බොරුපන පෙර පාසලේ තියෙන ප්‍රශ්ණ ටික මොනවාද? සහ මේ දැන් යෝජනා කරලා තියෙන ප්‍රජාශාලාව උඩ නිකන් ළමයි ටික හිර කරලා තියන්න. ප්‍රජාශාලාව උඩ හරියට අතපය දිග හැරලා පාඩම් කරන්නවත්

බැහැ ළමයෙකුට. ඉඩකඩ නැහැ. කෝ සෙල්ලම් මිදුලක් දාන්න තැනක් ප්‍රජාශාලාවේ. කොහේද තියෙන්නේ එහෙම තැනක්? එහෙම තැනක් නැහැ නගරාධිපතිතුමා. ඒ නිසා මේ පන්සලේ හාමුදුරුවොත් එක්ක කතා කරලා ප්‍රශ්ණයක් තියෙනවානම් ඔබතුමාව මැදිහත් කරලා නගරාධිපතිවරයා හැටියට ඔබතුමා දන්නවා හාමුදුරුවෝ එක්ක කතා කරලා ප්‍රශ්ණය විසඳගන්න පුලුවන් ඔබතුමාට. එහෙම ගැටලුවක් තියෙනවානම් ඒ ගැන කතා කරලා ඒක සමථයකට පත්කරගන්නේ නැතුව, එහෙම නැතිනම් මේ එන්නේ පන්සලේ දායකයොන්ගේ ළමයි. ළමයින්ගේ දෙමාපියන්ට කිවුවානම් ඔයගොල්ලන්ගේ ළමයින්ට මේ මේ අඩුපාඩු ටික තියෙනවා කියලා, අපි මේක හාමුදුරුවෙනාට කියලා හදාගමු කියලා කිවුවානම්, හාමුදුරුවෝ අකමැති වෙන්නේ නැහැ හදන්න. ඒ නිසා කරුණාකරලා මේ යෝජනාව එක පැත්තකින් තෙලවල අපේ ගමට කරන අසාධාරණයක් මේ කරන්නේ. මේ අපේ දරුවොන්ට කරන අසාධාරණයක්. අනෙක් එක මේක අපේ පන්සලට කරන අගෞරවයක් මේක. අපේ හාමුදුරුවන්ට කරන අගෞරවයක් මේක. ඒ නිසා කරුණාකරලා මේ කියන කතන්දර ටික අකුලගන්න කියන්න. පන්සල මෙච්චරකල් අවුරුදු ගණනාවක් අපි දන්න කාලේ ඉදලා පෙර පාසල තිබුණේ පන්සලේ. එහෙම කරපු පන්සලට කරන මේ අගෞරවය සම්බන්ධයෙන් අපි ඇත්තටම කණගාටු වෙනවා. මේ පෙර පාසලට හොඳම තැන තමයි පන්සල. අපිට වෙන හදන්න තැනක් නැහැ තෙලවල. එහෙම කරනවානම් ඉඩමක් හොයාගෙන නගර සභාවේ ප්‍රතිපාදන වලින් අලුතින් හදලා, සෙල්ලම් පිට්ටනියක් හදලා අපි බොහෝම කැමතියි ඒකට. අපි අත් දෙකම උස්සනවා ඒකට. අපි ඕනනම් අනුග්‍රාහකයෝ හොයලා දීලා සහයෝගයක් ලබා දෙන්න කැමතියි එහෙම කරනවානම්. එහෙම නැතුව මේ කඩිමුඩියේ මේ දරුවන්ව කොහේහරි ගිහිල්ලා ගාල් කරන්න මේ පෙර පාසල තෙලවලින් අයින් කරන්න, තෙලවල පෙර පාසලක් නැහැ එතකොට. ඒ නිසා එහෙම තීන්දු ගන්න, මම දන්නේ නැහැ කවුරු මේ තීන්දු ගත්තාද කියලා. ඒ නිසා කරුණාකරලා මේ පන්සලේ තියෙන පෙර පාසල, පන්සලේ තියෙන්න දෙන්න මොකද හේතුව, මේක මේ කමිටුවට තියෙන වගකීමක් නෙවෙයි. මේක මේ අපේ ගම. අපිටත් අයිතියක් තියෙනවා ගම ගැන තීන්දු ගන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ වෙලාවේ මේ කමිටුවට එන එකක් නෙවෙයි මේක. මේක නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමිය තමයි මේ ඉදිරිපත් කිරීම කරන්නේ. ඒ ඉදිරිපත් කිරීමේ දිනය තියෙන්නේ 2026.04.06 මේක මීට කලින් ඉදන් මේ සාකච්ඡාව යනවා. එතකොට මේ සාකකච්ඡාව මේ අදාළ ස්ථාවර කමිටුවේ කතා කරනවා. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සාකච්ඡා කරලා තමයි මේ ස්ථානීය පරීක්ෂණයට යන්නේ. ඒ ගිහිල්ලා තමයි මේ එකඟතා හදාගන්නේ. එතකොට ඒක මේ තනි කාගෙවත් කැමැත්ත මත නැතිනම් මේ පාලනයේ වුවමනාව මත කරන දෙයක් නෙවෙයි මෙය. සභාවක් ලෙස කමිටුවක් අදාළ ස්ථාවර කමිටුවේ වගකියන මන්ත්‍රීවරුන් සම්බන්ධ වෙලා ආව තීන්දුවක්. ඒ නිසා ඒකේ වෙනස්කම් කරන්න අවශ්‍යනම් ඒ වෙනස්කම් කරන්න පුලුවන් දරුවන්ට වඩාත් යහපත් විදියට. ඒ නිසා මේක විග්‍රහා කරන එක වැරදියි. මේක මේ එකපාරට අපේ පාලනයෙන් තනි තීන්දු තීරණ ගන්නවා වගේ එකක්. එහෙම නැහැ. මේ ස්ථාවර කමිටුවකින් තමයි මේ සැහෙන දවසක් සාකච්ඡා කරලා මේ නියෝජ්‍ය කොමසාරිස්තුමාගේ යෝජනාවකට අනුව.

<u>නාගරික ලේකම් - එම්. කේ. ඩී. ටී. මුණසිංහ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එතැන ඉදිරිපත් වෙන්නේ එතැන විශාල ගැටලු ප්‍රමාණයක් තියෙනවා කියලා දිගින් දිගටම අපිට ආව පැමිණිලි. එතකොට ඒක අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වශයෙන් මගේ වගකීම තමයි ඒ ටික කමිටුවට යොමු කරන එක.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, එතැන විශාල ගැටලු ප්‍රමාණයක් එතුමාට ආවා. එතකොට එතුමා ඒ විෂය සම්බන්ධව භාරව ඉන්න කෙනා විදියට එතුමාට යම් ක්‍රියාමාර්ග ගන්න වෙනවානේ එතුමාට ඒ ගැටලු වාර්තා වෙනකොට. ඉතින් ඒක තනි පුද්ගල හිතුවක්කාරකමක් හෝ කාටවත් කරන අසාධාරණකමක් පන්සලටවත් මේ ගමේ ජනතාවටවත් කරන දෙයක් නෙවෙයි. ඒ තියෙන ප්‍රශ්ණ ටික කොහොමද විසඳගන්නේ කියන්නේ කොහොමද කියලා උත්සහා කරලා බැලුවා කමිටුව. එතකොට ඒකට අදාළව මතු වෙමින් පවතින විවේචන තියෙනවානම් ඒවා සැලකිල්ලට ලක්කරලා ඒවා කොහොමද කරන්නේ කියලා අපිට හොයලා බලන්න පුලුවන්.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මේ කමිටුවේ සාමාජිකයෙක් විදියට මේ කාරණාව සම්බන්ධයෙන් කතා කරන්න ඕන. සුජිත් මන්ත්‍රීතුමා කතා කරපු සමහර කාරණා සම්බන්ධයෙන් කිසි ගැටලුවක් නැහැ. තෙලවලට පෙර පාසලක් ඕනෑ, ඒ කාලේ තිබුණු හොඳම පෙර පාසල තමයි ඔය කියන පෙර පාසල. නමුත් ගරු නගරාධිපතිතුමනි, මුලින්ම මේ පෙර පාසල තිබුණේ පන්සලේ ධර්ම ශාලාවේ ඒ කාලේ. දැන් මේ ඒ. ටී. කේ. චන්ද්‍රදාස මහත්තයා ඉන්න කාලේ ඉඳලා කුසුම් මිස් තමයි මේකේ ප්‍රධාන වශයෙන් විශාල වැඩ කොටසක් කළේ මේ පෙර පාසල් සම්බන්ධව. ඊට පස්සේ මෙය ක්‍රමානුකූලව දැන් මේ පෙර පාසල තියෙන්නේ ගරු නගරාධිපතිතුමනී දාන ශාලාවේ. දාන ශාලාව කියන්නේ පන්සලේ කෙළවර. දැන් අපි මේක බලන්න ගියාම දැක්ක කාරණාව තමයි එකකි ඒ පෙර පාසල පවත්වාගෙන යනකොට තියෙන්න ඕන කරන ප්‍රමිතිය නැහැ. ඒ ප්‍රමිතිය ගත්තොත් ඒක මේ තියෙන පෙර පාසල් බොහෝමයක නැහැ. නමුත් අපි මෙහිදී දැකපු ප්‍රධානතම කාරණාව තමයි ගරු නගරාධිපතිතුමනි, ඒ දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්ණයක් මතුවුණා. මොකද පොල් ගස් යට තමයි එයාලා ඒ ක්‍රියාකාරකම් කරන්නේ. එතකොට මේ පොල් ගෙඩියක් ඔලුවට වැටිලා දරුවෙකුට අනතුරක් සිදුවුණොත්, මොකද කලින් තිබුණේ මේක ප්‍රධාන ශාලාවේ. ප්‍රධාන ශාලාවේ දී ඒ ගැටලු සිදුවුණේ නැහැ. ධර්ම ශාලාවෙන් මේක පිටිපස්සට ගියාට පස්සේ දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්ණයක් පැන නැඟුනා. එහෙම ගැටලුවක් පැන නැඟුනාම තිබුණ ගැටලුවක් තමයි ඔය දෙකට යන එක. අපිට ප්‍රශ්ණයක් නැහැ. දැන් කියන්නේ අර ප්‍රජාශාලාව උඩට ගන්න කියලා. ඒ පිළිබඳව ගැටලුවකුත් නැහැ. ඒකත් කිවුවොත් කියන්න පුලුවන් ප්‍රජාශාලාව උඩ නඟින්න ගියාම දරුවන්ට ප්‍රශ්ණ කියලා. නමුත් මෙතැන තිබුණ ප්‍රශ්ණය තමයි මම ලිහිණි මන්ත්‍රීතුමිය අපි ඔක්කෝම ගියා ඇස් දෙකට දැකපු ගැටලුව තමයි දරුවන්ගේ ආරක්ෂාව, වොෂ්රූම් එකට යන්න ඕනෑ සැහෙන දුර කැලෑවේ තනිකර ගස් වැවිලා තියෙන්නේ. අපි දන්නේ නැහැ මොන සත්තු ඉන්නවාද කියලා. මොකද තෙලවල පන්සලටවත්, හාමුදුරුවොන්ටවත්, තෙලවල දායකයන්ටවත්, ඒ දරුවන්ගේ දෙමාපියන්ටවත් අසාධාරණයක් කරන්න සහ එහෙම තීරණයක් අපේ තිබුණේ නැහැ. අපි බැලුවේ ඒ වේලාවේ දරුවන්ගේ ආරක්ෂාව. අපිට පුලුවන් කියන්න කමක් නැහැ පොල් ගෙඩියක් වැටුණොත් ඔයගොල්ලන්ගේ පාලනයටනේ කියලා, මේක දරුවෙක්නේ. අන්න ඒ දරුවා කියන දේ බලලා තමයි අපිත් කිවුවේ මේක අනිවාර්යෙන් ඉවත් වෙනවානම් හොඳයි මෙතැන දරුවන්ගේ ආරක්ෂාවට කිසිදු විදියක සුදුසුකමක් මේ පෙර පාසල පවත්වාගෙන යෑමේ දී නැහැ කියලා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම අහන්න කැමතියි මේ පෙර පාසල් 17ම සුපිලිපන්න මට්ටමේ තියෙනවානම්, මේ කියන සියලු දේවල් හරි. නමුත් ඔය දාන ශාලාවකටනම් ගෙනිහිල්ලා නැහැ පෙර පාසල. පෙර පාසල තියෙන්නේ අලුතින් ශාලාවක් හැදුවා පන්සලේ සිල් ගන්න සිල්

ඇත්තන්ට. එතකොට ඒ සිල් ඇත්තෝ සිල් ගන්න ශාලාවේ තමයි, ඒකත් ධර්ම ශාලාවක්. අපි බොහෝම ගෞරවයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ, මේක මේ දරුවන්ට කරන අසාධාරණයක්. ඒ නිසා මේක නැවත වරක් සලකා බලලා මේක අඩුපාඩුකම් තියෙනවානම් අපි ගිහින් හාමුදුරුවොත් එක්ක කතා කරලා ඒ අඩුපාඩුකම් සපුර ගමු. හැබැයි පෙර පාසල මෙතැනින් අයින් කරන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම තමයි අපි බොහෝම ගෞරවයෙන් කරන්නේ.

ගරු නගරාධිපතිතුමනි, 02(07) දරුවන්ට පොත් කට්ටල බෙදා දීම සම්බන්ධයෙන්, මම ස්තූතිවන්ත වෙනවා ඔබතුමාට අපි හරි දේ හරි විදියටත්, වැරදි දේ වැරදි විදියටත් දකිනවා. ඒ නිසා අපි හැමදේම වැරදි විදියට දකින්නේ නැහැ. මේ පොත් කට්ටල ලබාදීම සුභදායී මට්ටමක තියෙනවා. ඒ කියන්නේ දරුවන්ට කැත නැතුව ඒ පොත් ටික ගන්න පුලුවන් විදියට හදලා දීම සම්බන්ධයෙන් අපේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. මොකද හේතුව ඒක හොඳයි. හැබැයි ප්‍රශ්ණයක් තියෙනවා. ඒ තමයි මේ දරුවන්ට අපි අයදුම්පත දීලා ඉස්කෝලෙන් මේකට සීල් එක ගහගෙන එන්න කිවුවාම ගරු නගරාධිපතිතුමා අපිට සීල් එක ගහගෙන එන්න පුදුමාකාර මහන්සියක් ගන්න වෙනවා. දුන්නාම හම්බ වෙන්නේම නැහැ. අපි ණයක් ඉල්ලගන්න ගෙවල් වලට යනවා වගේ තමයි අර ෆෝම් එක ඉල්ලගන්න යන්න වෙලා තියෙන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේකේ මේ සීල් එකේ කතන්දරය සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න. එහෙම නැතිනම් අපි ලොකු අමාරුවක වැටිලා ඉන්නේ. මේ වැඩපිළිවෙල ඇත්තටම හොඳයි. තව දෙයක් ප්‍රාථමික මට්ටමේ පොත් කට්ටලය පුලුවන්නම් ද්විතීක මට්ටමේ වටිනාකමට සරිලන ආකාරයට සකස් කරලා දෙන්න. මේකේ ප්‍රාථමිකයි ද්විතීකයි ගත්තාම අර මිනිස්සුන්ට පොඩ්ඩක් අනේ අපේ එක පොඩියි අරක ලොකුයි වගේ හැඟීමක් එනවා. ඒ නිසා පුලුවන්නම් ඊලඟ සැරේ දෙනකොට ඉතාමත්ම හොඳයි මොකද හේතුව පිළිවෙලට ඇසුරුම් කරලා තියෙනවා. පොත් වල ගුණාත්මකභාවය ඉතාමත්ම හොඳ මට්ටමක තියෙනවා. ඒවා කිසි තර්කයක් නැහැ. අරකේ පුලුවන්නම් ඒ වටිනාකමට සරිලන විදියට ප්‍රාථමික අංශයේ එකත් දෙන්න. මේකෙත් මේ සීල් එක සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, 02 (09) ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අපි දන්නවා මෙතැන අපි මේ සභාව කරනකොට මේ සභාව කරන්නේ මහා නගර සභා ආඥා පනත සහ අතුරු ව්‍යවස්ථාව කියන මෙන්න මේ පනත් වලට අනුකූලව තමයි අපි කටයුතු කරන්නේ. මෙහි නිර්දේශය දීලා තියෙනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුව, ඉහත කරුණට අදාළව තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා අනු කමිටුවක් පත් කිරීමටත්, එම කමිටුව සඳහා ගරු නගරාධිපතිතුමා, ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමිය, මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු සභාපති ඇතුළු සියලුම සාමාජික මහා නගර සභා මන්ත්‍රීවරු, නාගරික කොමසාරිස්, නියෝජ්‍ය නාගරික කොමසාරිස්, ප්‍රධාන නාගරික ගණකාධිකාරි, නාගරික ඉංජිනේරු, ස්ථාන භාර නිලධාරි (ගිනි නිවීම්), ප්‍රජා සංවර්ධන නිලධාරි හා පුස්තකාල සහායක ප්‍රදීපිකා වීරසිංහ මහත්මිය පත් කිරීමටත් එම කමිටු වාර්තා මීළඟ කමිටුවට වෙත ඉදිරිපත් කිරීමටත් කමිටුව නිර්දේශ කරන ලදී. ගරු නගරාධිපතිතුමනී, මෙහෙම අනු කමිටු පත් කරන්න අනු කමිටුවකට ඇති බලය කුමක්ද? නගරාධිපතිවරයාව කමිටුවකට දාලා අනු කමිටුවක් හදන්න අනු කමිටුවකට බලය තියෙනවාද? ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා උපදෙස් දෙන්න ඔබතුමා සභාපතිතුමන්ලා සභාපතිතුමියන්ලාට තමන්ගේ බලය අතික්‍රමණය කරන්න එපා කියලා. එහෙම අනු කමිටු පත් කරන්න මහා නගර සභා ආඥා පනතේවත් අතුරු ව්‍යවස්ථාවේවත් කොහේවත් බලයක් නැහැ. මම හැමදාම කියනවා ස්ථාවර කමිටුවකට අනු කමිටුවක් පත් කරන්න බලයක් නැහැ. මෙතැනින් එහාට

ගිහිල්ලා නගරාධිපතිවරයාවත් දාලා. ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. මේවා හදන්න ගරු නගරාධිපතිතුමා.

ගරු නගරාධිපතිතුමනි, 04 කරුණට අවධානය යොමු කරනවා නියෝජ්‍ය නාගරික කොමසාරිස් විසින් 2026.06.05 දිනැතිව ඉදිරිපත් කරන ලද පහත කරුණ සලකා බැලීම මොරටුව මහා නගර සභා තීරණ අංක කියලා දාලා මගින් මුතුහර පෙර පාසලේ දිවා සුරැකුම් මධ්‍යස්ථානය 2026 ජුනි මස ආරම්භ කළ යුතු බව තීරණය වූ අතර එම තීරණයට අනුව 2026.06.03 වන දින දිවා සුරැකුම් මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත මිලදී ගත් සේවිකාවන් දෙදෙනෙකු සේවය කරන අතර පෙර පාසල් ගුරුවරියක් පාලිකාව ලෙස කටයුතු කරයි. මෙතෙක් මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා කිසිදු දරුවෙකු ඇතුළත් වී නොමැත. කිසිම දරුවෙක් ඇතුලත් වෙලා නැහැයිලු. පළවෙනි එක තමයි මේකේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවිකාවන් දෙදෙනෙකුව මිලදී අරගෙන. මේකේ වහල් සේවයක්ද තියෙන්නේ මිලදී ගන්න. එතකොට එකදු ළමයෙක්වත් මේ වෙනකොට අරගෙන නැහැ. මේක තියෙන්නේ 2026.06.03 වන දින තමයි මේක විවෘත කරලා තියෙන්නේ. දැන් 2026.07.08 මේ දක්වා එකදු ළමයෙක්වත් අරගෙන නැහැ. මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ප්‍රධාන පාලිකාව ලෙස සේවය කරන පෙර පාසල් ගුරුවරියගේ සේවා කාලය ප.ව.1.30 වන බැවින් ඇය දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සේවා කාලයෙන් පසු රැඳී සිටීම හේතුවෙන් ඇයට ලබා දිය යුතු අතිකාල දීමනා සම්බන්ධව කාරුණික උපදෙස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි. ගරු නගරාධිපතිතුමා, පාලිකාවන් දෙන්නෙකුට පඩි ගෙවනවා. දෙන්නා ලක්ෂපතිය මධ්‍යම කොට්ඨාසයෙන් අරගෙන තියෙන්නේ අපේ සෙව්වන්දි මන්ත්‍රීතුමියගේ කට්ටිය. රු.1850 ගානේ දිනපතා දෙන්නෙකුට පඩි ගෙවනවා. හැබැයි දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් නැහැ. මේ විවෘත කරනවා කියලා ඔබතුමාව ගෙනිහිල්ලා විවෘත කරලා තියෙන්නේ මෙහෙන් කැඩිච්ච මෙට්ටයක් යවලා තියෙනවා එච්චරයි දිවා සුරැකුම් මධ්‍යස්ථානය ආරම්භ කරන්න යවලා තියෙන්නේ. හොඳ වෙලාවට ළමයි නැත්තේ. ඊට වඩා අපි මේකේ වැටුප් ගෙවලා තියෙනවා. දැන් මට ආරංචියක් ආවා එකම පවුලේ ළමයි තුන්දෙනෙක් ගන්න යනවා කියලා. අරගෙනද කියන්න දන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා මේ විභිළු සපයන්න එපා මොකද හේතුව කාවද මේ රවට්ටන්නේ? මේක විවෘත කරනවා ළමයි නැහැ. හැබැයි සේවකයෝ දෙන්නෙක් අරගෙන පඩි ගෙවනවා. පොඩි පඩියක් නෙවෙයි මේ ගෙවන්නේ ඔබතුමා ගණන් හදලා බලන්න මේ අපේ සල්ලි නෙවෙයි, මේවා පොදු මහජනතාව වරිපනම් බදු ගෙවන සල්ලි. මේවායේ ප්‍රශ්ණ තියෙනවා.

ගරු නගරාධිපතිතුමනි, 05 වන කරුණ මේක මම කියවන්නේ නැහැ. හොඳ ඉල්ලීමක් නමුත් පැහැදිලි මදි මේ ඉල්ලීම සම්බන්ධයෙන්. විදුලි අධිකාරී විසින් 2026.06.05 දිනැතිව ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම කියලා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා. මොකද විදුලි අධිකාරී හරහා මේ ඉල්ලීම පැහැදිලි කිරීමක් කරලා දෙන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඞී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඉතාම කෙටියෙන් පැහැදිලි කරනවා. ඔබ දන්නවා මේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන දීර්ඝ කාලයක් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සාකච්ඡා කළා. ඒ අවශ්‍යතාවය පිළිබඳව සෑහෙන කාලයක් සාකච්ඡා කළා. ඒ නිසා මේක දිගින් දිගටම පමා වෙන නිසා නිශ්චිත දිනයක් කිවුවා මට මේ දිනය වෙනකොට විවෘත කරන්න ඕනැ. එතකොට අවශ්‍ය කරන බඩු සියල්ල සැපයුම් අංශය පැත්තෙන් අවශ්‍ය කටයුතු බොහෝමයක් කරමින් තිබුණා. සියල්ල සම්පූර්ණ කරලා තිබුණේ නැහැ. හැබැයි ළමයි ටික එනකොට ආවාට පස්සේ අර වැඩ කරන ළමයි

ටිකව ගන්න බැහැ. එතකොට ශ්‍රම මිලදී ගන්නවා කියන්නේ මෑන් පවර් යටතට දාලා ගන්න එක. මේ භූමියේ විශාල ලෙස දරුවෝ ඉන්නවා කියලා තමයි සාකච්ඡාවට ගැනුනේ දෙමාපියන්ට දාන්න. ඒ අවස්ථාව මේ ගත්තේ. තාමත් මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ දරුවෝ විශාල ප්‍රමාණයක් පඩි ගනිමින් හිතු හිතු ලෙස බඳවා ගත්තා, මුදල් වලට ගත්තා. දැන් මේ ජනතාවගේ අවශ්‍යතාවයක් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් මතු කරන දේ තුළ තියෙනවා පිලිගත යුතු කාරණාවක්. ඒ මුදල වැඩි රු. 7500ත්, එතකොට ළමයි තුන්දෙනෙක් හිටියොත් ඒ අම්මාට මේක කරන්න බැහැනේ. අපි මේ සභාව දැන් කතා කරන්න ඕන අන්න ඒ දරුවන්ට එන්න පුලුවන් විදියට මේ මුදල් අගය අඩු කරන්න. අපි සාකච්ඡාව ගන්න ඕන එතනට. මම කිවුවේ ඒකයි විවේචනය ඇතුලේ ගතයුතු හරය තියෙනවා. දැන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන දෙන්නේ ඒ භූමියේ ජනතාවගේ දරුවන්ට ඒ අවශ්‍යතා ඔක්කෝම ටික දාලා තියෙනවා. ඒ සියල්ල සම්පූර්ණ වෙන එකක් නැහැ. පොඩි පොඩි අඩුපාඩුකම් තියෙයි. දැන් මම ඊයේ තේරුම් ගත්ත එක තමයි මේ සභාව කරන්න තිබුණේ ගාන අඩු කරන එක. අඩුතරමේ රු. 5000ක්වත්. නමුත් කමිටුව ඇතුලේදී මම සාකච්ඡාවට ආව වෙලාවේදී කතා වුණේ නැහැ එහෙනම් අපි අඩුම තරමේ මෙන්න මේ මුදලටවත් යමු කියලා. ඉතින් ඒ කමිටුවේ තීන්දු. මේ එකක්වත් කමිටුවෙන් පිට ගිහිල්ලා නෙවෙයි මේ කමිටුවේ ගත්ත තීන්දු. ඒ නිසා අපි ඒක දැන් කොහොමද සාර්ථක කරන්නේ අන්න එතැනටයි අපි කටයුතු කරන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක සංශෝධනය කරන්න නගරාධිපතිතුමා වචනයෙන්. මේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත මිලදී ගත් ඒක නිකන් වහල් සේවයට ගත්තා වගේනේ. අනෙක් එක තමයි ඔබතුමා කියපු එක හරි. ගාන වැඩිනම් අපි ඒක කතා කරලා ගාන අඩු කරමු. මොකද නගර සභාව කියලා කියන්නේ ලාභ ලබන ස්ථානයක් නෙවෙයි, සේවා සපයන ස්ථානයක්නේ. ඔබතුමා ඒ යෝජනාව දැම්මානම් අපි අත් දෙකම උස්සනවා ඒකට ප්‍රශ්ණයක් නැහැ. නමුත් ඒක නෙවෙයි ගැටලුව දැන් මේ සේවකයෝ දෙන්නෙක් නිකන් තියාගෙන ඉන්නේ ඇයි? ඇයි තව තැනකට දාලා එතැන වැඩ තියෙන තැනකට දාලා වැඩ අරගෙන, අරක විවෘත කරාම එතැනට දාන්න බැරි ඇයි?

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රජා සංවර්ධන අංශයට බාරදීලා තියෙන්නේ ප්‍රජා සංවර්ධන අංශයේ අවශ්‍යතාවය මත ඒ අවශ්‍ය ස්ථාන වලට ඒගොල්ලන්ව යොමු කරලා ඒ අයගෙන් වැඩ ගනිමින් ඉන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(02) කරුණ සඳහා අවධානය යොමු කරනවා. දිනපොළ පොල භූමිය සංවර්ධනය කිරීම සම්බන්ධවයි. මේ සම්බන්ධයෙන් අපි දීර්ඝ වශයෙන් කතා කළා නගරාධිපතිතුමා. ඔබතුමා එදාට පහුවෙනිදාම මේක කරනවා කියලා කිවුවා. නමුත් තවමත් දිගරොල්ල පොල භූමිය එහෙම්මමයි. ඔබතුමා අදාළ නිලධාරීන්ට කිවුවා මේක හෙටම පටන් ගන්න කියලා දැන් මාසයක් ගියා තාම මුකුත්ම නැහැ. ඊළඟ කරුණ තමයි අපේ මේ සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාවක් තියෙනවා සොයිසාපුර ක්‍රීඩාංගනයේ ඇවිදින මංතීරුව සඳහා විදුලි ආලෝක පද්ධතියක් සකස් කර ගැනීම කියලා. උක්ත කරුණ සලකා බැලූ කමිටුව, සොයිසාපුර ක්‍රීඩාංගනයේ ඇති ඇවිදින මංතීරුව සඳහා නව විදුලි ආලෝක පද්ධතියක් සවිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඔබතුමා දැන් ඒ ලයිට් ටික සිවකරලා තියෙනවා බොහෝම හොඳයි. නමුත් ලුනාව කලපුව කණු 69ක් තියෙනවා නගරාධිපතිතුමා. නමුත් කණු 20කවත් ලයිට් පත්තු වෙන්නේ නැහැ. සිංහයා එහෙම්පිටින්ම කළුවරේ. තැනින් තැන අපි

කප්පාදු කළා අර විදුලි ප්‍රශ්ණය ආව වෙලාවේ. මේක කරමු සොයිසාපුර නමුත්, ලුනාව ඇවිදින මංතීරුවටත් ඒ ටික කනෙක්ට් කරලා දෙන්න එපැයි. 50%ක් විතර බල්බ් පිච්චිලා. මේක එහෙම තියෙද්දි සොයිසාපුරට එහෙම ඇනවුම් කරලා තියෙනවා. සොයිසාපුර එකත් කරලා ලුනාව එකත් කරමු නගරාධිපතිතුමා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඒ තමයි අපේ එගොඩඋයන මාතෘ සායනය වෙන තැනකට ගෙනියන්න කුමක් හෝ අදහසක් තියෙනවාද?

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැනට තියෙන ක්‍රියාමාර්ගය තමයි ඒ මාතෘ සායනයේ තියෙන අඩුපාඩුකම් සකස් කර ගැනීම සඳහා අවශ්‍ය කරන කටයුතු කරමින් ඉන්නවා. ඒ අතර වාරයේ සාකච්ඡා වෙමින් තියෙනවා සුභ සාධක සංගමයේ මීට පෙර මාතෘ සායනය තිබුණ තැන, දැන් මේ තියෙන තැන අනාරක්ෂිත තැනක් අරගොල්නගේ පැත්තෙන් අපිට සාකච්ඡාවක් දීලා තියෙනවා ඒ ස්ථානය ලබා දීමට අදාළව සාකච්ඡාවක්. එතකොට ඒ සාකච්ඡාව අපි කරනවා අපිට දැනට ගොඩනැගිලි පහසුකම් දෙනවානම් ගොඩක් දරුවන්ට ආරක්ෂිත ලෙස මාතෘ සායනය මේ ස්ථානයට ගෙන යාම පිළිබඳව සභාවේ යම් එකඟතාවයක් ගන්න පුලුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. දැනට තියෙන්නේ අර රේල් පාරයි නව ගාලු පාරයි හිරවෙලා තියෙන තැනක. එතැන විශාල අපහසුකම් ටිකක් තියෙනවා. මම ඒත් කිවුවා අර අපේ පුස්තකාලය තියෙන තැන දැනට භාවිතා වෙන ප්‍රමාණය අඩු නිසා එතැනින් කොටසක් හරි දෙමු. මොකද සෑහෙන අම්මලා ප්‍රමාණයක් එතැනට එනවා. ඒ නිසා අර සාකච්ඡාවට දිනය වේලාව දුන්නා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මර්වින් සිල්වා මහතා එතැන වැඩ කටයුතු කරන කාලයක් තිස්සේ ප්‍රජා සංවර්ධන වැඩ කටයුතු කරන අපේ නිලධාරීතුමා එතුමා කිවුවා ඒ ලිපිය තවම සෘජුව ලැබිලා නැහැ කියලා කතාවක්.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එතැන වගකිව යුත්තෙක්නේ අපේ ධම්මික චන්ද්‍රනාත් හිටපු උටපු උප නගරාධිපතිතුමා. එතුමා පෙරේදා ඇවිල්ලා දිනෙත් දාගෙන සාකච්ඡාව කරමු කියලා ගියා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙම කමිටුව වෙනුවෙන් කතා කිරීමේදී විශේෂයෙන්ම තෙලවල ප්‍රදේශයේ පෙර පාසල ගැන කතා වුණා. ඇත්තෙන්ම ගරු නගරාධිපතිතුමනි, නගර සභාව විසින් පවත්වාගෙන යන පෙර පාසලකට දරුවන් ඇතුලත් කරන්නේ යම්කිසි හැකියාවක් නැති දිලිදුභාවය තියෙන පුද්ගලයෝ. විශේෂයෙන්ම දන්දෙනියවත්ත ප්‍රදේශයේ හිටපු මිනිස්සු සමහර වෙලාවට හැඳුනුම්පතෙත් තමන්ගේ ලිපිනය වෙනස් කරගන්න උත්සහා ගන්න අවස්ථා තියෙනවා. ඒ වාටාපිටාවේ ඉන්න දෙමාපියෝ දන්නවා මේ දන්දෙනියවත්තට ළමයිව එවන්නේ නැහැ. ඒක ප්‍රායෝගිකව වෙන්නේ නැති දෙයක්. ඒ නිසා මේ තත්ත්වයත් අවබෝධයට ගන්න. මොකද තෙලවල ඒ දරුවන්ගේ දෙමාපියන්ගෙන් ඉස්සෙල්ලා අහන්න මේ දරුවන්ව බොරුපන දන්දෙනියවත්තට යවන්න කැමතියිද කියලා. මම හිතන්නේ නැහැ කවුරුත් කැමති වෙයි කියලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා මම කියන්නේ වේලාසන ඉදන්ම මේ සාකච්ඡාව ගත්තා. ඒ දෙමාපියෝ විරුද්ධයි. කවුරුවත් කැමති නැහැ. ඒ නිසා තමයි අර තෙලවල තියෙන පෙර පාසල නවීකරණය කරලා ඒකට ඒ දරුවෝ ටික ගන්න උත්සහා කරමින් ඉන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පන්සලේ ලොකු හාමුදුරුවෝ එක්ක කතා කළොත් අකමැති වෙන්නේ නැහැ එතනින් යනවාට. මොකද මේ දරුවන් රදවා ගන්න අවශ්‍යයි. ඒත් එක්කම සඳහන් කරන්න ඕන මේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳව කතා කිරීමක් කළා. මෙහිදී ඔබතුමා යෝජනාවක් කළා මේ රු. 7500/- ගාණ 4000ට අඩු කරන්න කියලා. මම හිතන්නේ ඒක සුදුසු නැහැ. මොකද දෙමාපියෙකුට දරුවෙක් කියන්නේ අගනාම දේ. මේ දරුවන්ව බාල්දු කිරීමකට ලක් කරන්නේ නැහැ. මේකේ තියෙන්නේ නගර සභාවෙන් පාලනය කරන දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් කිවුවාම දෙමාපියන්ගේ හැඟීමක් එන්නේ වෙනත් විදියකට. ලොකු ගාණක් දානවානම් එහි ආරක්ෂිත තත්ත්වය ගැන බලලයි දෙමාපියෝ කැමති වෙන්නේ. මේ ප්‍රායෝගි තත්ත්වයන් අපි තේරුම් ගන්න ඕනැ. මේ නගර සභාවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනකොට මේ ප්‍රායෝගික තත්ත්වයයි ජනතාව අතර කාවැදිලා තියෙන තත්ත්වයයි තියෙන තත්ත්වයයි තමයි වෙනස් කරන්න ඕන. ඒ නිසා අපි ප්‍රමිතියෙන් ඉහළ ආකාරයෙන් යොමු වෙන්න ඕන. මේ තැනටයි අපි ගෙනියන්න ඕන කියලා මතක් කරනවා.

ගරු නගරාධිපතිතුමනි, 02(03) කරුණ මේ සම්බන්ධයෙන් මම කලිනුත් කතා කළා. 2025.06.25 වෙනිදා තමයි මේ පෙර පාසල අළුත්වැඩියා කටයුතු කරන්නේ සහ බේබි කොමඩ් සවි කරන්නේ කියලා යෝජනාව දාලා තියෙන්නේ කියලා. හැබැයි අවුරුද්දකට ආසන්න කාලයක් ගිහිල්ලා තමයි මේක හරි ගස්සලා තියෙන්නේ. අළුත්වැඩියා කටයුතු වලට දැනුයි ඇස්තමේන්තු අනුමත කරගන්න යන්නේ. මේ දේවල් ක්ෂණිකව කරන්න ඕන දේවල්. ඒ නිසා මේවා ගැන පුළුල් අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තෙලවල මතු කරපු කාරණාව සම්බන්ධයෙන්, මොකද මමත් ඒ කමිටුවේ සාමාජිකයෙක් ඒ නිසා මම ඒකට විරුද්ධ නැහැ. මොකද මම ඒ ප්‍රශ්ණය ඇස් දෙකට දැකපු නිසා. ඔබතුමාට පුලුවන්කමක් තියෙනවානම් ලොකු හාමුදුරුවෝ එක්ක කතා කරලා ධර්ම ශාලාවට ඒ පෙර පාසල ගේන්න කිසිම ගැටලුවක් නැහැ මාරු කරන්න ඕනත් නැහැ මුකුත් නැහැ. මේ අර කෙළවරකට දාලා දරුවන්ගේ ආරක්ෂාවට ප්‍රශ්ණයක් නිසා තමයි මම පුද්ගලිකව මම දන්නේ නැහැ ලිහිණි මන්ත්‍රීතුමිය කොහොමද කියලා. ඇත්ත කතාව දරුවෙකුගේ ඔළුවට පොල් ගෙඩියක් වැටුණොත් එහෙම ඒකේදි මම දේශපාලන සලකන්නේ නැහැ. මොකද ප්‍රශ්ණය තියෙන්නේ ඒක මම ඇස් දෙකට දැක්කා. ඇත්තටම එතැන ළමයින්ට සුදුසු පරිසරයක් නැහැ. හැබැයි මේ පෙර පාසල තියෙන්න ඕන පෙර පාසලක්. ඒක කලින් තිබුණේ දාන ශාලාවේ නෙවෙයි ඒක තිබුනේ කලින් තිබුණ ධර්ම ශාලාවේ. එහි තියෙද්දි ඒ දරුවන්ට කිසිදු අනාරක්ෂිත තත්ත්වයක් මතු වුණේ නැහැ. මම දන්නේ නැහැ ඒ දරුවන්ගේ දෙමාපියන් කැමතියි නම් දැන් ඔය ඉන්න තැන ඉන්න අපේ කිසිදු ප්‍රශ්ණයක් නැහැ.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.06.05 දින පැවති මහජන උපයෝගිතාවය, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.05 දින පැවති මහජන උපයෝගිතාවය, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(1), 02(5), 02(7), 02(8), 02(9), 02(10),03, 06 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අංක 02(3), 02(4), 02(6) දරණ කමිටු නිර්දේශයන්ට විපක්ෂව ද ඡන්දය ප්‍රකාශ කළ අතර, 02 (2), 02(5), 04, 05 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - පී. සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය

13. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.05 දින පැවති මහජන උපයෝගිතාවය, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(1), 02(5), 02(6), 02(7), 02(8), 02(9), 02(10),03, 06 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අංක 02(3), 02(4), දරණ කමිටු නිර්දේශයන්ට විපක්ෂව ද ඡන්දය ප්‍රකාශ කළ අතර, 02 (2), 02(5), 04, 05 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.05 දින පැවති මහජන උපයෝගිතාවය, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.05 දින පැවති මහජන උපයෝගිතාවය, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.06.05 දින පැවති මහජන උපයෝගිතාවය, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා)

**06(03) 2026.06.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙම කමිටු වාර්තාවේ පොඩි ගැටලුවක් තියෙනවා ඇමුණුම් අංක 01 නඩු පිළිබඳ විස්තරයේ අංක 02 යටතේ නීතිඥ මධුරංග විජයරත්න මහතා කියලා තියෙන්නේ. දැන් නීතිඥ මධුරංග විජයරත්න මහත්තයා මේකේ දැන් ඇපේ වෙන්නේ නැහැනේ. මම දන්න විදියට නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඒ සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. මම මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරීපත් වෙන්න කලින් නගර සභාව වෙනුවෙන් මම නඩු 02කට පෙනී සිටියා අරගලය කියන වචනය හොඳ නැහැ 2022.05.09 වෙනිදා වෙච්ච සිද්ධියක් සම්බන්ධයෙන් ඇති වූ නඩු 02ක්. එතකොට මේ නඩු දෙකටම බ්ලොක් ෆීස් මේක ගැන දන්නවා ඇති කට්ටිය නීතිපති උපදෙස් දක්වා ඒ කියන්නේ මේ නඩුවේ මූලික විමර්ශණ කටයුතු කරලා මූලික විමර්ශණ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වුණාට පස්සේ පොලිසිය විසින් ඒ සම්පූර්ණ ගොනුව, ගොනු 03 ක් කරලා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කරනවා. ඒ ගොනු 03 අධ්‍යනය කිරීමෙන් පස්සේ තමයි නීතිපතිතුමා කුමන සැකකරුවන්ට විරුද්ධව චෝදනා ගොනු කරනවාද, චෝදනා ගොනු කරන්නේ නැද්ද, මොනවාද ගොනු කරන චෝදනා කියලා ඉවර වෙලා මහේස්ත්‍රාත් අධිකරණයට හෝ ගරු මහ අධිකරණයට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන්නේ. ඉතින් මේ නඩු දෙක සඳහා මම පෙනී සිටිමින් නඩුව භාර ගත්තේ ඒ නීති උපදෙස් පැමිණෙන තෙක් මේ නඩුවේ කටයුතු සඳහා නගර සභාව වෙනුවෙන් පෙනී සිටීම සඳහා. එතකොට මේ අංක 02 යටතේ තියෙන බී/1005/2022 කියන නඩුවට මම ඒ වගේ පෙනී සිටින නුඩවක්. ඒ වගේම අනෙක් නඩුව මේ වනවිට ගරු මහා අධිකරණයට තබලා තියෙනවා මගේ මොරටුව මහේස්ත්‍රාත් අධිකරණය පෙනී සිටී මේ සේවා කාලය නීතිඥවරයෙකු වශයෙන් මගේ සේවා කාලය මගේ කටයුතු අවසන් වෙලා මහා අධිකරණයට තියලා තියෙනවා. නමුත් මේ කියන අංක 02 යටතේ තියෙන බී/1005/2022 කියන නඩුවට තවම නීතිපති උපදෙස් පැමිණිලා නැහැ. නමුත් දැන් සුජිත් මන්ත්‍රීතුමා විමසූ කාරණය මගේ නම තවම සඳහන් වෙන්නේ මේ නඩුවට මම මුල් අවස්ථාවේ ම බ්ලොක් ෆී එකක් විදියට සම්පූර්ණ මුදල අරගෙන තියෙන්නේ. ඒ අනුව ඒ ලබා ගත්තාට පස්සේ ඒ නඩුව සඳහා මට පෙනී සිටීමට අවස්ථාවක් නැති වුණත් මගේ කනිෂ්ඨ නීතිඥවරු මගේ චේම්බ් එකේ නීතිඥ මහත්වරු මේ සම්බන්ධයෙන් පෙනී සිටිනවා. නගර සභාව සම්බන්ධයෙන් කිසිම අගතියක් වෙන්නේ නැහැ. නමුත් වෙන කිසිදු අය කිරීමක් පළවෙනියාට මේ නඩුවේ අය කිරීමේ ගාස්තුවෙන් පස්සේ කිසිම අය කිරීමක් සිද්ධ කරලා නැහැ. ඒ නිසා මම හිතනවා ඒක කන්ෆ්ලික්ට් ඔෆ් ඉන්ට්‍රෙස්ට් කියන කාරණයට වැටෙන්නේ නැහැ. ඒ නඩුව වෙනුවෙන් දැනට තියෙන නීතිපතිතුමාගේ උපදෙස් සඳහා පමණයි. ඒ පැහැදිලි කිරීම ප්‍රමාණවත්නම් වෙන ප්‍රශ්ණ තියෙනවානම් මම පැහැදිලි කරන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒකේ වෙන්න ඕන මෙතුමාගේ නම ඉවත් වෙන්න ඕන. මේක මහා සභාවට ගිහිල්ලා අනුමත වෙන එක අපේ මධුරංග මන්ත්‍රීතුමාට නීතිඥ මහත්මයෙකු හැටියට හොඳ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මුලින්ම සභාවට මේ පිලිබඳව පැහැදිලි කළේ කවුරුහරි කෙනෙක් මේ සම්බන්ධයෙන් නොමඟ යන්න පුලුවන් මොකද්ද වෙලා තියෙන්නේ කියලා. තවම මම සමහරක් විදියට නාගරික මන්ත්‍රීවරයෙක් හැටියට පත්වුණාට පස්සෙත් යම් මුදලක් ලබාගෙනත් තියෙනවා. ඒකෙත් ගැටලුවක් තියෙනවා. හැබැයි මම මේ නඩුවේ මට දින වකවානු මතක නැහැ. මම සභාවට පත්වෙන්න බොහොම කාලයකට කලින් තමයි මේ සඳහා අදාළ සම්පූර්ණ මුදල් ලබාගෙන තියෙන්නේ. ඒ නිසා මම අපේ සභාපතිතුමියගෙන් ඉල්ලා සිටිනවා ඉදිරි දිනයේ සිට මේ අයිතම 02 යටතේ තියෙන බී/1005/2022 නඩුවේ මේ අදාළ අයිතමයෙන් මාගේ නම ඉවත් කරන්න කටයුතු කරන්න කියලා.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැනට ඒ තීන්දුව සභාවේ අනුමත කරන්න බැහැ. අපිට තවදුරටත් නීතිමය උපදෙස් අරගෙන එතුමාගේ උපදෙස් ඇතුලේ තමයි. ඒ නම් ඉවත් කරනවානම් අර නීති උපදෙස් ඇතුලේ තමයි අපිට කටයුතු කරගන්න වෙන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම කරුණ ඇත්තටම කතා කරන්නේ ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේ අදාළම අයිතමයක් යටතේම නෙවෙයි. ප්‍රජාශාලා කියන කොටස ප්‍රජාශාලා කියන එක ගොඩක් වැහිලා පවතින්නේ මේ වෙද්දි. නමුත් සොයිසාපුර ප්‍රජාශාලාව සම්බන්ධයෙන් මම මෙහි කතා කරන්නේ. සොයිසාපුර ප්‍රජාශාලාව බොහෝ දෙනෙක් විවිධ උත්සව සඳහා භාවිතා කරනවා. එතකොට පහුගිය දවස් වල මමත් මයිනා මන්ත්‍රීතුමියත් ඒ වගේම අපේ අනුරසිරි මන්ත්‍රීතුමාටත් සුදේශ් ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමාටත් ඒ ආරාධනාව ලැබුණා. නමුත් එතුමා ආවේ නැහැ. ඒ ප්‍රදේශයේ ටවර් හෝල් රංගන ශිල්පියෙකු වන අමර වර්ධන මහත්මයාගේ නාට්‍ය සංදර්ශනයකට සහභාගී වුණා. අපි එතැනට ගියාම මොරටුවේ සහ මොරටුවේ නැති පිරිසකුත් ප්‍රේක්ෂකයෝ විදියට සහභාගී වුණා ඒ නාට්‍යයේ ශිල්පීන් විදියට හිටියා. හරි කණගාටුවක් සහ ලැජ්ජාවක් ඇති වුණා නගරාධිපතිතුමනි, මකුළු දැල් වලින් සම්පූර්ණයෙන් ඒ කියන්නේ ඒ මකුළු දැල් පොඩි ඒවා නෙවෙයි මහා විශාල විදියට සම්පූර්ණයෙන්ම ඒ ශාලාව අපවිත්‍ර වෙලා තිබුණේ. අතුගාලා තිබුණෙත් නැහැ. මම ඉල්ලා සිටින්නේ ගරු නගරාධිපතිතුමනි, ශාලාවක් දෙනකොට කවුරුන්හෝ එතැන භාරකරුවෙක් ඉන්නවා එතැන කුමක් හෝ ක්‍රමවේදයක් තියෙනවානේ. ඒ වගේ තැනක මේක පිරිසිදු කරලා මේක යම්කිසි විදියකට පාවිච්චි කරනකොට ඒ පාවිච්චි කරන අයටත්, වැසිකිලි පහසුකම් ඇත්තටම නැහැ. වැසිකිලියක් තියෙනවා නමුත් ඒකට යන්න පුලුවන් තත්ත්වයක් නැහැ. ඉතින් ඒක නිසා මේ ශාලා කුලියට දෙනකොට, මොකද අපෙන් අහපු ප්‍රශ්ණයක් තිබුණා අපෙන් සල්ලි අයකරගෙන අපි මේ වගේ තැන් වලට ඇවිල්ලා කොහොමද මේ පහසුකම් නැතුව ඉන්නේ කියලා. විශේෂයෙන්ම රංගන ශිල්පීන් හිටියා එයාලා ගොඩක් අපහසුතාවයට පත්වෙලා හිටියා. මේ පිළිබඳව ඉතාමත් සැලකිලිමත් වෙන්න කියලා ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම සොයිසාපුර ප්‍රජාශාලාව කියන්නේ අපිටත් සම්පතක් සොයිසාපුර මිනිස්සුන්ටත් සම්පතක්. අපි හැමෝටම අභිමානයක්. ඒ අභිමානය රැකගන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**මහා නගර සභා මන්ත්‍රී - එච්. චන්දන පී. විතානගේ මහතා**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව ක්‍රීඩා සමාජයේ නඩුව සම්බන්ධයෙන් සඳහනක් තියෙනවා. මේ සම්බන්ධයෙන් පානදුර මහා අධිකරණයේදී මොරටුව මහා නගර සභාව පැහැදිලි සමථයකට එළෙඹුනා මොරටුව ක්‍රීඩා සමාජය සමඟ. ඒ සමථය අනුව එහිදි වෙන්න තිබුණේ ඒ දක්වා තිබුණ ඒ බිම් කුලිය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරලා තක්සේරු කරන බිම් කුලිය මත ගිවිසුමකට ඇතුලත් වීම. ඒ සඳහා බදු ගිවිසුමකට කෙටුම්පත් කරලා මොරටුව ක්‍රීඩා සමාජයට ඇත්තවශයෙන්ම මොරටුව මහා නගර සභාවෙන් යොමු කළා. ඒ අනුව, මොරටුව ක්‍රීඩා සමාජය මේ තක්සේරු කරන ලද බිම් කුලිය සහා ගෙවීමට තියෙන හිඟ මුදලට එකඟතාවය පල කරලා ගිවිසුමට ඇතුලත් වීම සඳහා එකඟතාවය දක්වලා තිබුණා. නමුත් ඇති වුණ ගැටළුකාරී තත්ත්වයක් මත දිගින් දිගටම ගිවිසුමට ඇතුල්වීම සිදු නොවී විශේෂයෙන්ම මොරටුව ක්‍රීඩා සමාජය පැත්තෙන් වෙන්න ඕන අවශ්‍ය වෙලා තිබුණ කොන්දේසි කිහිපයක් ඉටු කරලා තිබුණා. ඒත් එක්කම ඔවුන් පවරලා තිබුණා මොරටුව මහා නගර සභාවට එරෙහිව නඩු කිහිපයක් ඉල්ලා අස්කරගෙන තිබුණා. නමුත් මේ බදු ගිවිසුමට එළෙඹීම දිගින් දිගටම ප්‍රමාද කරලා යම්කිසි ආකාරයක අදිසි බලවේගය ක්‍රියාත්මක වීම නිසා මේ සභාවේ සියලුම මන්ත්‍රීවරුන් දැනගත යුතු දෙයක් තියෙනවා මම

හිතන්නේ මේ සිද්ධිය ඉතා බරපතල සිද්ධියක්. මොරටුව ජාත්‍යන්තර ක්‍රීඩාංගනය තමයි ද සොයිසා ක්‍රීඩාංගනය පළාත් පාලන ආයතනයකින් පාලනය වන එකම ජාත්‍යන්තර ක්‍රීඩාපිටිය. අපි සතුව තියෙන විශාලතම සම්පත මේක. මේ සම්පත අද අවුරුදු 05ක් තිස්සේ අයාලේ යනවා මේ ප්‍රශ්ණය නිසා. මොරටුව ක්‍රීඩා සමාජය කියන්නේ 1941 දී ස්ථාපිත කරපු ක්‍රීඩා සමාජයක්. මේ ක්‍රීඩාංගනය සොයිසා පවුලෙන් මොරටුව මහා නගර සභාවට දායාද කළා මේ අවුරුද්දෙමයි මේ ක්‍රීඩාංගනය ස්ථාපිත වෙන්නේ. අවුරුදු 85ක් තිස්සේ මේ ක්‍රීඩාංගනය පරිහරණය කරමින් මොරටුවේත් ශ්‍රී ලංකාවෙත් ක්‍රිකට් වෙනුවෙන් මොරටුව ක්‍රීඩා සමාජය දක්වලා තියෙන දායකත්වය අඩු කරලා සලකන්න බැහැ. ශ්‍රී ලංකාව ටෙස්ට් වරම් ලබා ගන්න ඉස්සෙල්ලා මේ රටේ ටෙස්ට් තත්ත්වයට ගේන්න මොන තරම් ක්‍රීඩකයෝ මේ මොරටුව ක්‍රීඩා සමාජයෙන් බිහි වුණාද. මොරටුවේ ක්‍රිකට් මේ මට්ටමට ගෙනාවේ මොරටුව ක්‍රීඩා සමාජය. ඒ නිසා එහෙම ක්‍රීඩා සමාජයක් එක්ක තිබුණ සහසම්බන්ධය තමයි 2021 දී හෝ ඊට ආසන්න කාලයකදී බිඳ වැටෙන්නේ. අවුරුදු 80ක් තිස්සේ ඉදන් ආව ඒ සම්බන්ධය අද ගාල්ල ක්‍රිකට් ක්‍රීඩාංගනය ගත්තොත් එහි පාලනය යන්නේ ගාල්ල ක්‍රීඩා සමාජය හරහා. ඒ නිසා මේ ක්‍රීඩාංගනයේ යම් ගොඩනැඟිල්ලක් සකස් කරන අවස්ථාවේ දී ඊට අනුමැතිය දීලා තියෙනවා. ඒ ගොඩනැඟිල්ල මොරටුව ක්‍රීඩා සමාජය පිළියෙල කරලා තියෙනවා. ඒ අනුව ඒ ගොඩනැඟිල්ල අයිතිය සම්බන්ධයෙන් හබ කිරීමක් කරන්නේ නැහැ. අපිට දැන් තියෙන්නේ මේ දෙපාර්ශවය එකඟවෙලා තියෙන කොන්දේසි ප්‍රකාරව බදු ගිවිසුමකට ඇතුලත් වෙන්න. නමුත් ඒ මොන හේතුවක් නිසා බදු ගිවිසුමකට ඇතුලත් නොවෙනවාද කියන එක ප්‍රශ්ණයක්. මා ඉල්ලා සිටින්නේ ඔබතුමාගෙන් අපිට අද ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් විදියට ප්‍රතාපවත්ව ද සොයිසා ක්‍රීඩාංගනය නැවත නගාසිටුවලා මේ ක්‍රීඩාංගනය ටෙස්ට් වරම් දිනා ගත්ත ක්‍රීඩාංගනයක් හැටියට නැවත ටෙස්ට් තරඟ පවත්වන තැනට ගේන්නනම් මේ ශ්‍රී ලංකා ක්‍රිකට් එක්ක බද්ද වෙන්නේ නැතුව කවදාවත් මේ දේ ඉටු කරන්න බැහැ. ශ්‍රී ලංකා ක්‍රිකට් එක්ක බද්ද වෙන්නනම් ඔවුන්ගේ නියෝජිතයා වන මොරටුව ක්‍රීඩා සමාජය එක්ක සම්බන්ධ වෙන්න වෙනවා. එසේ නොවන තාක්කල් ශ්‍රී ලංකා ක්‍රිකට් එක්ක සම්බන්ධ නොවන තාක්කල් මේ ක්‍රීඩාංගනය දියුණු වෙන්නේ නැහැ. ඒ නිසා අවුරුදු 05ක් තිස්සේ අහිමි වෙලා තියෙන ආදායම මොන තරම් ආදායමක් අහිමි වෙලාද? අද මොරටුව ක්‍රීඩා සමාජය ඔවුන්ගේ මුද්‍රා තබලා තියෙනවා ඔවුන්ගේ ඇතුල්වීමේ ප්‍රවේශය ඔවුන් අධිකරණ නියෝගයක් ලබාගෙන මුද්‍රා කඩාගෙන අද ඇතුල්වෙලා මුද්‍රා ඉවත් කරලා පරිහරණය කරනවා. කිසිදු කුලියක් ගෙවීමේ අවස්ථාව අහිමි වෙලා ගිහිල්ලා තියෙනවා. අපි කුලී ගන්නෙත් නැහැ ඔවුන්ට කුලි ගෙවන්න විදියකුත් නැහැ. ඒ වගේම තමයි මේ ක්‍රීඩාංගනය නවීන ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලෙස ප්‍රතාපවත්ව නැඟී සිටින්න තියෙන අවස්ථාව මේ නිසා නැතිවෙලා තියෙනවා. මොරටුවේ වගේම ශ්‍රී ලංකාවේ ක්‍රිකට් උත්නතිය වෙනුවෙන් දෙන්න පුලුවන් දායකත්වය අවුරුදු 05ක් තිස්සේ අහිමි වෙලා තියෙනවා. මේ තවදුරටත් වෙන්න අවස්ථාව නොදිය යුතුයි කියන ස්ථාවරයේ මම ඉන්නවා. මේ සියලුම මන්ත්‍රීවරු මම හිතන්නේ මොරටුව ක්‍රීඩා සමාජය වෙනුවෙන් කරුණ දක්වනවාට වඩා මේ ප්‍රශ්ණය විසඳිය යුතුයි. මේ ක්‍රීඩාංගනය දැන් කෙසේ හෝ ගොඩනැඟිලා පරිහරණය කරනවා. මේ කරන්නේ අධිකරණ නියෝගයක් ප්‍රකාරව. දැන් ඔවුන්ව පලවා හරින්න අපි නඩුවක් පවරලා තියෙනවා. මේ නඩුවේ අවසන් ප්‍රතිඵලය මොකක් වෙයිද? පානදුර මහාධිකරණය අපිට සමථ කොන්දේසි වලට ඇතුල්වෙලා තියෙනවා. ඒ කොන්දේසි වල පැහැදිලිව පිළිඅරගෙන තියෙනවා. අපි මේ මොරටුව ක්‍රීඩා සමාජය සමඟ බදු ගිවිසුමකට ඇතුල් වෙනවා කියලා. ඒ අනුව දෙපාර්ශවයටම කියලා තියෙනවා අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ කරන්න කියලා. මා ඉල්ලා සිටිනවා මේ අමිල සම්පත නිකන් අයාලේ යන්න නොදී මේ ප්‍රශ්ණය විසඳන්න. විශේෂයෙන්ම නව නිලධාරී මණ්ඩලය ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා මොරටුව ක්‍රීඩා සමාජය වෙනුවෙන් ඔවුන් සාකච්ඡාවක් සඳහා අවස්ථාවක් ඉල්ලා සිටින්නේ 2026.06.01 වෙනිදා අද

වෙනකන් මේ සාකච්ඡාව සම්බන්ධයෙන් කිසිම කැඳවීමක් තිබිලා නැහැ. මම කියනවා ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපතිතුමියට ගරු උප නගරාධිපතිතුමියට නැවත මා වෙත ලබාදුන් මේ ලිපිය මා අද දින සභාගත කරනවා. හැකි ඉක්මනින් මීළඟ කමිටු රැස්වීම් දිනයටවත් මේ මොරටුව ක්‍රීඩා සමාජයේ නව නිලධාරී මණ්ඩලය සමඟින් ඉල්ලා සිටින සාකච්ඡාව ලබා දෙන්න. ඒ සඳහා මේ සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට එන්න කියන්න. ඒවගේම මේ සම්බන්ධව තියෙන ඉතිහාසය පිළිබඳව දැනුවත් වෙලා මේ ඉතිහාසය තුළ මේ ද සොයිසා ක්‍රීඩාංගනය අපිට ලබාදෙන අවස්ථාවේදී ද සොයිසා පවුල නියම කරලා තියෙන කොන්දේසි වල දක්වලා තියෙනවා පැහැදිලිවම කොහොමද පරිහරණය කරන්න ඕන කියලා. ඒ බලාපොරොත්තු ඉෂ්ඨ සිද්ධ වෙන ආකාරයට මේ වැඩපිළිවෙලට යන්න කියලා මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම මම මේ ලිපිය සභාගත කිරීමක් කරනවා. ඒ වගේම මේ ප්‍රශ්ණයට ධනාත්මකව ඇතුලත් වෙලා නව බඳු ගිවිසුමකට ඇතුලත් වෙලා ප්‍රශ්ණය නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.06.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(4), 02(7), 02(10), 02(11) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කරුණු වලට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.06.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.06.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |

**2026.06.08 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා) |

**06(04) 2026.06.09 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මුළු රටම ඩෙංගු මාරයාගෙන් විශාල අනතුරකට අපි මුහුණ දීලා තියෙනවා. ඩෙංගු පැතිරිලා විශාල අලාභ හානියක් මිනිස්සුන්ගේ ජීවිත වලට සිද්ධ වෙලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මොරටුවත් ඒහා සමානවම විශාල වශයෙන් ඩෙංගු රෝගීන් වාර්තා වෙනවා. දැන් ඒ සම්බන්ධයෙන් අපේ සුජීත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කළා අපි නගර සභාව විදියට ඩෙංගු මර්ධනය සඳහා අපේ සහාය එතුමාගේ යෝජනාව අනුව විපක්ෂයේ අපේ සියලුදෙනා ඒ සඳහා එකඟතාවය පල කරමින් ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වූවා. එහිදී යම් තීන්දු තීරණ ටිකක් ගත්තා නගරාධිපතිතුමනි කොට්ඨාශ වල ඒ ඩෙංගු මර්ධන කමිටු හදන්න, ජනතාව දැනුවත් කිරීම, ශ්‍රමදාන මේක මෙහෙයුමක්. ඔපරේෂන් එකක් විදියට ඉටු කරන්න අවශ්‍ය කරන පියවර ගන්න ඔබතුමා ඇතුළු අපි කට්ටිය හැමෝම එකඟතාවය පල කළා. මම දැනගන්න කැමතියි ගරු නගරාධිපතිතුමනි, අපි තීරණය කළ දවස් 14ක ඩෙංගු මර්ධන සති 02ක් ක්‍රියාත්මක කරන්න මේ වෙනකොට ඒ වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ පැහැදිලි කිරීමක් ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ප්‍රධාන වශයෙන් මට අවශ්‍යයි මේ සෑම වැඩකදීම හැමදෙනාම එකට එකතු කරගෙන යන්න. එක වෙලාවක සුජීත් මන්ත්‍රීතුමායි මේ කාරණාව මගේ ෆෝන් එකට දැම්මේ. ඒ වෙලාවේ මම තීන්දු කළා උදව් කරන්න කැමතියි අපිවත් සම්බන්ධ කරගෙන මේ කටයුත්තට සැලැස්මක් හදමු කියලා. ඒ අනුව තමයි කැඳවීම කළේ. ඒ කැඳවීම ඉතාම හොඳින් කරුණු කාරණා සැලකිය යුතු ලෙස ඇතිවුණා. අපි කොහොමද වැඩ කරගෙන යන්නේ. පොසොන් එකත් එක්කම මතු වෙච්ච තත්ත්වයක් තිබුණා මිහින්තලය ඉදි කරන එකත් තිබුණා. ඒ දින කිහිපය තුළ ඇති වුණ අවහිරතාව මේකට බලපෑවා. නමුත් හැබැයි මේක භූමියේ ක්‍රියාත්මක කරන්න යද්දි අපි බලාපොරොත්තු වූ ආකාරයටම ඒ කියන්නේ හොඳ සාමූහික එකඟතාවයක් සහිතව ක්‍රියාත්මක වෙන එකක් දැක්කේ නැහැ. කොට්ඨාශ කිහිපයකම ඒ කමිටු හැදුවා. ඒ ඩෙංගු මර්ධන කමිටු හදපු තැන්වල වැඩසටහන් ගණනාවක් දියත් කළා. නමුත් අපි බලාපොරොත්තු වූ ආකාරයට ඒ ගම ඇතුලේ ඉන්න පක්ෂ පාට භේදයකින් තොරව මන්ත්‍රීවරයා, ග්‍රාමසේවක, සමෘද්ධි නියාමක රජයේ නිලධාරීන් කිහිපදෙනෙක් ඉන්නවානේ. අපි ප්‍රාදේශීය ලේකම්ට දැනුම්දීමත් පමා වුණා. අදාළ ආයතන වලට දැනුම් දීමත් යම් පමාවක් සිද්ධ වුණා. මම බලාපොරොත්තු වුණ විදියට ඉතාමත් ශක්තිමත් ලෙස ඔක්කෝම එකතු වෙලා කරගෙන යන්න තිබුණ යම් දුර්වලතාවයක් තිබුණා. නමුත් අපේ සේවකයින් සහ අපේ සමහර මන්ත්‍රීවරු පොදුවේ ගත්තාම විශේෂයෙන්ම සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු ඇතුළු සේවකයින්ගෙන් විශාල මැදිහත්වීමක් කළා. අපි 15 වෙනිදා වෙනකන් දින දාලා කොට්ඨාශ වලට අදාළ වැඩ කොටස කරන්න හදලා දැන් ආයතන වලට කතා කරමින් ක්‍රියාත්මක කරමින් ඉන්නවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම විශේෂයෙන්ම මේ සඳහන් කරන්නේ අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඔබතුමන්ලා සමඟ අත්වැල් බැදගෙන ඩෙංගු මාරයාගෙයන් මේ මොරටුව ජනතාව මොරටුවේ දරු දැරියන් ගලවා ගැනීම වෙනුවෙන් අපි සියලුදෙනා එකතු වුණා. නමුත් කණගාටුවෙන් කියන්න ඕන ඔබතුමා ඒ පිළිබඳව ඉතාමත් හොඳ තැනක ඉතාමත් උවමනාවෙන්

ක්‍රියාශීලීව වැඩ කරන්න සූදානම් බව අපිට එදා පෙනුනා. අපි ඒක දැක්කා. නමුත් මේ මොරටුවේ ගත්තොත් අපි විපක්ෂයනේ ගරු නගරාධිපතිතුමනි. ආණ්ඩු පක්ෂයට අදාළ කොට්ඨාශ මන්ත්‍රීවරු කීයෙන් කීදෙනෙක් මේ බරින්, මොකද සාමාන්‍යයෙන් නගරාධිපතිතුමනි, සහකම්පනයක් කියලා දෙයක් තියෙන්න අවශ්‍ය වෙනවා අපිට, මොකද අපි නියෝජනය කරන කොට්ඨාශ වල ජනතාවගේ ඡන්ද වලින් අපි ආවේ. එතකොට ඒ ජනතාවට යම් කිසි කරදරයක් මේ විදියේ ව්‍යවසනයක් සිද්ධ වෙනකොට මැදිහත් වෙන්න ඕන, ඒක ඇගෙන් එන්න ඕන. මම දන්නේ නැහැ කීයෙන් කීදෙනෙකුට ඒ සහකම්පනය තිබුණාද කියලා. මම ඉඩම කොට්ඨාශයේ පදිංචි වෙලා ඉන්න නිසා අපේ මහින්ද මන්ත්‍රීතුමා අපි කිහිපදෙනෙක් පස්වෙනිදා ගිය ඉරිදා ඇත්තටම කළේ අපේ වැඩසටහනක් නෙවෙයි. නගර සභා වැඩසටහනක් නෙවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හදපු වැඩසටහනක්. ඒ වැඩසටහනට අපි සම්බන්ධ වෙලා අපිත් සම්බන්ධ වුණා. ඒ ජනතාව පවා ඇත්තටම ප්‍රශංසා කළා පක්ෂ විපක්ෂ අපි කවුරුත් එකතු වෙලා, අපි කාටත් දොස් කියන්න ගියේ නැහැ. අපි තමුන්නාන්සේලාට දොස් කියන්න ගියේ නැහැ. ක්ලීන් ශ්‍රී ලංකා නාට්‍ය හදලා මුළු ලංකාවම ඩෙංගු වලින් පිරිලා කියලා අපි කියන්න ගියේ නැහැ. අපි ඒ මුකුත් කියන්න ගියේ නැහැ. හැබැයි අපි කිව්වා තමන්ගේ ගේ පරිස්සම් කරගන්න තමන්ගේ ගෙදර පිරිසිදු කරගන්න අපිට දෙන්න පුලුවන් ඒ කතාව අපි කළා. අර පත්‍රිකාව ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මම මීට කලිනුත් යෝජනා කළා මිනිස්සුන්ට කියවන්න පුලුවන් මිනිස්සුන්ගේ ඇස් ටිකක් අල්ලන්න පුලුවන් වෙන විදියේ කරන්න කියලා. ෆෝ කලර්වත් කරන්න තිබුණානම් හොඳයි සහ ඒකේ අන්තර්ගතයේත් පොඩි පොඩි වැරදි ටිකක් තිබුණා ඒක ඔබතුමාත් දන්නවා. අඩුතරමේ අපි ගෙවල් වලට යනකොට අපි ගියේ පාරවල් දෙකක් තෝරාගෙන ඉදල්වත්ත කියන කොටසට. ගරු නගරාධිපතිතුමනි, ඉදල්වත්තට ඇතුල්වෙන්න කලින් තමයි ලුනාව රෝහල තියෙන්නේ. ලුනාව රෝහල ඉදිරිපිට ප්‍රධාන කාණුව මඩුරු තවානක්. අපි කට්ටියම දැක්කා. මම කිව්වා අපි ගෙවල් වලට යනකොට අපිට තියෙන පළවෙනිම ප්‍රහාරය තමයි ඕගොල්ලෝ අපේ ගෙවල් බලන්න ඉස්සෙල්ලා නගර සභාවේ කාණුව සුද්ද කරන්න කියලා. හැබැයි එහෙම විරෝධයක් ගෙවල් වලින් ආවේ නැහැ. ආවා එකම එක විරෝධයක් අපේ හිටපු මන්ත්‍රීතුමා නිරෝෂන් මහත්මයාගෙන් ආවා. කාණු ටික බලන්න ඔය ගෙවල් බලන්නේ නැතුව කියලා. ඒ කියපු කතාවේ වැරැද්දක් නැහැ ඇත්ත. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමන්ලාගේ සංවිධාන තියෙනවා සිවිල් සංවිධාන තියෙනවා රාජ්‍ය නොවන සංවිධාන තියෙනවා ඒ ප්‍රදේශ වල වෙනම මරණාධාර සමිති තියෙනවා. මම බලාපොරොත්තු වුණේ මේ සියලු ප්‍රදේශීය ලේකම් කාර්යාලයෙන් එක වැඩක් එම්ඕඑච් එකෙන් තව වැඩක් එහෙම නෙවෙයි. මේක එක තැනකට එකතු කරගත්තු මධ්‍යගත කරගත්තු මුළු නගර සභාව ප්‍රධාන කරගෙන සියලු නිලධාරීන් සියල්ල එකතු කරගෙන යන්න අවශ්‍ය ලිපියක් ගැනයි මම මේ ඇත්තටම යෝජනා කළේ. නමුත් මෙතැන වුණේ පාර්ශවීය විදියට එක එක විදියට මේක කළා. මේ වැඩේ එහෙම කරලා ඩෙංගු මර්ධනය කරන්න බැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වෙනකොට 60000 ඉක්මවා ගිහිල්ලා තියෙනවා. මරණ 39ක් වෙලා තියෙනවා. ඒ නිසා මොරටුවේ විශේෂයෙන්ම බොරුපන ප්‍රදේශය විශාල වශයෙන් මේ උවදුරට ගොදුරු වෙලා තියෙනවා. තවත් කොට්ඨාශ ඉදිබැද්ද වෙන්න පුලුවන් කොට්ඨාශ විශාල ප්‍රමාණයක් මේ නිසා ගරු නගරාධිපතිතුමනි හැකි ඉක්මනින් විපක්ෂයෙන් ඒ විදියට මේ සහාය දෙන්නෙ මිනිස්සු වෙනුවෙන්. ඒ නිසා ඒ සහාය හරියට අරගෙන ඉදිරියේදීවත් හරියට ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේ කරනවා.

ගරු නගරාධිපතිතුමනි, 02(02) කරුණ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද එක් එක් මාසය තුළ ලැබූ කසළ ගාස්තුවල මුදල් ප්‍රමාණය මුදල් බැදි වානිජ ආයතන හා වෙළඳ පරීශ්‍ර වාර්තාව සලකා බැලීම ගරු නගරාධිපතිතුමනි, 03 වන ඇමුණුමේ තියෙන්නේ ගරු

නගරාධිපති, කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවේ කටයුතු ආරම්භ වූ අතර, පහත සඳහන් කරුණු මෙහිදි කමිටුව සාකච්ඡාවට ලක්කරන ලදී. දැන් මේකේ තියෙනවා අංක 05, සීවීච් නිවාස සංකීර්ණයේ කසල ලබාගැනීම අත්හිටුවීමට අනු කමිටුව තීරණය කළ අතර, වරිපනම් නොගෙවීම හෝ වානිජ කසළ සඳහා ගාස්තු ගෙවීමට ඔවුන් පියවර ගතහොත් නැවත සේවය ලබාදීමට හැකි බව කමිටුව විසින් තීරණය කරන ලදී. දැන් ගරු නගරාධිපතිතුමනි, පොඩි පැහැදිලි කිරීමක් සිදුකරන්න වෙනවා. මේකේ තියෙනවා හරි නොමඟ යන වචනයක් වරිපනම් නොගෙවන. මේකෙන් කියන්නේ සිවීච් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ නිවාසලාභීන් නගර සභාවට වරිපනම් ගෙවන්නේ නෑ වරිපනම් ගෙවන්න අකැමැතියි. ගරු නගරාධිපතිතුමනි, සිවීච් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ කිසිම නිවාසලාභියෙක් වරිපනම් ගෙවන්න අකමැති නෑ. ඔවුන් ඕනම වෙලාවක සූදානම් වරිපනම් ගෙවන්න. නමුත් වරිපනම් කොළේ අයිතිකරු යටතේ තමන්ගේ නම තියෙන්න ඕනේ. ගෙවල් 356යි. ඒ ගෙවල් 356න් ගෙවල් 230කට වඩා ඔප්පු අරගෙන තියෙනවා. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සම්පූර්ණ ගෙවීම් කරලා ඔප්පු අරගෙන තියෙනවා. ඔප්පුවක් අරගෙන තියෙන නිවසක වරිපනම් ලේඛණයේ අයිතිකරු නගර සභාව ලෙස සඳහන් කිරීමට මොකක්ද තියෙන සාධාරණය. මෙතන ගරු නගරාධිපතිතුමනි, නගර සභාවයි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියයි කියන ආයතන දෙක නිසා ගෙවල් 356ක නිවාසලාභීන් අද අසරණ වෙලා තියෙනවා. අද ඔවුන් ප්‍රාණ ඇපකරුවෝ වෙලා තියෙනවා. නගර සභාව කියනවා වරිපනම් ගන්න ඕනේ එයාලගේ ලේඛනයෙන් කියලා. අයිතිකරු නගර සභාව නමට ආවට ගෙවල් නගර සභාවේ වෙන්නේ නැනේ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මම ඉල්ලා සිටින්නේ කැබිනට් පත්‍රිකාවක් නිකුත් කරලා තියෙනවා, ඔබතුමා දන්නවා. ඔබතුමාලගේ පක්ෂයෙම මගේ හිතවතෙක් වෙච්ච බිමල් රත්නායක ඇමතිතුමා කැබිනට් පත්‍රිකාවක් නිකුත් කරලා තියෙනවා. ඒ කැබිනට් පත්‍රිකාව ඇතුළේ තියෙනවා සිවීච් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ නිවාස ලාභීන්ට තමන්ගේ නමින් වරිපනම් ගෙවන්න අවස්ථාව ලබාදෙන්න කියලා. කැබිනට් පත්‍රිකාව උල්ලංඝනය කරන්න නගර සභාවට පුළුවන්ද. ඒනිසා මම ඉල්ලා සිටින්නේ එම කැබිනට් පත්‍රිකාව ක්‍රියාත්මක කරන්න. ඒ නිවාසලාභීන්ට, කතා කරන මා ද ඇතුළුව තමන්ගේ නමින් වරිපනම් ලේඛනය හදන්න. ඒ හදන පළමුවෙනි පැයේ ඉඳලා ඒ හැමෝම ලැයිස්ති ගෙවන්න. ඔබතුමා අසරණ වෙලා තියෙන තැන, මම ඒකත් කියලම නවත්වන්නම්. දැන් මේ ආයතනයේ විගණන විමසුමක් තියෙනවා මේ ඉඩම වෙනුවෙන් නගර සභාවට ලබාදිය යුතු මුදලක් නොලැබීම සම්බන්ධව. ගරු නගරාධිපතිතුමනි, මම එක ප්‍රශ්ණයක් ඔබතුමාගෙන් අහනවා. ඒ ඉඩමට අදාළ මුදල ලබාදිය යුත්තේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය. එවිට ඔවුන් කියනවා ඒ ඉඩම හිමි ඒ අයට නිසා නගර සභාවට සල්ලි දෙන්න ඕනේ නැනේ කියලා. නගර සභාවෙන් කියනවා අපිට සල්ලි දෙනකම් නගර සභාවෙන් ලබාදෙන සේවාවන් නිවාස සංකීර්ණයේ නිවාසලාභීන්ට ලබාදෙන්නේ නෑ කියලා. ගරු නගරාධිපතිතුමනි, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සමබන්ධයෙන් මම මෙතන කතා කරන්නේ නෑ මම අදාළ තැනදි කතා කරන්නම්. ඒගොල්ලෝ කරලා තියෙන දේවල් මොනවද කියලත් මම දන්නවා. නගර සභාවට මුදල් ගෙවන්න විමල් වීරවංශ මහතා ඇමති කාලේ ලක්ෂ 1020ක් නගර සභාවට එම ඉඩම වෙනුවෙන් ලබාදෙන්න කැබිනට් පත්‍රිකාවක් නිකුත් කළා. නමුත් එම කැබිනට් පත්‍රිකාව අනුමත වෙන්න කලින් 2015 ආණ්ඩුව නැතිවුණා. ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරනකොට එවකට හිටපු නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු මහතා ඉල්ලීමක් කළා ප්‍රේක්ෂකාගාරය හදන්න එම සල්ලි දෙන්න කියලා. වීමල් වීරවංශ ඇමතිතුමා ප්‍රේක්ෂකාගාරය හදලා දෙන්නනම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පාවිච්චි කරලා කියලා ඒ එකඟතාවයකුත් ආවා. පිටට දෙන්න ඕනේ නෑ අපි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් අපි හදලා දෙන්නම් ඒ මුදලට කියලා. එහෙම එකඟ තියෙද්දි තමයි ඒ සියල්ල නැතිවුණේ. එම විගණන විමසුම වෙනුවෙන් තමුන්නාන්සේලා සීවීච් රෙසිඩන්ස් නිවාස

සංකීර්ණයේ නිවාසලාභීන්ගෙන් වරිපනම් මුදල් අය නොකළ නිසා කසළ අදින එක නවත්තන්න වරිපනම් ගත්තේ නෑ කියන හේතුව සාධාරණ ද කියන එක මම ඔබතුමාගෙනුත්, මේ සභාවේ නාගරික මන්ත්‍රීවරුන්ගෙනුත් මන්ත්‍රීවරියන්ගෙනුත් අහන්න කැමතියි. මේක නීතිය ඉදිරියේ අභියෝගයට ලක්කරන්නත් පුළුවන් අපි එහෙම කරන්නෙත් නෑ. වරිපනම් ලබාදෙනකම්, කසළවලට මාසිකව රු.20,000/-ක මුදලක් ගෙවන්න කියලා නගර සභාවෙන් එවලා තියෙනවා, අපි එම මුදල ගෙවන්න සූදානම්, මක්නිසාද මොරටුවේ ජනතාවේ සම්පත්, ට්‍රැක්ටර් රථ, සේවකයන්ට පඩි ගෙවන්න. නිවාස සංකීර්ණයේ කළමනාකරණ කමිටුවක් තියෙනවා, ඒකේ දැනට සභාපති මම. ලබන මාසේ වෙනකොට මම එතනින් ඉවත් වෙනවා. දැනට අපි එකඟයි එම මුදල ගෙවන්න. ඊට වඩා තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ මේකේ වරිපනම් හා අනෙකුත් සේවාවන් ලබාදෙන්න. ආයතන දෙකක ප්‍රශ්නවලට ඒ නිවාස සංකීර්ණයේ මිනිස්සු පලිනෑ. එහෙමනම් ගෙවල් දෙන්න කලින් මේ සියලු ප්‍රශ්ණ නිරාකරණය කරගන්න ඕනේ ජාතික ජනාවාස සංවර්ධන අධිකාරිය. එගොල්ලෝ මේ සියල්ල නිරාකරණය නොකොට ගෙවල් විකුණ ගත්තා. දැන් නිවාස සංකීර්ණයේ මිනිස්සු අසරණ වෙලා ඉන්නේ, තමන්ගේ දරුවෙක් පාසලකට දාගන්න විදිහක් නෑ වරිපනම් නැතුව. වරිපනම් ගන්න ගියාම නගර සභාව කියනවා අයිතිකරු සභාව කියලා. මම දන්නවා මේ පිළිබඳව ඔබතුමා යම් අවබෝධයකින් ඉන්නවා. මම දන්න නෑ සමහර නිලධාරීන් ඔබතුමාව මොන පැත්තකට යොමු කරනවද කියලා. මේ පිළිබඳව ඉක්මණින්ම සලකා බලලා වරිපනම් ඇතුළු අනෙකුත් සේවාවන් සිවිච් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ නිවාසලාභීන්ට ලබාදෙන්න. ඔවුන්ටත් මොරටුවේ පුරවැසියෙක් විදිහට අභිමානයෙන් ජීවත්වෙන්න අවස්ථාව ලබාදෙන් කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ අංක 02(2) කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එහි ඇමුණුම් අංක 03 හි සඳහන් වෙනවා වෙළඳ බලපත්‍රයක් සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබුණු අවස්ථාවේදී හිඟ කසළ ගාස්තු මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉල්ලුම් පත්‍රයේ සටහන් කළ යුතු අතර, හිඟයෙන් කොටසක් වෙනත් පුද්ගයෙකුට අදාළ නම් එම මුදල එම හිඟයෙන් ඉවත්කොට භූමියේ නැති සේ සලකා කපා හැරීම සඳහා සෞඛ්‍ය කමිටුවට ඉදිරිපත් කළ යුතු බව අනු කමිටුවේ සාකච්ඡා විය.මේක පැහැදිලි නෑ මොකක්ද කියලා. ගරු සභාපතිතුමාගෙන් අපට දැන ගන්න පුළුවන්ද මොකක්ද මේ කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දිගින් දිගටම අපේ කසළ හිඟතාවය පිළිබඳව ගැටලුවක් තියෙනවා. විශාල කසළ හිඟ ප්‍රමාණයක් තියෙනවා. මේ හිඟ අයකරගන්න යනකොට දැන් එතන තියෙන්නේ අදාළ ස්ථානය නෙමෙයි. ඒ කියන්නේ අදාළ ව්‍යාපාරිකයා හෝ කඩ හිමියා නෙමෙයි දැන් එතන ඉන්නේ වෙනත් කෙනෙක්. නමුත් මෙයාගේ නමින් තමයි අපේ ලෙජරයේ යන්නේ. ඒනිසා තමයි මේ තීරණය එන්නේ. හිඟ කසළ එයාගේ නමින් නැත්තම් අලුත් කෙනෙක් නම් අදාළ කඩය කරන්නේ ඒක අපිට ඉවත් කරන්න සිද්ධ වෙනවා. මක්නිසාද අපිට හොයා ගන්න බැනේ අයිතිකරු කවුද කියලා.ඒනිසා මේ තීරණයට ආවේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, එහෙම වුනොත් සභාව ලොකු පාඩුවක් ලබනවනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කරන්න දෙයක් නෑ, මොකද කරන්නේ?

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, අදාළ පුද්ගලයගේ තොරතුරු නැද්ද?

**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, එහෙම තොරතුරු නැනේ, ඒකනේ මේ ප්‍රශ්ණේ. එහෙම හොයාගන්න පුළුවන් ඒවත් තියෙනවා, ඒවා අපි කරනවා. හොයාගන්න බැරි ඒවා අපිට ඉවත් කරන්න සිද්ධවෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, නාගරික කසළ අයකරගැනිම යන ශිර්ෂය ගැන බලනකොට විශාල මුදලක් අයකරගත යුතුව තිබෙනවා. ඒ මුදල කොච්චර විශාල ද කියනවා නම් සාමාන්‍යයෙන් කෝටි 25ක 30ක වගේ මුදලක් වෙනවා ඒක. ඇත්තටම හොයලා බලපුවම ඒකේ වෙලා තියෙන්නේ "හරියට කඩයකින් බදු මුදල් මාස්පතා ගන්නවා හැබැයි කඩේ වැහුනට පස්සේ ඒකෙන් බදු මුදල් ගන්න එක නතර වෙන්නේ නෑ පොත් ගත කිරීම නතර වෙන්නේ නෑ. කඩේ වැහිලා ගොඩක් කල් ගිහිල්ලා හැබැයි මේක පොත් ගත කරලා තියෙනවා අවුරුදු ගාණක් තිස්සේ. ඇත්තටම සේවයක් සපයලත් නෑ එතන කඩයක් පවතින්නෙත් නෑ නමුත් ගිණුම්ගත වෙලා තියෙනවා අවුරුදු ගානක් තිස්සේ. ඒ හින්දා විශාල ප්‍රමාණයක් ගිණුම් වශයෙන් අයවිය යුතු මුදලක් විදිහට අරගෙන යනවා. මේක කවදාවත් යථාර්ථයක් නොවන දෙයක්." ඒනිසා එම මුදල හදුනා ගැනීමට අපි ක්‍රමයක් හැදුවා විශාල ආයතනවලින් හදුනාගැනීම් ක්‍රමයක් හදලා. ඒක කොටස් වශයෙන් ගෙවන්න සමහරක් අය කැමති වුණා. නමුත් මේ කුඩා ආයතන වලින් මාසිකව රු.2000/-ක් වගේ මුදලක් අයකරගැනිමට අපි තීරණය කලා. බලපත්‍රය ගන්න අවස්ථාවේ රු.2000/- ගෙවන්න, නමුත් ඒ වරිපනම් අංකයේ හිඟ තිබෙනවා නම් ඒ හිඟ කොටස ඉවත් කරලා ඒක පස්සේ කපා හරින්න. ඇත්තම වශයෙන්ම අපි අනවශ්‍ය ප්‍රමාණයක් තමයි ගිණුම්වල රදවාගෙන ඉදලා තිබෙන්නේ. ඒක අයින් කිරීමක් තමයි මේකෙන් කළේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේකේ තියෙනවා 03 වන කරුණ ලෙස කුඩා පරිමාණ ව්‍යාපාරවල කසළ සඳහා අවම ගාස්තුවක් ලෙස රු.2000/-ක බදු සමඟ ගාස්තුවක් වාර්ෂිකව අය කිරීම 2027 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතු බව තීරණය විය. 2026.05.19 මුදල් කමිටු වාර්තාවේ 26(6). අපි අහන්නේ මේ රු.2000/- මොරටුවේ තියෙන සෑම කුඩා ව්‍යාපාරිකයෙක්ගෙන්ම අය කරගන්නවාද, කුණු දාන්නේ නැති, ඒ කියන්නේ මොකක් හරි ව්‍යාපාරයක් තියෙනවා එකෙන් එන්නේ අතුගාන දූවිල්ල ටික විතරයි. එවැනි ව්‍යාපාරවලිනුත් වාර්ෂිකව මෙම රු.2000/-ක් ගෙවන්න ඕනෙද, එහෙම එකක් ද මේ කියන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, කුණු නෑ කියලා බැහැර කරන්න බෑ එකම ස්ථානයක්වත්. අඩුගානේ පොඩි බෑග් එකකටවත් කුණු දෙනවා අතුගාලා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ මිනිස්සු වරිපනම් ගෙවනවා. මේ මිනිස්සු වෙළඳ බලපත්‍රවලට මුදල් ගෙවනවා. මේ මිනිස්සු තව තව ගෙවන්න ඕන ගෙවීම් සියල්ල කරනවා. අඩුම ගානේ කුණු, ට්‍රැක්ටරයකින් කාලක්වත්, භාගයක්වත් එනවා නම් මේක ගෙව්වට ප්‍රශ්ණයක් නෑ. හැබැයි මේ සෑම ආයතනයකින්ම රු.2000/-ක් අයකරගැනීමේ තීන්දුවට අපි දැඩිව විරුද්ධයි. මොකද හේතුව එහෙම කුණු නිෂ්පාදනය වෙන්නේ නැති ආයතවලින් පවා පුදපු ගමන් කාපි යකා කියලා අවුරුද්ද මුල රු.2000/-ක් අය කරගන්නවා කියන්නේ මහා අපරාධයක්. ඒ නිසා අපි කරුණාකරලා ඉල්ලීමක්

කරනවා මේ රු.2000/- අයකරගැනීම කපා හරින්න. කුණුවලට සල්ලි ගන්න ඕනේ කියන තැන අපි ඉන්නවා. ඒකේ කිසි තර්කයක් නෑ. ඒක තුසිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ, ඒකට වගකියන්නේ ඕනේ අදාළ ආයතනය දෙපාර්තමේන්තුව. ව්‍යාපාරයේ අප්ඩේට් එකක් ගන්න ඕනේ නිරන්තරයෙන්. ඒ අප්ඩේට් එක ගන්නේ නැතුව මේක හැම මාසෙම අවුරුදු ගානක් තිස්සේ යනවා නම් ඒක ප්‍රශ්ණයක්.ඒ නිසා මේක සටහන් කිරීම අපේ වගකීම. නගර සභාවේ වරදට දඩුවම් විදින්න ඕනේ මිනිස්සු නෙමෙයි. ඒ නිසා රු.2000/- අය කරගැනීම සම්බන්ධයෙන් අපි අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මොකද හේතුව මිනිස්සුන්ගෙන් නිකරුණේ මුදල් අයකරගැනීම. මේ වෙන කොට මිනිස්සු බදු ගෙවනවා ඕන තරම්. තවත් නගර සභාව මේ වගේ කඩා වඩා ගන්න එක අපිට අනුමත කරන්න බෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීතුමා පුංචි බාධා කිරීමක් කරනවා. ඒ කොටසේ උත්තරය දීලා මම නතර කරන්නම්. වරිපනම් ගෙවීමයි බදු ගෙවීමයි දෙකක්. මේ හුගක් වරිපනම් ගෙවන ආයතන නෙමෙයි බදු ගෙවන ආයතන. බදු ගෙවන ආයතනවලට අපි බැඳීමක් නෑ කුණු ඉවත් කරන්න. ඒ නිසා තමයි නාගරික කසළ කියලා අය කිරීමක් කරන්නේ. කලින් මන්ත්‍රීතුමා කතා සිවීච් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයෙන් අපිට කරගන්න දෙයක් නැති නිසා එතන වරිපනම් ගෙවන්නේ නැති නිසා අපේ සම්පත් සපයන නිසා අපිට ඒකට මිලක් අය කරලා කරගන්න උනා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීතුමා අපි අහන්නේ එක දෙයයි. කිසියම් ව්‍යාපාරයකින් කුණු නිෂ්පාදනය වෙන්නේ නැත්තම්, අදාළ පළාත් පාලන ආයතනයට කුණු දෙන්නේ නැත්තම් ඇයි කසළ වලට වෙනම ගෙවන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එහෙම ආයතන නෑ මන්ත්‍රීතුමා. හැම ආයතනයක්ම අඩුම ගානේ උදේට අතු ගාලා ඉතුරු වෙන කුණු ටික හරි ඉතිරිවෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මම කියන්නේ මෙහෙමනේ. ඔබතුමාගේ අදහස ඉදිරිපත් කරන්නකෝ. ඒ ඔබතුමාගේ අයිතියනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 04 වෙනි කරුණ. භූමියේ ඇති ආයතනවල කසළ හිඟය රු.25000/-ට වැඩි හා රු.100,000/-ට අඩු නම් එකවර හෝ වාරික හතරකින් ගෙවීමේ පහසුකම් ලබාදීමට හැකියාවක් ඇති අතර, හිඟය රු.100,000/-ට වැඩි නම් ලිඛිත ඉල්ලීමක් කොට වැඩි වාර ගණනකින් ගෙවා නිම කිරිමට හැකි බව අනු කමිටුවේදි සාකච්ඡා විය. මේ සම්බන්ධයෙන් අපි පැහැදිලි නෑ. මක්නිසාද ලක්ෂයට වැඩි නම් අපිට මිනිස්සුන්ව දැනුවත් කිරීමේ හැකියාව තියෙනවා. අපි කාවද මුණගැහෙන්න ඕනේ, කා සමඟ ද කතා කරල ද මේක අඩු කරගන්න ඕනේ කියල කාරණ සම්බන්ධයෙන්. 05 වන කරුණ සම්බන්ධයෙන් සුරේෂ මන්ත්‍රීතුමා කතා කරපු නිසා මම කතා කරන්නේ නෑ. 06 වන කරුණ. මේකේ තියෙනවා කළාප වශයෙන් ජනවාරි 01 සිට අප්‍රේල් 30 වෙනිදා දක්වා මෙතෙක් සිදුකල නිත්‍ය හා හිඟ අයකිරීම් ලැයිස්තුවක් සෞඛ්‍ය කමිටුවට ඉදිරිපත් කළ යුතු බව අනු කමිටුවේදි තීරණය විය. කසළ හිඟ ගාස්තු ලිපි මගින් දැන්වීම වියදම් අධික බැවින් සරළ ඉන්වොයිස් පත්‍රයකින් නිර්මාණය කිරීමට නාගරික ගණකාධිකාරි (ආදායම්) වෙත පැවරූ අතර අනුමැතිය සඳහා මේ මස සෞඛ්‍ය කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බව යෝජනා විය.

අවම වශයෙන් පිටපත් තුනකින් සමන්විත විය යුතුය. පළමු පිටපත ආයතනයට දෙන පිටපත, දෙවැනි පිටපත මහජන සෞඛ්‍ය පරීක්ෂක සතු පිටපත, තුන්වැනි පිටපත පොතේ පිටපත. සාමාන්‍යයෙන් ඉන්වොයිස් එකක් පිටපත් තුනකින් තියෙනවා කියන එකවත් මේ අනු කමිටුව දන්නේ නැද්ද. ඉන්වෙයිස් එකක් දැම්ම කොහොමත් පිටපත් තුනක් තියෙනවනේ. අනිත් එක තමයි අපි මේකට වෙනම සේවකයෙක් යොදවන්න ඕනේ. වෙනම ගිහිල්ලා දෙන්න ඕනේ. එවිට වෙනම ප්‍රවාහන වියදමක් යනවා. මේවා ඔක්කොම බැලුවම අපිට රෙජිස්ටර් පෝස්ට් යවන එක වාසිනේ. අනිත් එක තමයි ගිහිල්ලා දෙනවට වඩා නගර සභාව මගින් ලියාපදිංචි තැපෑලෙන් ලියුමක් ආවම මිනිස්සුන්ට පොඩි බයක් දැනෙනවා. ඒ මිනිස්සු නීත්‍යානකූලව බැඳීමක් වෙනවා. අපි අතින් ගිහින් දුන්නා කියලා ඒ බැඳීම වෙන්නේ නෑ. ඒ නිසා කරුණාකරලා ලිඛිතව දැනුම් දෙන්න. ගරු නගරාධිපතිතුමනි, ඊළඟට 2(9) කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද 2026 මැයි මස ඩෙංගු රෝගීන් පිළිබඳ වාර්තාව සලකා බැලීම. අපි ඇමුණුම් අංක 08 වෙත අවධානය යොමු කරනවා. එහි රෝගීන් පිළිබඳ වාර්තාවක් තියෙනවා. මේ දාලා තියෙන වාර්තාවට අනුව නම් මොරටුවේ ඩෙංගු නෑ.ඒනිසා මේ වාර්තාව පිළිගන්න බෑ. මොකද හේතුව අපි පෞද්ගලිකව දන්නවා මීට වඩා වැඩි කියලා ඩෙංගු රෝගීන් සංඛ්‍යාව මේ මාසය තුළ. මේකේ ලස්සන වැඩක් වුණා ගරු නගරාධිපතිතුමා. ඔබතුමාට මම මේ කියන්නේ අපේ ඩෙංගු කණ්ඩායම ගියා මොරටුව පොලිස් ස්ථානයට ඩෙංගු පරීක්ෂා කරන්න. යනකොට බාල්දියක තිබ්බා වතුර. ඒ වතුර ඒකේ හිටියේ තනිකර මදුරු කීටයෝ. පොලීසියට මේක පෙන්නුවා ඔයාලගේ පොලීසිය ඇතුළේ මදුරු කීටයෝ ඉන්නවා කියලා. ඊට පස්සේ පොලීසිය කොහොම හරි කතා කරලා බාල්දිය බිමට පෙරලුවා. දැන් මදුරු කීටයෝ නෑ. ඊට පස්සේ අපේ ඩෙංගු කණ්ඩායමේ ගිය සාමාජිකයගේ හිතවතෙක්ගේ වාහනයක් අල්ලනවා පොලීසිය. ඇල්ලුවට පස්සේ ඒ ඩෙංගු කණ්ඩායමේ සාමාජිකයා යනවා ප්‍රධාන පොලිස් පරීක්ෂකතුමා මුණගැහෙන්න. ගිහිල්ලා එදා ඔගොල්ලන්ව ඩෙංගු වලින් බේරුවේ කියලා මතක් කළාට පස්සේ ආ මේ අපේ යාළුවොනේ කියලා ඉවරවෙලා අර නීති කෘත්‍ය අයින් කරලා වාහනය රිලීස් කරනවා. ඔන්න ඕක තමයි ඩෙංගු මර්දනය කරන මොරටුව පොලීසියේ තත්ත්වය. ඒ නිසා අපි පැහැදිලිව කියන්නට ඕනේ මේ ඩෙංගු මර්දනය කරන්න රාජ්‍ය ආයතනවලට අවශ්‍යතාවයක් නෑ. අපේ පී.එච්.අයි.මහත්වරුන්ගේ ආරක්ෂාවට මොරටුව පොලීසියත් අරගෙන යනවා ඩෙංගු මර්දනයට. නමුත් පොලීසියේ ඇතුළේ ඩෙංගු හිටියම ඒකට නඩුව දාන්නේ නෑ අපේ කට්ටිය. මොකද හිතවත්කම් ගොඩනගා ගන්න ඕන නිසා පොලීසියත් එක්ක නඩුව රිලීස් කරලා දානවා. ඔන්න ඕක තමයි ඇත්ත තත්ත්වය. ඒවගේම පහුගිය දවස් කිහිපය තුළ මේ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව දිනෙන් දින වැඩිවෙලා. ඊයේ දවසේ ඉඳලා අද දවස දක්වා පැය විසිහතරක කාලය තුළ 2400කට වැඩි ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වෙලා තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ලයිව් දාගෙන ද කතා කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නෑ. එක ෆෝන් එකක හරි ලයිව් යනවා නම් මට පෙන්වන්නකෝ. ගරු නගරාධිපතිතුමා, මම කතා කරන දේ මම මගේ ආරක්ෂාවට රෙකෝඩ් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම එකඟයි. හැමදේම දන්න ඔබ ඒත් මේ දේ නොදන්න. රෙකෝඩ් කරන්න බලයක් නෑ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඇයි නැත්තේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබට හැන්සාඩ් එක තියෙනවා. කොයි පනතෙද තියෙන්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මන්ත්‍රීවරුන්ට වෙනම වෙනම රෙකෝඩ් කරන්න බෑ.

සභා ඝෝෂා

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මම නගරාධිපති විදිහට තීන්දුවක් දෙන්නේ රෙකොඩ් කිරීම් කරන්න එපා.

සභා ඝෝෂා

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සභාවට යෝජනාවක් ගෙනල්ලා සම්මත කරගන්න මන්ත්‍රීවරුන්ට තමන්ගේ කතාව රෙකෝඩ් කරන්න පුළුවන් කියලා.

සභා ඝෝෂා

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි සභිකයින් විදිහට ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන ගමන්ම සභාවේ නැති රීතියක් ගේන්න ඔබතුමාට අයිතියක් නෑ. ඒ නිසා අපි ඉදිරිපත් කරනවා ඔබතුමාට මේකේ තහනමක් තියෙනවා නම් ආණ්ඩුකාරවරයාගෙන් හරි අරන් එන්න. මක්නිසාද අපි අනික් සභාවල්වල දකිනවා විඩියෝ කරලා තියෙනවා. මාධ්‍යයෙන් යනවා. ඒනිසා මෙතුමගේ කථාව විතරක් අවහිර කරන්න එපා. එහෙම දෙයක් තියෙනවා නම් ඊළඟ සභාවේදි ඔබතුමා ඉදිරිපත් කරන්න. අද එතුමට කතා කරගෙන යන්න ඉඩදෙන්න. වෙලාව කළමනාකරණය කරන කියන එක වෙනයි, වීඩියෝ කරනවා කියන එක වෙනයි. ලයිව් දෙන්නේ නැත්තම් විඩියෝ කරන එකේ තහනමක් නෑ ගරු නගරාධිපතිතුමා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඩෙංගු සම්බන්ධයෙන් කතා කරන්න තියෙන්නේ.ඔබතුමාට ස්තුති කරනවා අපගේ ඉල්ලීම පරිදි ඩෙංගු කමිටුව රැස් කළා. ඒ සම්බන්ධයෙන් අපගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. නමුත් එදා කතා කරපු දේ ප්‍රායෝගිකව සිද්ධ වුණේ නෑ. අපි පැහැදිලිව විපක්ෂයක් විදිහට අපි අදටත් සූදානම්, මේ මොහොතෙත් සූදානම් ඩෙංගු මර්දනය සඳහා උපරිම දායකත්වය සපයන්න. ඒක ගැන තර්කයක් නෑ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා මෙහි නගරාධිපතිවරයා හැටියට මේ ඩෙංගු මර්දනය සඳහා විපක්ෂය දායක කරගන්න. මොකද ඩෙංගු හැදෙන්නේ දේශපාලනිකව බලලා නෙමෙයි.ඒ නිසා මේකට අවශ්‍ය ඒ මැදිහත්වීම කරගන්න. ඒ නිසා ඉන් එහාට අපි ඩෙංගු ගැන කතා කරන්නේ නෑ. මොකද හේතුව අද වෙනකොට ඩෙංගු මුළු මොරටුවෙම වෛරස් එකක් වෙලා තියෙනවා. අද මොරටුව විශ්ව විද්‍යාලය වහලා තියෙනවා. මොරටුව විශ්ව විද්‍යාලය වහනවා කියන්නෙම නගරාධිපතිතුමා ඔබතුමා අනිත් පැත්තට හිතන්න මොරටුව මහා නගර සභාවට තමයි ඒ බ්ලේම් එක එන්නේ. මොකද හේතුව මොරටුව මහා නගර සභාව හරියට මේකේ ඩෙංගු ව්‍යාප්තිය නැවැත්තුවා නම් අද මොරටුව විශ්ව විද්‍යාලය වහන්න වෙන්නේ නෑ. අද පාසල්වල ඩෙංගු. ඒ නිසා

ඒවා ගැන අවධානය යොමු කරන්න. ඒනිසා ඔබතුමාට ප්‍රශ්ණේ තියෙන්න ඕනේ මේක රෙකෝඩ් කරපු එක නෙමෙයි. අපි ඔබතුමාලට උදව් කරන්න කැමැතියි. අපි මේකේ ඩෙංගු නවත්වන්න කැමැතියි. මොකද හෙට දවසේ දණ්ඩ කරන්නේ කාටද කියන්න අපි දන්නේ නෑ. ඒ නිසා කරුණාකරලා මේ කියන දේ තේරුම් ගන්න. ඔබතුමාලා හොඳ වැඩක් කළාම ඒ හොඳ වැඩේ හොඳයි කියන්න අපි දෙපාරක් පැකිලෙන්නේ නෑ. ඔබතුමාලා දැන් යම් වැඩපිළිවෙලක් කරගෙන යනවා. නමුත් ඒ වැඩපිළිවෙල ප්‍රායෝගික නෑ. අපි කියන්නේ ඒකයි. ඒ වැඩපිළිවෙලට එකතු වෙන්න ඕන තව අංගයන් ගොඩක් තියෙනවා. අපි මැදිහත් වෙලා ඒවා කරන්න සූදානම්. ඔබතුමාලගේ ඒ ඩෙංගු ශ්‍රමදානවලට, ඒ ඩෙංගු වැඩසටහන්වලට විපක්ෂය ඒකාරාශි කරගත්තා නම් එහි ප්‍රතිඵලය එන්නේ අපිට නෙමෙයි පාලක පක්ෂයට, නගරාධිපතිවරයට.විපක්ෂය ඩෙංගු නැතිකලා කියලා යන්නේ නෑ. ඩෙංගු සම්බන්ධයෙන් දේශපාලන න්‍යාය පත්‍රයෙන් හිතන්න එපා. සමහර මන්ත්‍රිවරු ඉන්නවා ඔවුන්ගේ ලීෆ්ලට් ගහගෙන බෙදනවා. ඒවා පෞද්ගලික දේශපාලන න්‍යාය පත්‍ර. එහෙම නෙමෙයි අපි ඔක්කොම එකතු වෙලා මේ ඩෙංගු නවත්තමු. ඔබතුමා දැක්කා එදා මිහින්තලය විවෘත කරන්න ආපු වෙලාවේ ප්‍රාදේශීය ලේකම්තුමාට අපි කතා කරනකොටත් එතුමා දන්නේ නෑ. මම ඔබතුමාට එවලෙත් කිව්වා ප්‍රාදේශීය ලේකම්තුමාට කියන්න කියලා. එවිට ඔබතුමා ප්‍රාදේශීය ලේකම්තුමාට කිව්වා. එතනින් එහාට ඩෙංගු වලට මොකක්ද වුණේ කියලා අපි දන්නේ නෑ. අපිට කිසිම පණිවුඩයක් නෑ. අපිට ප්‍රශ්ණේ තියෙන්නේ ඒක. ඒනිසා අපි කැමැතියි ඩෙංගු නවත්වන්න, අපි කැමතියි ඩෙංගු මර්දනය කරන්න එකතු වෙන්න, දායක වෙන්න. ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. ඊළඟ කරුණ 2(11) ඇමුණුම් අංක 10, උක්ත කරුණ සලකා බැලූ කමිටුව මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පත්කරන ලද අනු කමිටුවේ වාර්තාව ඇමුණුම් අංක 10 ඉදිරිපත් වූ අතර, තවද සභාවට ආදායමක් ලැබිය හැකි ඝණ අපද්‍රව්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් දැනට සභාවේ ක්‍රියාත්මක වන ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානයේම ආරම්භ කිරීමට නිර්දේශ කරන ලදී. මේ කමිටු නිර්දේශයේ තියෙන්නේ එහෙම. නමුත් ඇමුණුමේ තියෙනවා මෙන්න මෙහෙම කතාවක්. ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානයේ ආදායමෙන් සීයට විසි පහක් එහි සේවකයන්ට ලබාදීමට කළ සාකච්ඡාව සම්බන්ධවයි. ඒක ඉහත කරුණ සම්බන්ධයෙන් ගරු නගරාධිපති කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් 2026.05.27 වන දින පැවති සාකච්ඡාවේදී ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානයට ආදායමක් ලබාගැනීමට හැකි ද්‍රව්‍ය පමණක් එකතු කිරීමේ මධ්‍යස්ථාන දෙකක් සොයිසාපුර හා කොරළවැල්ල කළාප තුළ ආරම්භ කිරීම සඳහා සාකච්ඡා විය. ගරු නගරාධිපතිතුමා, සොයිසාපුරයි, කොරළවැල්ලෙයි මොකක්ද මේ දාන්න යන්නේ. ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය දෙකක් ද දාන්න යන්නේ. සොයිසාපුර කියන්නේ සම්පූර්ණයෙන් ජනාකීර්ණ වූ ප්‍රදේශයක්. මේකේ කොහෙද ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන්න ඉඩ තියෙන්නේ. ඒ නිසා කරුණා කරලා මේ වගේ තීන්දු තීරණ ගන්න එපා. මේවා ජනතාවට හොඳ තීන්දු තීරණ නෙමෙයි. ඒ නිසා කරුණා කරලා ඒ සම්බන්ධයෙන් නැවත සිතා බලන්න. අනිත් කරුණ තමයි ලියුමේ මාතෘකාව තියෙන්නේ ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානයේ ආදායමෙන් 25%ක් එහි සේවකයන්ට ලබාදීමට කළ සාකච්ඡාව සම්බන්ධවයි කියලා. නමුත් විස්තරයේ තියෙන්නේ සොයිසාපුර, කොරළවැල්ල ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථාන දෙකක් ඇති කිරීම කියලා. මොකක්ද මේකේ තේරුම. උඩින් එකක් යටින් එකක්. ඒ නිසා කරුණා කරලා කොළේ වහලා ගහන එක නවත්වන්න. සෞඛ්‍ය කමිටුවේ අවසාන කරුණ අංක 14, රාවතාවත්ත පොදු සුසාන භූමියේ නව ගොඩනැගිල්ල සෑදීමට යෝජිත ස්ථානයේ සැලැස්ම හා තාක්ෂණ නිලධාරි වාර්තාව මගින් ඉදිරිපත් කිරීම ඇමුණුම් අංක 11. ගරු නගරාධිපතිතුමා මේ අකුරු කාටද කියවන්න පුළුවන්. කාගේද මේ අත්සන්, අපි මුළු නිලධාරි මහත්ම මහත්මීන්ගේ අත්සන් ඔක්කොම හඳුනනවද, අඩුම තරමේ මේකේ නමක්වත් නෑ, සීල්

එකක්වත් නෑ, තනතුරක්වත් නෑ. මුකුත්ම නෑ. ඔහේ අත්සන ගහලා එවනවා. මේකේ ලියලා තියෙන ඒවා කියවන්න වෙනම කාවහරි ගෙන්වන්න වෙනවා. මේ සභාවේ සෑම දෙපාර්තමේන්තුවකටම කම්පියුටරයක් තියෙනවා, ඒවා ක්‍රියාත්මක වෙනවා, ලියුම් ගහනවා. මේවා අතින් ලියලා ලේසියට එවන්න එපා. මේවා අපිට කියවන්න බෑ. මීන් ඉදිරියට මේවා ටයිප් කරලා එවන්න. අපිට මේවා කියවන්න ඕනේ. අනිත් එක මේ එවලා තියෙන්නේ ගූගල් මැප් එක. මේ ගූගල් මැප් එක බ්ලැක් ඇන්ඩ් වයිට් එව්වට පස්සේ මේක කාටද හඳුනගන්න පුළුවන්. මම අ.පො.ස.උසස් පෙළ කළේ භූගෝල විද්‍යාව. මටවත් මේක හඳුගන්න බෑ. ඒ නිසා කරුණා කරලා එක්කෝ මේවා එවන්න ඕනේ කලර් ප්‍රින්ට්අවුට්. එහෙම නැත්තම් පැහැදිලිව අතින් ඇඳලා එවන්න ඕනේ.ඒ නිසා මේ වගේ දේවල් කරන එක නවත්වන්න කියලා නිලධාරින්ට උපදෙස් දෙන්න කියන එක මතක් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි, අපේ ප්‍රධාන පශු වෛද්‍යතුමියත් ඉන්නවා. මොරටුව මහා නගර සභාවේ පශු වෛද්‍ය අංශය ඉතාමත් හොඳින් ක්‍රියාත්මක වෙනවා. පශු වෛද්‍යතුමියගේ ඉල්ලීමක් තියෙනවා පශු වෛද්‍ය අංශයට අවශ්‍ය ජෙනරේටරයක් හා ශීතකරණයක් ලබාගැනීම. පසුගිය දවස් ටිකේ මම එම අංශයට යනකොට එහි පරණ ෆ්‍රිජ් එකේ කෑලි දෙකට දෙකක් තියෙන්නේ. ඒත් එක්කම ඒ ෆ්‍රිජ් එකේ කෑල්ලක් වැදුනොත් ජලභීතිකාවට බෙහෙත් ගහන්න එන ජනතාවට පිටගැස්මටත් බෙහෙතක් ගහගන්න වෙනවා. අනිත් පැත්තෙන් අපේ එන්නත් ටික සංරක්ෂණය කරන්න භාරගෙන තියෙන්නේ අපට පහසුකම් නැති නිසා එම්.ඕ.එච්. ඔෆිස් එකෙන්. එහි එක පැත්තක දරුවන්ගේ එන්නත් ටික තියෙද්දි අනිත් පැත්තේ ජල භීතිකා එන්නත් ටික දාලා තියෙනවා. මේ මොරටුව මහා නගර සභාව මහා නගරයක්. සත්ත්ව සිව්පාවන්ට ආදරය කරන මිනිස්සු ජීවත් වෙන නගරයක්. ඒනිසා එතුමිය ඉදිරිපත් කරපු යෝජනාවට ඔබතුමාගේ අනුකූලතාවයත් ලැබිලා තියෙනවා. ඒ නිසා මම හිතන්නේ පරක්කු කරන්නේ නැතිව ඒ ජෙනරේටයත් අධි ශීතකරණයත් ලබාදීමට ඉක්මණින් සිද්ධ වෙන්න ඕනා. මම හිතන්නේ මේ වන විට ද්‍රව්‍ය ලබාගැනීමේ අංශයේ නිලධාරින්ගේ පොඩි ප්‍රශ්ණයක් තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ සඳහා වහාම ක්‍රියාත්මක වෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට ස්තුති කරන්නත් මේ අවස්ථාව කරගන්නවා, ඒ තමයි අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මොරටුවේ ජනතාව ඩෙංගු වලින් බේරා ගැනීමට ඔබතුමාට ශක්තියක් වෙන්න යෝජනාවක් ගෙනාපු වෙලාවේ කිසිම පැකිළීමකින් තොරව ඔබතුමා ඒ අවස්ථාව ලබාදුන්නා. ඒවගේ අපි සාකච්ඡා කළා මොකක්ද කරන්න ඕනේ කියලා. හොඳ අදහස් මතුවුණා. ඒත් එක්කම ඉදිරියට යනකොට මේක සාර්ථක කරගන්න අපිට තව බිම් කිහිපයක් පනින්න සිද්ධ වෙලා තියෙනවා. ඒදා මේ මන්ත්‍රීතුමාලා ගෙනාපු යෝජනාවලුත් එක්ක මම අදහසක් මතු කළා අපි අනිත් අයට ආදර්ශයක් දෙන්න ඉස්සෙල්ලා මොරටුව මහා නගර සභාව අපි සීරෝ ඩෙංගු සෝන් එකක් බවට පත්කරමු කියලා. අපි ඒකට උදාහරණයක් දෙමු ශූන්‍ය ඩෙංගු කළාපයක් කියලා. අපි කිව්වා ඉදිරියට අපි ඩෙංගු මර්දන රන් දෙපැයක් පාවිච්චි කරමු කියලා. ඒ අනුව මොරටුව මහා නගර සභා ක්‍රියාත්මක වෙද්දි මොරටුව මහා නගර සභාවේ තිබ්බ ඩෙංගු තවාන් කිහිපයක් අපි හොයා ගත්තා. ඒකට පිළියම් යෙදුවා. ඒ නිසා මේ වැඩසටහන් අපිට ඉදිරියට ක්‍රියාත්මක කරන්න. තව මාසයක් විතර මේ ඩෙංගු අවධානම තියෙනවා. ඒ අවධානමත් එක්ක නිරිත දිග මෝසම් සුළං තුරල් වෙලා තියෙන්නේ, නමුත් යම් විදිහකින් එහි බලපෑමත් ආවොත් ඉදිරි මාසයේ මේක උග්‍රවෙනවා. ඒ උග්‍රවීම වළක්වා ගන්න අපට උපාය මාර්ගික සැලසුමක් අවශ්‍යයි. අපි එදා යෝජනා කළා ඩෙංගු සඳහා සති දෙකක් තියෙනවා. ඒ සති දෙකේ අපි ඩෙංගු මර්දන ස්වර්ණමය රන් දෙපැය පාවිච්චි කරනවා. ඒකත් එක්කම අපි කිව්වා උපාය මාර්ගය කුමක්ද, මේකේ ව්‍යුහය මොකක්ද කියන එක තීන්දු කරන්න කියලා. ගරු නගරාධිපතිතුමනි, අපිට එතන පොඩි අඩුවක් තිබුණා. මම

ඔබතුමාට කිව්වා ෂෝට් ඇනොලයිස් එකක් කරලා බලමු මොකක්ද මේ ප්‍රශ්ණේ කියලා. මෙතුමා මතක් කරපු විදිහට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එක වැඩක් යනවා. එවගේම තව තැනකින් එක වැඩක් යනවා. මොරටුව නගර සභාවේ ප්‍රධාන පුරවැසියා විදිහට ඔබතුමා මූලිකත්වය අරගෙන අපගේ මෙහෙයුම් මැදිරිය ක්‍රියාත්මක කරලා, අපේ දෛනික වැඩපිළිවෙල මොකක්ද, සති වැඩපිළිවෙල මොකක්ද , ඒවගේම අපගේ මේ ස්වර්ණමය රන් දෙපැය භාවිතා කරන්නේ මොන වෙලාවෙද කියන එක තීන්දු කරලා එහෙම උපාය මාර්ගික සැලසුමකින් ගියේ නැත්තම් මේ සියලුම රෝහල්වල ධාරිතාව වැඩිවෙලා තියෙනවා. ඒ ධාරිතාව වැඩිවුනොත් අපිට දාරාගන්න බැරිවෙනවා. ඒවගේ තත්ත්වයක් ආවොත් මොරටුවට වගේම සමස්ථ රටටම මේක ප්‍රශ්ණයක් බවට පත්වෙනවා. ඒවගේම අනිත් පැත්තෙන් ගත්තම අපිට භාවිතා කරන්න පුළුවන් ස්වභාවික ක්‍රම මොනවාද, අපට පාවිච්චි කරන්න පුළුවන් පැළැටි මොනවාද යන්න පිළිබඳව අපේ ආයුර්වේද වෛද්‍යවරු සියල්ල සභාවට ගෙනල්ලා විද්වත් සභාවක් හැදීම ආදි උපාය මාර්ගික සැලසුම් අවශ්‍යයි. එහෙම නැතුව අපි රැස්වෙලා මෙන්න මේ දින ටික දැම්මා, ඒ දිනවල රැස්වෙන්න කියලා කිව්වට එහෙම රැස්වෙන වැඩසටහනක් ක්‍රියාත්මක වෙන්නේ නෑ. ඒකේ ව්‍යුහය හදන්න ඔබතුමාගේ මූලිකත්වයෙන්. මේ උපාය මාර්ගික සැලසුම ගියේ නැත්තම් අපි කොච්චර කළත් ගලාගෙන යන ගඟට ඉනි කැපුවා වගේ වෙනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, අපිට මේකට ක්‍රියාත්මක වෙමු, ඒ සඳහා උපයා මාර්ග තෝරාගමු කියා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

